# 01. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

## 1.1 දැක්ම, මෙහෙවර, කාර්යභාරය

දැක්ම

රාජ්‍ය සේවාලාභී සත්කාරයේ ප්‍රමුඛයා වීම.

**මෙහෙවර**

**රාජ්‍ය ප්‍රතිපත්ති වලට අනුකූලව ඵලදායී සම්පත් කළමනාකරණයක් තුළින් කාර්යක්ෂම පරිපාලන ව්‍යුහයක් බිහිකර ගම්පහ දිස්ත්‍රික්කය තිරසාර සංවර්ධනයක් කරා මෙහෙයවීම**

කාර්යභාරය

රාජ්‍ය ප්‍රතිපත්තීන් වලට අනුකූල වෙමින් මනා කළමනාකාරීත්වය තුළින් ප්‍රාදේශීය සහ ග්‍රාමීය මට්ටමේ ජනතාවගේ අපේක්ෂාවන් මල් ඵල ගන්වමින් ජනතාවාදී රාජ්‍ය සේවයක් ගොඩනැංවීම

## 1.2 ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් විශාලත්වය, ග්‍රාම නිලධාරි වසම්, ගම්මාන සංඛ්‍යාව හා ජනගහනය




| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | විශාලත්වය වර්ග කි.මී | ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව | ගම් සංඛ්‍යාව | ජනගහනය 2001 | ජනගහනය 2012 | නිවාස ඒකක සංඛ්‍යාව 2013 |
|---|---|---|---|---|---|---|
| අත්තනගල්ල | 154.0 | 151 | 191 | 154,967 | 178,816 | 44,869 |
| බියගම | 61.6 | 49 | 61 | 161,300 | 186,862 | 47,636 |
| දොම්පෙ | 178.3 | 133 | 176 | 130,021 | 153,137 | 39,175 |
| දිවුලපිටිය | 202.3 | 123 | 227 | 128,048 | 143,871 | 38,580 |
| ගම්පහ | 95.7 | 101 | 148 | 171,040 | 196,445 | 50,723 |
| ජා ඇල | 64 | 57 | 101 | 184,666 | 201,154 | 51,736 |
| කටාන | 107.6 | 79 | 131 | 222,683 | 233,854 | 69,375 |
| කැලණිය | 21.9 | 37 | 47 | 134,364 | 134,693 | 32,584 |
| මහර | 98.8 | 92 | 108 | 176,870 | 207,230 | 52,191 |
| මිනුවන්ගොඩ | 130.5 | 121 | 192 | 151,661 | 178,401 | 46,396 |
| මීරිගම | 186.6 | 149 | 273 | 143,663 | 164,166 | 42,462 |
| මීගමුව | 30.8 | 39 | 50 | 144,274 | 141,676 | 34,040 |
| වත්තල | 54.6 | 46 | 105 | 160,127 | 174,336 | 42,297 |
| එකතුව | **1386.7** | **1177** | **1810** | **2,063,684** | **2,294,641** | **592,064** |

**2013 වර්ෂයේ ගම්පහ දිස්ත්‍රික්කයේ වර්ෂ මැදි ජනගහනය 2,313,000 කි.**

මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය.

## 1.3 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අනුමත කාර්ය මණ්ඩලය හා 2013.12.31 දිනට තත්ත්වය

| තනතුර | ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් (ශ්‍රී. ලං. ප. සේ ) | විශේෂ ශ්‍රේණිය | 01 | 01 | - |
| අතිරේක දිස්ත්‍රික් ලේකම් (ශ්‍රී. ලං. ප.සේ ) | විශේෂ ශ්‍රේණිය | 01 | 01 | - |
| ප්‍රධාන ගණකාධිකාරී (ශ්‍රී.ලං.ග.සේ) | I | 01 | 01 | - |
| ප්‍රධාන අභ්‍යන්තර විගණක | I | 01 | 01 | - |
| ගණකාධිකාරී (ශ්‍රී.ලං.ග.සේ) | | 01 | - | 01 |
| සහකාර දිස්ත්‍රික් ලේකම් (ශ්‍රී. ලං. ප. සේ ) | III | 01 | 01 | - |
| ඉංජිනේරු ( ශ්‍රී. ලං. ඉ. සේ. ) | II/II | 01 | 01 | - |
| පරිපාලන නිලධාරි (රා.ක.ස.සේ.) | අධි | 01 | 01 | - |
| භාෂා පරිවර්තක | I | 01 | 01 | - |
| අයවැය සහකාර | | 02 | 02 | - |
| සංවර්ධන සම්බන්ධීකාරක | | 02 | 02 | - |
| සංවර්ධන නිලධාරී | III | 38 | 22 | 16 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | I/II/III | 25 | 20 | 05 |
| කාර්මික නිලධාරි | III | 01 | 01 | - |
| සැලසුම් ශිල්පි | III | 01 | 01 | - |
| පරිගණක දත්ත සටහන් ක්‍රියාකරු, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | III | 02 | 02 | - |
| පිළිගැනීමේ නිලධාරි | | 01 | - | 01 |
| රියදුරු | I/II | 06 | 08 | (02) |
| කාර්යාල සේවක සේවය | I/II/III | 10 | 07 | 03 |

මූලාශ්‍රය : පාලන අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

## 1.4 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුයුක්ත කර ඇති ක්ෂේත්‍ර නිලධාරීන්

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| සහකාර පුපුරණ ද්‍රව්‍ය පාලක | 01 |
| කෘෂිකර්ම අධ්‍යක්ෂක | 01 |
| සහකාර අධ්‍යක්ෂක (පොහොර) | 02 |
| බෞද්ධ කටයුතු සමායෝජක | 02 |
| මානව සම්පත් සංවර්ධන සහකාර | 10 |
| භාෂා පරිවර්තක | 02 |
| සමථ පුහුණු නිලධාරි | - |
| විශ්‍රාම වැටුප් නිලධාරි | - |
| සංස්කෘතික සංවර්ධන සහකාර | 03 |
| පුවත්පත් නිලධාරි | 03 |
| සමාජසේවා නිලධාරි | 01 |
| බලාත්මක නිලධාරි | - |
| ජාතික ඒකාබද්ධතා ප්‍රවර්ධන සහකාර | - |
| විද්‍යා හා තාක්ෂණ නිලධාරි | - |
| සහකාර දිස්ත්‍රික් මනෝ සම්බන්ධීකාරක | 01 |
| වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරී | 03 |
| සමාජ සංවර්ධන සහකාර | 01 |
| මුල් ළමාවිය සංවර්ධන සහකාර | 01 |
| ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරි | 01 |
| ළමාරක්ෂක නිලධාරි | 01 |
| උපදේශන නිලධාරි | 01 |
| සංවර්ධන නිලධාරි (රාජ්‍ය නොවන සංවිධාන) | 01 |
| සංවර්ධන නිලධාරි ( ආපදා සහන සේවා) | 01 |
| සංවර්ධන නිලධාරි( දිස්ත්‍රික් සම්බන්ධීකරණ) | 01 |
| දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරි | 04 |
| නැටුම් ශිල්පිනී | - |

මූලාශ්‍රය : පාලන අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

## 1.5 ගම්පහ දිස්ත්‍රික්කයට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 හි සේවක සංඛ්‍යා තොරතුරු -2013.12.31 දිනට

| අංකය | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ප්‍රාදේශීය ලේකම් | සහකාර ප්‍රාදේශීය ලේකම් | ගණකාධිකාරී | පරිපාලන නිලධාරී (අයිසීතිය) | පරිපාලන ග්‍රාම නිලධාරී | සංවර්ධන නිලධාරී | රාජ්‍ය කළමනාකරණ සහකාර | | | තාක්ෂණ නිලධාරී | පරිගණක දත්ත ක්‍රියාකරු | රියදුරු | කාර්යාල කාර්ය සහායක | සනීපාරක්ෂක කම්කරු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | අනුමත | දැනට සිටින | පුරප්පාඩු | | | | | |
| 1 | අත්තනගල්ල | 1 | 1 | 1 | 1 | 0 | 12 | 36 | 36 | - | 1 | 1 | 2 | 4 | - |
| 2 | බියගම | 1 | 1 | 1 | 1 | 1 | 12 | 25 | 25 | - | 1 | 1 | 2 | 6 | - |
| 3 | දිවුලපිටිය | 1 | 1 | 1 | 0 | 1 | 12 | 37 | 32 | 5 | 1 | 1 | 2 | 5 | - |
| 4 | දොම්පෙ | 1 | 1 | 1 | 1 | 1 | 12 | 32 | 32 | - | 1 | - | 2 | 6 | - |
| 5 | ගම්පහ | 1 | 1 | 1 | 1 | 1 | 13 | 44 | 41 | 3 | 1 | 1 | 2 | 5 | - |
| 6 | ජාඇල | 1 | 1 | 1 | 1 | 1 | 12 | 33 | 28 | 5 | 1 | 1 | 2 | 4 | 1 |
| 7 | කටාන | 1 | 1 | 0 | 0 | 0 | 12 | 31 | 28 | 3 | - | - | 2 | 8 | - |
| 8 | කැලණිය | 1 | 1 | 1 | 1 | 1 | 12 | 29 | 25 | 4 | 1 | 1 | 2 | 3 | - |
| 9 | මහර | 1 | 1 | 1 | 1 | 1 | 12 | 31 | 27 | 4 | 1 | 1 | 2 | 5 | - |
| 10 | මිනුවන්ගොඩ | 1 | 1 | 1 | 1 | 1 | 12 | 34 | 30 | 4 | - | 1 | 2 | 4 | - |
| 11 | මීරිගම | 1 | 1 | 0 | 1 | 1 | 12 | 33 | 32 | 1 | 1 | 1 | 2 | 7 | - |
| 12 | මීගමුව | 1 | 1 | 1 | 0 | 1 | 12 | 30 | 23 | 7 | 1 | 1 | 2 | 4 | - |
| 13 | වත්තල | 1 | 1 | 0 | 0 | 0 | 12 | 26 | 18 | 8 | 1 | 1 | 2 | 5 | - |
| | **එකතුව** | **13** | **13** | **10** | **9** | **10** | **157** | **421** | **377** | **44** | **11** | **11** | **26** | **69** | **1** |

*තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර

*සනීපාරක්ෂක කම්කරු- පෞද්ගලික සේවයක් සපයා ඇත

මූලාශ්‍රය : පාලන අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

## 1.6 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පාලන අංශයෙන් ඉටු කරනු ලබන කාර්යයන්

1. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ කාර්ය මණ්ඩලයේ අභ්‍යාන්තර පරිපාලනය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 ට අදාලව පාලන කටයුතු මෙහෙයවීම.
2. කෘෂිකර්ම කමිටුව, පාරිසරික නීති ක්‍රියාත්මක කිරීමේ ආරක්ෂිත කමිටුව, ධීවර කමිටුව, අබිං කමිටුව, නිවාස කමිටුව වැනි රැස්වීම් පැවැත්වීම සහ අනෙකුත් රාජ්‍ය ආයතන හා සම්බන්ධීකරණ කටයුතු කිරීම
3. විවිධ රාජ්‍ය සහ ආගමික උත්සව පැවැත්වීම.
4. කාර්ය මණ්ඩල පුහුණුව.
5. මහජනයාගෙන් සෘජුවම ලැබෙන පැමිණිලි, පෙත්සම්, දුක්ගැනවිලි ආදිය පිළිබඳව පරීක්ෂාකිරීම සහ අදාල අංශවලට යොමුකිරීම.
6. තුවක්කු ආඥා පනත යටතේ ගිනි අවි බලපත්‍ර ඉල්ලීම් පිළිබද කටයුතු, වාර්ෂිකව ගිනි අවි බලපත්‍ර අළුත් කිරීම.
7. අන්තරායාකාරී ඖෂධ පාලන පනත යටතේ කටයුතු කිරීම.
8. පුපුරණ ද්‍රව්‍ය සඳහා බලපත්‍ර ලබාදීම සහ ආරක්ෂක සේවා සපයන ආයතන ලියාපදිංචි කිරීම.

## 1.7 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගිණුම් අංශයෙන් ඉටු කරනු ලබන කාර්යයන්

1. වාර්ෂික ආදායම් සහ වියදම් ඇස්තමේන්තු සකස් කිරීම.
2. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම, බෙදාහැරීම සහ එම කාර්යාලවල මූල්‍ය කටයුතු මෙහෙයවීම.
3. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල මාසික ගිණුම් ප්‍රකාශ ලබාගෙන ඒකාබද්ධ වාර්තාවක් ලෙස භාණ්ඩාගාරයට ඉදිරිපත්කිරීම.
4. රේඛීය අමාත්‍යාංශවලට ගිණුම් ප්‍රකාශන ඉදිරිපත් කිරීම.
5. වාර්ෂික විසර්ජන ගිණුම, අත්තිකාරම් ගිණුම හා වාර්ෂික තැන්පත් පාලන ගිණුම පිළියෙල කිරීම හා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම් හා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.
6. ආදායම් එකතු කිරීම, ගිණුම් තැබීම හා ආදායම් ගිණුම් වලට අවශ්‍ය කෙරෙන තොරතුරු ආදායම් ගණන් දීමේ නිලධාරියා වෙත ලබා දීම.

දිස්ත්‍රික්කයේ පරිපාලන හා සම්බන්ධීකරණ ප්‍රධාන ආයතනය ලෙස දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කටයුතු කරයි. මහජනතාව හා රාජ්‍ය ආයතන සමග සෘජු සබදතාවයකින් යුතුව කටයුතු කර උපරිම සේවාවක් සැලසීම පිණිස ක්‍රියාකර ඇත.

## 1.8 මානව සම්පත් සංවර්ධනය / පුහුණු වැඩසටහන්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කාර්යක්ෂමතාවය වර්ධනය සඳහා මාණ්ඩලික හා මාණ්ඩලික නොවන නිලධාරීන් සඳහා පහත දැක්වෙන පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

| පාඨමාලාව | පුහුණු මධ්‍යස්ථානය | සහභාගී වූ ගණන | තනතුර | පුහුණු දින ගණන | වියදම (රු) |
|---|---|---|---|---|---|
| රියදුරු කාර්යසාධන පුහුණු වැඩසටහන | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 90 | රියදුරු මහතුන් | 01 | 29,995/= |
| විශ්‍රාම වැටුප් පුහුණුව | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 90 | ප්‍රාදේශීය ලේකම්/ ගණකාධිකාරී/ විශ්‍රාම වැටුප් නිලධාරී/ රාජ්‍ය කළමනාකරණ සහකාර | 02 | |
| වැටුප් පරිවර්තන | SLIDA | 02 | රාජ්‍ය කළමනාකරණ සහකාර | | |
| ආකල්ප වර්ධනය/ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය | SLIDA | 01 | රාජ්‍ය කළමනාකරණ සහකාර | | |
| ව්‍යාපෘති කළමනාකරණය | SLIDA | 02 | සංවර්ධන නිලධාරීන්/ රාජ්‍ය කළමනාකරණ සහකාර | 03 | |
| විනය කාර්ය පරිපාටිය | SLIDA | 01 | රාජ්‍ය කළමනාකරණ සහකාර | | |
| කාර්යාල කළමනාකරණය | SLIDA | 08 | රාජ්‍ය කළමනාකරණ සහකාර | 05 | |
| විදුලි පද්ධති පිළිබඳ පුහුණුව/ වැටුප් පරිවර්ථන | SLIDA | 02 | තාක්ෂණ නිලධාරීන් හා සැලසුම් ශිල්පීන් | 02 | |

| පාඨමාලාව | සහභාගී වූ ගණන | අනුග්‍රහය | තනතුර | වියදම රු. |
|---|---|---|---|---|
| පශ්චාත් උපාධි පාඨමාලාවන්හි විදේශ සංචාර සඳහා | 01 | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය | මාණ්ඩලික නිලධාරීන් | ඇ.ඩො. 3220 |

මූලාශ්‍රය : පාලන අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

# 1.9 දිස්ත්‍රික් නිපුණතා ප්‍රවර්ධන ඒකකය

**දැක්ම**

ගම්පහ දිස්ත්‍රික් රාජ්‍ය නිලධාරීන්ට වඩාත් ඵලදායී පුහුණු වැඩමුළු ලබාදීම මඟින් විශිෂ්ඨතම හා සාර්ථකම නිපුණතා ප්‍රවර්ධන ඒකකය බවට පත් වීම.

**මෙහෙවර**

කාර්යක්ෂම ඵලදායී ගුණාත්මක සේවාවක් ගම්පහ දිස්ත්‍රික් ජනතාවට ලබා දීම සඳහා කැප වූ නිපුනතා වලින් පරිපූර්ණ වූ රාජ්‍ය සේවයක් ස්ථාපිත කිරීම.

**පාඨමාලා අන්තර්ගතය**

මෙම ඒකකය මගින් පාඨමාලා හතරක් පවත්වනු ලබයි.

| | |
|---|---|
| 1. මූලික පරිගණක කුසලතා | - පරිගණක මෙහෙයුම් පද්ධතිය, දෘඩාංග සහ වදන් සැකසුම (Word) පිළිබඳ මූලික දැනුම. |
| 2. අන්තර්ජාලය හා විද්‍යුත් තැපැල (Internet and Email) | - අන්තර් ජාලය හා විද්‍යුත් තැපැල භාවිතය හඳුන්වාදීම. |
| 3. පැතුරුම් පත් (MS Excel) | - work book, සමීකරණ (formulas), ශ්‍රිත (functions), ප්‍රස්ථාර සැකසීම (charts and graphs), මැක්‍රො භාවිතය(macros and modules) පිලිබඳ මූලික දැනුම. |
| 4. දත්ත සමූහය (MS Access) | - දත්ත සමුදාය (Databases), RDBMS, Basic elements, වාර්ථා ලබා ගැනීම (Queries), forms, modules හඳුන්වාදීම. |

**2013 වර්ෂයේ අයදුම්පත් සංඛ්‍යාව සහ සහභාගීවූවන් සංඛ්‍යාව**

| Division | No of Application | Number of Participated |
|---|---|---|
| අත්තනගල්ල | 161 | 96 |
| බියගම | 83 | 63 |
| දිවුලපිටිය | 111 | 93 |
| දොම්පේ | 92 | 38 |
| ගම්පහ | 144 | 101 |
| ජා-ඇල | 58 | 26 |
| කටාන | 109 | 83 |
| කැලණිය | 72 | 77 |
| මහර | 38 | 21 |
| මිනුවන්ගොඩ | 214 | 136 |
| මීරිගම | 259 | 157 |
| මීගමුව | 81 | 62 |
| වත්තල | 97 | 50 |
| කච්චේරි | 115 | 58 |
| එකතුව | 1634 | 1061 |




**පුහුණුව ලබාදෙන නිලධාරීන්**

- සංවර්ධන නිලධාරීන් ඇතුළු අනෙකුත් මාණ්ඩලික නිළධාරීන්
- රාජ්‍ය කළමනාකාර සහකාර
- ග්‍රාම නිලධාරීන්

**පුහුණුව අවසන් කළ කණ්ඩායම් වල සාරාංශය**

| පාඨමාලාවේ නම | සම්පූර්ණ කරන ලද කණ්ඩායම් |
|---|---|
| මූලික පරිගණක කුසලතා | 43 |
| අන්තර්ජාලය හා විද්‍යුත් තැපැල | 3 |
| මයික්‍රො සොෆ්ට් එක්සෙල් | 3 |

**වියදම**

| පාඨමාලාවේ නම | දින සංඛ්‍යාව | පාඨමාලා සංඛ්‍යාව | පාඨමාලාවක පිරිවැය | දරණ ලද මුළු වියදම |
|---|---|---|---|---|
| මූලික පරිගණක කුසලතා | 5 | 43 | 24000.00 | 1032000 |
| මයික්රො සොෆ්ට් එක්සෙල් | 3 | 3 | 21600.00 | 64800 |
| අන්තර්ජාලය හා විද්‍යුත් තැපැල | 3 | 1 | 14400.00 | 14400 |

**යටිතල පහසුකම් සංවර්ධනය කිරිම**

- 2012.10.22 සිට 2013.02.22 දක්වා පරිගණක 14 කින් ආරම්භ කිරීම.
- 2013.03.04 දින සිට යටිතල පහසුකම් 30 ක ප්‍රමාණයකට සරිලන පරිදි වැඩි දියුණු කිරිම.
- දේශන හා ප්‍රයෝගික සැසි පැවැත්වීම සඳහා ලැබූ පරිගණක විද්‍යාගාරය සහ දේශනාගාරය භාවිතාකිරිම.
- සහභාගී වන නිලධාරීන්ට සුව පහසු අධ්‍යයන පරිසරයක් ලබා දීම.(වායු සමීකරණය කරන ලද පන්ති කාමර හා බහුමාධ්‍ය)
- උදැසන හා සවස කෙටි ආහාර ලබා දීම.
- සැම දිනක අවසානයේදී එදින කළ අධ්‍යනය මතකයේ නංවාලීමට කුඩා ක්‍රීඩාවක යෙදීම.

**සහභාගී වන්නන් පුහුණු වැඩ සටහන මගින් ලබාගන්නා ප්‍රතිලාභ**

- රාජ්‍ය සේවයයේ කාර්යක්ෂමතාව හා ඵලදායිතාවය වර්ධනය කිරිම.
- පරිගණක මත පදනම් වූ ක්‍රම සම්බන්ධ කැමැත්ත / අන්තර්ග්‍රහණය වැඩි කිරිම.
- තොරතුරු වල නිවැරදිතාවය හා විනිවිදභාවය වැඩිදියුණු කිරිම.

## 1.10 ණය සම්බන්ධ කටයුතු / කාර්ය මණ්ඩල සඳහා ණය නිකුත් කිරීම

<u>**දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිලධාරීන් සඳහා නිකුත් කළ ණය**</u>

| ණය වර්ගය | සංඛ්‍යාව | වටිනාකම (රුපියල්) |
|---|---|---|
| ආපදා ණය | 56 | 4304386/= |
| පාපැදි ණය | 8 | 48000/= |
| ණයබරින් මිදීමේ ණය | 3 | 22500/= |
| දේපල ණය | 2 | 2199520/= |
| එකතුව | 69 | 6574406/= |

මූලාශ්‍රය : පාලන අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

## 1.11 පෞද්ගලික ආරක්ෂක ආයතන, ස්වේච්ඡා සංවිධාන හා රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචි කිරීම

1998 අංක 45 දරණ පෞද්ගලික ආරක්ෂක නියෝජිත ආයතන විධිමත් කිරීමේ පනත යටතේ පෞද්ගලික ආරක්ෂක ආයතන ලියාපදිංචි කිරීම හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස බල ප්‍රදේශ කිහිපයක ක්‍රියාත්මක වන රාජ්‍ය නොවන / ස්වේච්ඡා සංවිධාන ලියාපදිංචි කිරීම පහත පරිදි සිදු කරන ලදී.

| ලියාපදිංචි කළ ආයතන වර්ගය | වර්ෂය තුළ තිබූ ගණන | වර්ෂය තුළ නව ලියාපදිංචි කිරීම් | වර්ෂය අග එකතුව |
|---|---|---|---|
| පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍යායතන | 137 | 4 | 141 |
| ස්වේච්ඡා සංවිධාන | 26 | 03 | 29 |
| රාජ්‍ය නොවන සංවිධාන | 32 | 32 | 32 |

මූලාශ්‍රය : පාලන අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

පෞද්ගලික ආරක්ෂක ආයතන ලියාපදිංචි කිරීමෙන් ලද ආදායම - රු. 4,000.00

වාර්ෂික බලපත් නිකුත් කිරීමෙන් ලද ආදායම - රු.29,000.00

## 1.12 ගිනි අවි බලපත්‍ර

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මෙම අංශය මඟින් ගිනි අවි බලපත්‍ර අළුත් කිරීම, කෘෂිකාර්මික කටයුතු සඳහා ගිනි අවි බලපත්‍ර ලබා ගැනීම සඳහා අයදුම් පත්‍ර නිකුත් කිරීම හා එම අයදුම් පත්‍ර සඳහා දිස්ත්‍රික් ලේකම් නිර්දේශ ලබා දීම, මුරකරු බලපත්‍ර නිකුත් කිරීම, නැවත රජයට භාර දෙන ගිනි අවි භාර ගැනීම හා එම ගිනි අවි තක්සේරු කර විකිණීම සිදු කරනු ලැබේ. එසේම ගිනි අවි බලපත්‍ර පැවරීම සඳහා අයදුම් පත්‍ර නිකුත් කිරීම හා අධිකාරිත්වය වෙනස් කිරීමට අවශ්‍ය නිර්දේශයන් ලබා දීම ද සිදුකරනු ලබයි.

**<u>ගම්පහ දිස්ත්‍රික්කයේ ඇති ගිනිඅවි පිළිබඳ තොරතුරු සාරාංශය - 2013</u>**

| | තනි කාණුවේ පතොරොම් තුවක්කු | පිස්තෝල | රිවෝල්වර් | රයිෆල් | රිපීටර් |
|---|---|---|---|---|---|
| කෘෂි කාර්මික කටයුතු | 1748 | - | - | 19 | - |
| කෘෂි කාර්මික නොවන කටයුතු | 277 | 97 | 32 | 10 | 5 |
| බැංකු ආරක්ෂක කටයුතු | 144 | 23 | 44 | 3 | 125 |
| රාජ්‍ය ආයතන ආරක්ෂක කටයුතු | 152 | 1 | 3 | - | - |
| පෞද්ගලික ආරක්ෂක සේවා ආයතන සතු | 29 | - | - | 8 | 3 |
| දිස්ත්‍රික්කයේ ඇති මුළු ගිනිඅවි ගණන | 2350 | 121 | 79 | 40 | 133 |

මූලාශ්‍රය : පාලන අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

ගිනිඅවි බලපත්‍ර අළුත් කිරීමෙන් ලද ආදායම - රු. 551,100.00

ගිනිඅවි විකිණීම - රු. 76,500.00

නව ගිනිඅවි බලපත්‍ර සඳහා අයදුම් පත්‍ර ලබා දීම - රු. 880.00

මුරකරු බලපත්‍ර නිකුත් කිරීමෙන් ලද ආදායම - රු. 3,790.00

## 1.13 විස්තීරණ ආපදා වැඩසටහන, නිවාස හානි

2013 මුදල් වර්ෂය තුළ විස්තීරණ ආපදා වැඩසටහන සහ නිවාස හානි සඳහා පහත පරිදි ප්‍රතිපාදන වැයකර ඇත.

විස්තීරණ ආපදා හා 2013 වර්ෂය නිවාස හානි සඳහා නිදහස් කරනලද ප්‍රතිපාදන පිළිබඳ විස්තරය

නිදහස් කරනලද මුළු ප්‍රතිපාදන ප්‍රමාණය රු. **4,488,216.84** **දිස්ත්‍රික්කය - ගම්පහ**

| අනු අංක | කාර්යාලය | නිවාස හානි සංඛ්‍යාව | | 2012 වර්ෂයේ නිවාස හානි සඳහා නිදහස් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය * (රු.) | පිසූ ආහාර | වියලි සලාක | මරණාධාර | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | පූර්ණ | අර්ධ | | | | | | |
| | ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | | | | | | | 39195 | 39195 |
| 1 | මීරිගම | | 9 | 132000 | 13650 | 345 | | | 145995 |
| 2 | දොම්පෙ | | 4 | 85000 | | | | | 85000 |
| 3 | අත්තනගල්ල | 2 | 9 | 176500 | 6200 | 595 | | | 183295 |
| 4 | වත්තල | | 7 | 66503 | 443281 | | | | 509784 |
| 5 | මහර | | 10 | 161000 | 74697 | | | 473151.84 | 708848.84 |
| 6 | දිවුලපිටිය | 2 | 5 | 410000 | | | | | 410000 |
| 7 | මිනුවන්ගොඩ | 2 | 26 | 731000 | 1800 | | | | 732800 |
| 8 | කැලණිය | | 6 | 107120 | 1007892 | | 15000 | | 1130012 |
| 9 | බියගම | | 8 | 122500 | 113453 | | | | 235953 |
| 10 | ජා- ඇල | 1 | 3 | 111000 | 88002 | | | 3000 | 202002 |
| 11 | මීගමුව | | 0 | 0 | | | | | 0 |
| 12 | ගම්පහ | | 0 | 0 | 28772 | | 15000 | 21880 | 65652 |
| 13 | කටාන | | 0 | 0 | 24680 | | 15000 | | 39680 |
| | එකතුව | 7 | 87 | 2102623 | 1802427 | 940 | 45000 | 537226.84 | 4488216.84 |

මූලාශ්‍රය : පාලන අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

*2012 වර්ෂයේ සිදු වූ නිවාස හානි සඳහා 2013 වර්ෂයේ ගෙවීම් සිදු කර ඇත.

## 1.14 සමාජ සේවා කටයුතු

### 1.14.1. ආබාධ සහිත පුද්ගලයන් සඳහා වන සේවා

1.14.1.1. මාසික ආදායම රු. 6000.00 ට වඩා අඩු, තමන්ගේම ඉඩමක් සහිත අඩු ආදායම් ලාභී ආබාධ සහිත තැනැත්තන් සඳහා ක්‍රියාත්මක කරනු ලබන **නිවාස ආධාර වැඩසටහන.**(ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික ලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මක කෙරේ).

| **ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය** | **නිවාස/වැසිකිළි සංඛ්‍යාව** | **වෙන් කළ මුදල රු.** |
|---|---|---|
| අත්තනගල්ල | 06 | 240000.00 |
| දොම්පෙ | 02 | 245000.00 |
| බියගම | 04 | 483400.00 |
| වත්තල | 02 | 170000.00 |
| මීගමුව | 01 | 100000.00 |
| දිවුලපිටිය | 05 | 650000.00 |
| මිනුවන්ගොඩ | 03 | 350000.00 |
| කටාන | 09 | 970000.00 |
| එකතුව | 29 | 3208400.00 |

1.14.1.2. **ස්වයං රැකියා ආධාර**

| **ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය** | **සායන සංඛ්‍යාව** |
|---|---|
| බියගම | 01 |
| මහර | 01 |
| දොම්පෙ | 01 |
| ගම්පහ | 01 |
| එකතුව | 04 |

අඩු ආදායම්ලාභී ආබාධ සහිත තැනැත්තන් සඳහා උපරිමය රු.25000.00කට යටත්ව **ස්වයංරැකියා ආධාර** ලබාදීම සිදුකෙරේ.

1.14.1.3. **අක්ෂි කාච ලබාදීමේ වෛද්‍ය සායන පැවැත්වීම**

| **ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය** | **පුද්ගල සංඛ්‍යාව** | **ආධාර මුදල රු.** |
|---|---|---|
| ජා ඇල | 10 | 100000.00 |
| බියගම | 02 | 20000.00 |
| අත්තනගල්ල | 01 | 10000.00 |
| මීරිගම | 01 | 10000.00 |
| ගම්පහ | 01 | 15000.00 |
| **එකතුව** | **05** | **155000.00** |

1.14.1.4. **ප්‍රජා මූලික ආබාධිත පුනරුත්ථාපන වැඩසටහන 2013**

ආබාධ සහිත පුද්ගලයන් ප්‍රජාවේ තබා අවශ්‍යතා සොයා බලමින් සවිබලගැන්වීම, ජීවනෝපාය සංවර්ධනය, අන්තර්කරණය සඳහා අවශ්‍ය මැදිහත්වීම් සිදුකරන මෙම වැඩසටහන සඳහා පහත සඳහන් පරිදි මුදල් වෙන් කර ඇත.

| **ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය** | **වෙන් කළ මුදල රු.** |
|---|---|
| අත්තනගල්ල | 10 000.00 |
| ගම්පහ | 5000.00 |
| කැලණිය | 25 000.00 |
| මහර | 5000.00 |
| වත්තල | 5000.00 |
| ජා ඇල | 5000.00 |
| මීගමුව | 5000.00 |
| දිවුලපිටිය | 20 000.00 |
| මිනුවන්ගොඩ | 5000.00 |
| මීරිගම | 5000.00 |
| ගම්පහ දි.ලේ. | 65 000.00 |
| එකතුව | 1 50 000.00 |

1.14.1.5. මහින්ද චින්තන වැඩසටහන යටතේ ආබාධ සහිත පුද්ගලයන් සඳහා රු.3000.00 ක මාසික ජීවන ආධාර ලබාදීම.

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | පුද්ගල සංඛ්‍යාව | වෙන් කළ මුදල රු. |
|---|---|---|
| ගම්පහ | 50 | 1800000.00 |
| අත්තනගල්ල | 50 | 1800000.00 |
| දොම්පෙ | 50 | 1800000.00 |
| බියගම | 50 | 1800000.00 |
| කැලණිය | 50 | 1800000.00 |
| මහර | 50 | 1800000.00 |
| වත්තල | 50 | 1800000.00 |
| ජා ඇල | 60 | 2160000.00 |
| මීගමුව | 50 | 1800000.00 |
| දිවුලපිටිය | 50 | 1800000.00 |
| මිනුවන්ගොඩ | 50 | 1800000.00 |
| මීරිගම | 50 | 1800000.00 |
| කටාන | 50 | 1800000.00 |
| එකතුව | 660 | 23760000.00 |

## 1.14.2. තනි මාපිය පවුල් පුනරුත්ථාපන වැඩසටහන

පාසල් යන දරුවන් සහිත අඩු ආදායම්ලාභී වැන්දඹු කාන්තා/පිරිමි සඳහා ක්‍රියාත්මක මෙම ස්වයං රැකියා වැඩසටහන සඳහා පහත සඳහන් පරිදි මුදල් ලබා දී ඇත.

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | පුද්ගල සංඛ්‍යාව | වෙන් කළ මුදල රු. |
|---|---|---|
| දිවුලපිටිය | 05 | 52000.00 |
| අත්තනගල්ල | 11 | 82000.00 |
| මිනුවන්ගොඩ | 16 | 160000.00 |
| මීගමුව | 09 | 90000.00 |
| කැලණිය | 01 | 10000.00 |
| දොම්පෙ | 05 | 50000.00 |
| කටාන | 09 | 92000.00 |
| එකතුව | 61 | 536000.00 |

## 1.14.3. ජාතික වැඩිහිටි ලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන්.

### 1.14.3.1. ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් වැඩිහිටි සංවිධාන පිහිටුවීම

වයස අවුරුදු 60 ට වැඩි පුද්ගලයන් සාමාජිකත්වය ලබන මෙම සංවිධානය මගින් වැඩිහිටියන්ගේ සමාජ, ආර්ථික, ආගමික සහජීවනය ඇතිකරමින් ඔවුන්ගේ සුභසාධනය සඳහා වන ස්ව උපකාරක කණ්ඩායම් ලෙස ක්‍රියාත්මක වේ. ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් පිහිටුවන ලද ග්‍රාමීය වැඩිහිටි සංවිධාන වල නියෝජනයෙන් ප්‍රාදේශීය වැඩිහිටි බලමණ්ඩල පිහිටුවා ඇති අතර, එම බලමණ්ඩල නියෝජිතයන්ගෙන් සමන්විතව දිස්ත්‍රික් වැඩිහිටි බලමණ්ඩලය පිහිටුවා ඇත. 2013 වර්ෂයේදී දිස්ත්‍රික්කය තුළ වෙසෙන කුසලතා පූර්ණ වැඩිහිටි පුද්ගලයන් ඒකරාශී කර අවුරුදු උත්සව, ක්‍රීඩා තරගයක්, කලා ප්‍රසංගයක් සහ නිර්මාණ ප්‍රදර්ශනයක් පවත්වන ලද අතර අරමුදලක් ඇතිකරගැනීම පිණිස ලොතරැයිපත් අලෙවි කර දිනුම් ඇදීමක් සිදු කරන ලදී.

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | පිහිටුවා ඇති සංවිධාන සංඛ්‍යාව. | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | පිහිටුවා ඇති සංවිධාන සංඛ්‍යාව | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | පිහිටුවා ඇති සංවිධාන සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| දොම්පෙ | 60 | වත්තල | 37 | මීරිගම | 114 |
| අත්තනගල්ල | 124 | ජා ඇල | 57 | කටාන | 40 |
| ගම්පහ | 90 | මීගමුව | 25 | බියගම | 49 |
| කැලණිය | 34 | දිවුලපිටිය | 113 | එකතුව | 916 |
| මහර | 75 | මිනුවන්ගොඩ | 98 | | |

**1.143.2.** වයස අවුරුදු 60 ඉක්ම වූ (2012.01.01 දිනට) මහජන ආධාර/ සමෘද්ධි සහනාධාර ලාභී තනි පුද්ගලයන් සඳහා එම සහනාධාරය වෙනුවට **මාසිකව රු.1000.00 ක දීමනාවක් ලබාදීම.**

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | පුද්ගල සංඛ්‍යාව | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | පුද්ගල සංඛ්‍යාව | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | පුද්ගල සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| ගම්පහ | 1605 | වත්තල | 555 | කටාන | 1310 |
| අත්තනගල්ල | 1890 | ජා ඇල | 730 | එකතුව | 17035 |
| දොම්පෙ | 1200 | මීගමුව | 1215 | | |
| බියගම | 1215 | දිවුලපිටිය | 1890 | | |
| කැලණිය | 610 | මිනුවන්ගොඩ | 1920 | | |
| මහර | 1365 | මීරිගම | 1530 | | |

## 1 . 15 වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන්

**දැක්ම -** ලෝක මට්ටමේ ශ්‍රී ලාංකික ශ්‍රම බලකායක්.

**මෙහෙවර -** ගෝලීය වශයෙන් තරඟකාරී ශ්‍රම බලකායක් ගොඩනැගීම හා අපේ මානව සම්පත් වල මුළු ශක්තිය සමාජ ආර්ථික සංවර්ධනය සඳහා යොදා ගැනීම.

**අරමුණු -** 1. රැකියා නිර්මාණය හා ප්‍රවර්ධනය

2. වෘත්තීය මාර්ගෝපදේශනය

3. ජාතික මානව සම්පත් සංවර්ධනය

මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව යටතේ මෙම කාර්යාලයේ වෘත්තීය මාර්ගෝපදේශ අංශයේ සිටින නිලධාරීන් විසින් ඉටුකරන ලද කාර්යයන් පහත සඳහන් පරිදි වේ.

**ගම්පහ දිස්ත්‍රික්කයේ වෘත්තිය මාර්ගෝපදේශ ඒකකයේ සමස්ත ප්‍රගතිය - 2013**

| | වැඩසටහන | වාර්ෂික ඉලක්කය | | | සපුරා ගැනීම් | | |
|---|---|---|---|---|---|---|---|
| | | වැඩසටහන් | ප්‍රතිලාභින් | ප්‍රතිපාදන | වැඩසටහන් | ප්‍රතිලාභින් | වියදම |
| 1 | වෘත්තිය අභියෝග දැන ගැනිම | 5 | 150 | 35 ,250 .00 | 6 | 182 | 34 ,050 .00 |
| 2 | ස්වයං රැකියා පෙළඹවිම | 4 | 120 | 7 ,050 .00 | 4 | 156 | 7 ,000 .00 |
| 3 | ගුරුවරුන් දැනුවත් කිරිම | 1 | 20 | 1,250 .00 | 1 | 20 | 1,250 .00 |
| 4 | බාහිර උපාධිධාරි වැඩසටහන | 1 | 40 | 27 ,550 .00 | 1 | 58 | 27 ,550 .00 |
| 5 | සා/පෙළ | 67 | 1350 | | 72 | 2381 | |
| 6 | උ/පෙළ | 45 | 2345 | | 47 | 1636 | |
| 7 | වෘත්තිය කාර්යසාධනය | | 360 | | | 591 | |
| 8 | වෘත්තිය මාර්ගෝපදේශන සේවා | | 312 | | | 1346 | |
| | එකතුව | 123 | 4697 | 71 ,100 .00 | 131 | 6364 | 69 ,850 .00 |

මූලාශ්‍රය : වෘත්තීය මාර්ගෝපදේශ අංශය , ගම්පහ

## වාර්ෂික ප්‍රගතිය - රැකියා නිර්මාණ හා ප්‍රවර්ධන වැඩසටහන් - 2013

| වැඩසටහන | වාර්ෂික ඉලක්කය | | | | වාර්ෂික සපුරා ගැනීම් | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | වැඩසටහන් | ප්‍රතිලාභීන් සංඛාව | සෘජු රැකියා සංඛ්‍යාව | ප්‍රතිපාදන රු. | වැඩසටහන් | ප්‍රතිලාභීන් සංඛාව | සෘජු රැකියා සංඛ්‍යාව | වියදම |
| අවශ්‍යතා මනා පුහුණු වැඩසටහන් | 5 | 100 | | 32 ,750 .00 | 10 | 318 | | 69 ,762 .00 |
| ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩ සටහන් | 1 | 30 | | 20 ,550 .00 | 1 | 31 | | 18 ,950 .00 |
| රැකියා සමාජ වැඩසටහන | 4 | 120 | 60 | 82 ,800 .00 | 4 | 118 | 17 | 78 ,960 .00 |
| ජීවනෝපාය සංවර්ධන වැඩසටහන | 2 | | | | 2 | 63 | - | 28,920.00 |
| නිදහස් රැකියා සඳහා පෙළඹවීමේ වැඩසටහන | 1 | 30 | 15 | 11 ,460 .00 | 1 | 38 | 11 | 11,460.00 |
| ප්‍රාදේශිය රැකියා පොළ | 12 | | 180 | 72 ,000 .00 | 12 | 5557 | 144 | 72,000.00 |
| දිස්ත්‍රික් රැකියා පොළ | 1 | | | 25 ,000 .00 | 1 | 1000 | 6 | 49,667.00 |
| උද්‍යාන අලංකරණය | 1 | 30 | | 40 ,000 .00 | 1 | 30 | - | 26,500.00 |
| ගුරුවරුන් දැනුවත් කිරීම | 1 | 40 | | 35 , 000 .00 | 1 | 43 | - | |
| සෘජු රැකියා ගත කිරීම් | | | 190 | | | | 272 | |
| එකතුව | 29 | 350 | 445 | 343 ,060 .00 | 33 | 7198 | 450 | 391,219.00 |

ජාතික රැකියා සේවා මධ්‍යස්ථානයේ ප්‍රගතිය

| මාසය | රැකියා අපේක්ෂිතයන් ලියාපදිංචි කළ සංඛ්‍යාව | රැකියා ඇබෑර්තු ලියාපදිංචි කළ සංඛාව | රැකියා ගැලපීම් සංඛ්‍යාව | රැකියා ගතකිරීම් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ජනවාරි | 62 | 278 | 375 | 48 |
| පෙබරවාරි | 55 | 162 | 275 | 40 |
| මාර්තු | 675 | 295 | 203 | 67 |
| අප්‍රේල් | 85 | 153 | 165 | 45 |
| මැයි | 282 | 103 | 198 | 66 |
| ජූනි | 278 | 146 | 192 | 42 |
| ජූලි | 60 | 52 | 257 | 49 |
| අගොස්තු | 71 | 62 | 189 | 32 |
| සැප්තැම්බර් | 455 | 162 | 193 | 22 |
| ඔක්තෝම්බර් | 221 | 85 | 176 | 28 |
| නොවැම්බර් | 335 | 91 | 220 | 21 |
| දෙසැම්බර් | 291 | 62 | 170 | 15 |
| එකතුව | 2870 | 1654 | 2613 | 475 |

## 1.16 ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන්

ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය විසින් ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුයුක්ත කර ඇති ඵලදායිතා ප්‍රවර්ධන නිලධාරීන් ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයට අදාලව ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් අංශ වශයෙන් පහතින් දැක් වේ.

1. පාසල් අංශ සඳහා ඵලදායිතා පුහුණු සහ ප්‍රවර්ධන වැඩසටහන
2. රාජ්‍ය අංශය සඳහා ඵලදායිතා පුහුණු සහ ප්‍රවර්ධන වැඩසටහන
3. පෞද්ගලික අංශය සඳහා ඵලදායිතා පුහුණු සහ ප්‍රවර්ධන වැඩසටහන
4. ප්‍රජා ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන
5. දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන විශේෂ ව්‍යාපෘති

**1. කයිසෙන් ව්‍යවසායක වැඩසටහන**

ගම්පහ දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කරන ලද නියමු ව්‍යාපෘතියක් වන කයිසෙන් ව්‍යවසායකයෝ වැඩසටහන මගින් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ඵලදායිතා සංකල්ප භාවිතයෙන් වැඩි දියුණු කරන අතර, මෙම වැඩසටහන ආයතන 150 ක ක්‍රියාත්මක වේ. එමගින්,

- ආයතන තුළ ඵලදායිතා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ඵලදායිතා සම්මානලාභී ආයතන නැරඹීමට යාම
- දිස්ත්‍රික්කය තුළ ආයතන මට්ටමින් දැනුම හුවමාරු කර ගැනීම
- ජාත්‍යන්තර මට්ටමේ පුහුණු අවස්ථා ලබාදීම
- වාර්ෂික සුහද හමුව සහ ක්‍රිකට් තරගාවලිය
- ජාතික ඵලදායිතා සම්මානයට ඉදිරිපත් කිරීම
- නව රැකියා බිහි කිරීම
- ව්‍යාපාරික අවස්ථා පුළුල් කිරීම ට අදාල ආයෝජන සඳහා පෙළඹවීම

**2. ගම්පහ දිස්ත්‍රික් මහජන බැංකු සඳහා වූ ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන**

මෙමගින් දිස්ත්‍රික්කය පුරා ඇති මහජන බැංකු ශාඛා කාර්යාල 58 ක් සඳහා ඵලදායිතා ප්‍රවර්ධනය සඳහා ඵලදායිතා පුහුණු වැඩසටහන් පැවැත්වීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා අත්පොතක් නිර්මාණය කර මුද්‍රණය කිරීම. 2013 වසරේ 5S තරගාවලියක් පැවැත්වූ අතර 2014 සඳහා PPS (Peoples' Bank Productivity System) ඉදිරි කටයුතු සංවිධානය කර ඇත.

3. ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව සහ ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය විසින් ආරම්භ කරන ලද පොලිස් ස්ථාන තුළ ඵලදායිතා සංකල්ප ක්‍රියාත්මක කිරීමේ වැඩසටහනට සමගාමීව ගම්පහ දිස්ත්‍රික්කයේ සියලුම පොලිස් ස්ථාන වල මෙම වැඩසටහන ආරම්භ කිරීම.

4. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් තෝරාගනු ලැබූ පෙරපාසැල් සඳහා ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන, මෙම වැඩසටහන සඳහා පෙර පාසැල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් තෝරාගනු ලැබූ පෙරපාසැල් සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් 10 බැගින් 130ක් තෝරා ගෙන ඇති අතර ඒවා ඵලදායිතා සංකල්ප භාවිතයෙන් ප්‍රවර්ධනය කිරීම.

## 1.17 ක්‍රීඩා කටයුතු

**දැක්ම**

"නිරෝගිමත්,ක්‍රියාශීලී , සමාජයක් තුළින් සමෘද්ධිමත් දේශයක් සඳහා ක්‍රීඩාව."

**මෙහෙවර**

"ක්‍රීඩාව සංවර්ධනය තුළින් ශ්‍රී ලාංකිකයන් ක්‍රියාශීලී නිරෝගී විනයගරුක, අභිමානවත් ජාතියක් ලෙස ලොව දස්කම් දැක්වීමට පසුබිම සකස් කිරිම."

**අරමුණු**

- ක්‍රීඩාව තුළින් නිරෝගිමත් පුරවැසියන් පිරිසක් රටට දායක කර දී රටේ සංවර්ධනයට උර දීම.
- ජාති, ආගම්, වර්ණ, කුල, පක්ෂ භේදයකින් තොරව ජාතික සමගිය ඇති කිරීම සඳහා දායක වීම.
- ක්‍රීඩාව තුළින් ශ්‍රී ලාංකීය නාමය ජාත්‍යන්තරයට ගෙන යාම.
- ක්‍රීඩා කුසලතා ඇති තරුණ තරුණියන් හඳුනාගෙන ඔවුන් පෝෂණය කිරීම හා අවශ්‍ය පහසුකම් සපයා දීම තුළින් කුසලතා වැඩි දියුණු කිරිම.
- ක්‍රීඩාවේ උන්නතිය සඳහා අවශ්‍ය වන භෞතික, මානව හා අනෙකුත් සම්පත් සංවර්ධනය කිරීම.
- තරඟකාරී අධ්‍යාපන ක්‍රමයත් සමඟ ක්‍රීඩා කුසලතා දක්වන දරු දැරියන් සඳහා අධ්‍යාපනය හා සමගාමීව ක්‍රීඩාව සංවර්ධනය කිරීම හා අධ්‍යාපනය අවසන් කළ පසු ක්‍රීඩා ක්ෂේත්‍රය තුල ඔවුන් රඳවා ගැනීම සඳහා මානසික හා ශරීර සෞඛ්‍ය උද්දීපනය කිරීම.
- ජාතික ක්‍රීඩා සංගම්වල පරිපාලනය හා සංවර්ධනය විධිමත් කිරීම.

**කාර්යභාරය**

1. **මානව සම්පත් සංවර්ධනය**

- ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා විධිමත් පුහුණුවීමක් ලබා දිම.
- ක්‍රීඩක ක්‍රීඩිකාවන් ජාතික හා ජාත්‍යන්තර තලයේ ක්‍රීඩා තරඟ වලට යොමු කිරීමට අවශ්‍ය පසුබිම සකස් කිරීම.
- ක්‍රීඩා පුහුණු කරුවන්ට හා ක්‍රීඩා නිලධාරීන්ට විදේශ පුහුණුව ලබා දිම.
- විදේශ පුහුණු කරුවන් යොදාගෙන ශ්‍රී ලාංකික පුහුණු කරුවන් පුහුණු කිරීම.
- ක්‍රීඩා නිලධාරීන්ට නව තාක්ෂණය ලබා දිම සඳහා තාක්ෂණ වැඩමුළු සංවිධානය කිරීම.
- දේශීය හා විදේශීය ක්‍රීඩා විශේෂඥයින් ලවා ක්‍රීඩා සම්මන්ත්‍රණ පැවැත්වීම.
- දේශීය වශයෙන් මෙන්ම විදේශීය වශයෙන් ක්‍රීඩා අධ්‍යාපන ශිෂ්‍යත්ව පිරිනැමීම.

## 2. යටිතල පහසුකම් සංවර්ධනය

- ජාත්‍යන්තර තරඟ සඳහා යෝග්‍යවන ක්‍රීඩා සංකීර්ණ ඇති කිරීම.
- ශ්‍රී ලංකාවේ විවිධ පළාත්වල ජාතික හා දිස්ත්‍රික් මට්ටමින් ක්‍රීඩාංගන සංවර්ධනය කිරීම හා නවීකරණය කිරීම.
- ග්‍රාමීය ක්‍රීඩා පිටි සංවර්ධනය.
- ක්රීඩා භාණ්ඩ හා උපකරණ සැපයීම

## 3. ජාතික මහා ක්‍රීඩා උළෙල පැවැත්වීම

ජාතික මහා ක්‍රීඩා උළෙල 1969 දී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් තරඟ පැවැත්වීම තුළින් ආරම්භවී 1972 වසරේ දී මනා සංවිධානයකින් යුතුව කොළඹ සුගතදාස ක්‍රීඩාංගණයේදී පවත්වන ලදී. මෙම ජාතික මහා ක්‍රීඩා උළෙලේ ප්‍රධාන අරමුණ වන්නේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ හා දිස්ත්රික් මට්ටමේ තරඟ පවත්වා අවසානයේ පළාත් තරඟ දක්වා දක්ෂතා ඇති ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගෙන් ජාතික මට්ටමේ දක්ෂතා ඇති ක්‍රීඩක ක්‍රීඩිකාවන් හඳුනාගෙන විධිමත් පුහුණුවක් ලබා දී ඔවුන්ව ජාත්‍යන්තර තලයට යොමු කිරීමයි.

**ගම්පහ දිස්ත්‍රික්කයේ සිටින ජාත්‍යන්තර තලය නියෝජනය කරන වොලිබෝල් ක්‍රීඩක/ ක්‍රීඩිකාවන්**

| | |
|---|---|
| 1.සමන් චන්ද්‍රනාත් | 1.තක්ෂිලා නිරංජලී |
| 2.අසංක ප්‍රදීප් කුමාර | 2.අනුෂා දීපානි |
| 3.සමීර දිසානායක | 3.ශශිකා සමරසිංහ |
| 4.රුක්මාල් සංජීව | 4.ගීතිකා ලලනි ගුණවර්ධන |
| 5.මොරිස් චාමින්ද | 5.ඉන්දු ඉලංගකෝන් |
| 6.තරිඳු ලක්මාල් | 6.විනෝදි කෞෂල්‍යා |
| 7.මෙලාන් ජයවර්ධන | 7.ඒ.ටී.එන්.ප්‍රියදර්ශනී |
| 8.ජනිත් සුරන් | 8.සචිනි හංසනී |
| 9.ඉසුරු ලක්ෂාන් | 9.නදීකා අතුකෝරල |
| 10.මහේෂ් පෙරේරා | 10.ඉරෝෂා උදයංගනී |
| 11.පුබුදු ඒකනායක | 11.විරාජි චාමරිකා |
| 12.වසන්ත කුමාර | 12.දිනූෂි මධුෂිකා |

## 1.18 ළමා හිමිකම් ප්‍රවර්ධන අංශය

ළමුන්ගේ අයිතීන් තහවුරුවූ ඔවුනට සංවේදී හිතකර සමාජයක් ඇතිකර ලීමේ දැක්මෙන් යුතුව ළමා අයිතීන් සුරක්ෂිත කිරීම සඳහා ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2013 වර්ෂයේ ළමා හිමිකම් ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන් යටතේ ක්‍රියාත්මක කරන ලද වැඩ සටහන් පහතින් සඳහන් කර ඇත.

| අංක | වැඩසටහන | ඉලක්ක කණ්ඩායම | දෙපාර්තමේන්තු ප්‍රතිපාදන මගින් | වෙනත් ආයතන රු. |
|---|---|---|---|---|
| 1 | තටු සවිමත් සමනල වියක්. (නවීන තාක්ෂණය ළමා සංවර්ධනයට යොදා ගත හැකි ආකාරය පිළිබඳව දැනුවත් කිරීම) | දිස්ත්‍රික් ළමා සභා දරුදැරියන් 100 ක් | රු10000.00 | |
| 2 | අපේ සමනලුන්ගේ තටු සවිමත් කරමු. (නවීන තාක්ෂණය ළමා සංවර්ධනයට යොදා ගත හැකි ආකාරය පිළිබඳව දැනුවත් කිරීම) | දෙමාපියන් 100 ක් | රු 15000.00 | |
| 3 | උපදේශන විෂයභාර ගුරුභවතුන් ළමා අපයෝජනයපිළිබඳව දැනුවත් කිරීම. | ගුරුභවතුන් 150 ක් | රු 15000.00 | |
| 4 | ළමා අපයෝජනය පිළිබඳව දෙමාපියන් දැනුවත් කිරීම් වැඩසටහන් 03 ක් පැවැත්වීම. | දෙමාපියන් 750 ක් | | 15000.00 |
| 5 | දරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් 05ක් පැවැත්වීම. | දරුදැරියන්1500 ක් | | 25000.00 |
| 6 | ළමා කුසලතා සංවර්ධන වැඩ සටහනක් පැවැත්වීම. | දිස්ත්‍රික් ළමා සභාවේ දරු දැරියන් 65 ක් | රු 25000.00 | |
| 7 | දිස්ත්‍රික් ළමා සභාව ක්‍රියාත්මක කිරිම | දිස්ත්‍රික් ළමා සභාවේ දරු දැරියන් 65 ක් | රු 4000.00 | |
| 8 | දිස්ත්‍රික් නාට්‍ය තරග පැවැත්වීම | | රු 4000.00 | 25000.00 |
| 9 | දිස්ත්‍රික් ක්‍රිකට් තරගයක් පැවැත්වීම | | | 40000.00 |
| 10 | දිස්ත්‍රික් වීදි දරු සුභ සාධන වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම | වීදි දරු දැරියන්70ක් | රු 365000.00 | |
| 11 | ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන්ගේ ප්‍රගති සමාලෝචනය පැවැත්වීම. | | රු 5000.00 | |

**වීදි දරු සුභ සාධන ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කළ වැඩ සටහන් විස්තරය.**

| අංකය | වැඩ සටහන | ස්ථානය | දිනය | වියදම | මෙහෙයවීම හා වගකීම |
|---|---|---|---|---|---|
| 1 | වීදි දරුවන් පිළිබඳව රාත්‍රී හා දිවා කාලයේ සමීක්ෂණය කර තොරතුරු ලබා ගැනීම | මීගමුව, ජාඇල, ගම්පහ, වත්තල, කැළණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | 2013/o9/26 /27/28/29 | රු 30000.00 | දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් |
| 2 | ළමා අපයෝජනයෙන් තොර සුන්දර ළමා වියක් පිළිබඳව වීදි දරුවන් දැනුවත් කිරීම් වැඩ සටහන් 02ක් පැවැත්වීම. | මීගමුව, කැළණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | 2013 /11/31 12/30/2013 | රු 20000.00 | දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් |
| 3 | අපයෝජනයෙන්තොර සුන්දර ළමාවියක්පිළිබඳවවීදිදරුවන්ගේදෙමාපියන්දැනුවත් කිරීමේ වැඩ සටහනක් පැවැත්වීම. | මීගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | 10/29/2013 12/31/2013 | රු 20000.00 රු 25000.00 | දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් |
| 4 | වෛද්‍ය ශායනයක් පවත්වා වීදි දරුවන්ගේ සහ දෙමාපියන්ගේ සෞඛ්‍ය තත්වය නංවාලීම. | මීගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | 11/14/2013 | රු 20000.00 | දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් |
| 5 | අධ්‍යාපනය නොලබන වීදි දරුවන් අධ්‍යාපන කටයුතු සඳහා යොමු කිරීම/අධ්‍යාපන උපකරණ ලබාදීම. | මීගමුව,ජාඇල,ගම්පහ, වත්තල,කැළණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | 2013 දෙසැම්බර් | රු 59200.00 | දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් |
| 6 | වීශ්ව ළමා දිනය වෙනුවෙන් වීදි දරුවන් විනෝද චාරිකාවක් රැගෙනයාම | මීගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | 12/9/2013 | රු40000.00 | දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් |

| | | | | | |
|---|---|---|---|---|---|
| 7 | වීදි දරුවන්ගේ ළමා සමාජ ඇති කිරීම,කියවීම් පොත් සහ ඔවුන්ගේ ක්‍රීඩා කටයුතු සදහා ක්‍රීඩා භාණ්ඩ ලබාදීම. | මීගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | 2013 දෙසැම්බර් | රු20000.00 | දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරින් |
| | වීදි දරුවන්ගේ සංස්කෘතික උත්සවයක් පැවැත්වීම. | | 12/20/2013 | රු 40000.00 | |
| | වීදිදරුවන්ගේක්‍රීඩා උත්සවයක් පැවැත්වීම. | | 12/12/2013 | රු 20000.00 | |
| 8 | වීදිදරුවන්ට දිවාකාලයේ ආරක්ෂිතවසිටීමමීගමුවන වීදිදරුසුබසාධන මධ්‍යස්ථානය සංවර්ධනය කිරීම. | මීගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | 2013 දෙසැම්බර් | රු15200.00 | දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් |
| | දැනුවතු කිරීම් බැනර් 12 ක් නිර්මාණය කිරීම | | | රු 15600.00 | |

# 1.19 මුල් ළමාවිය සංවර්ධන වැඩසටහන්

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 1- මිලියන 100 වැඩසටහන | 2-රාජ්‍ය නිලධාරීන් / දෙමාපියන් දැනුවත් කිරීම | 3- නැණදීපනී- ගුරුපුහුණු | 4- ශ්‍රමීය කමිටු | 5 - ආහාර හා පෝෂණ වැඩසටහන | දරුවන්ගේ දෙමා. සඳහා වැඩසටහන | 7-ලෝක ළමා දින වැඩ සටහන | 8- සෙල්ලම් සෙල්ලම | 9-ඒකාවරණ සතිය-විනෝද චාරිකා/ගුරු පුහුණු | 10-දෙමාපියන්/කරුණ සාකච්ඡායම්/ගැබිණි මවවරුන් දැනුවත් කිරීම. | ප්‍රා/ලේ/කොට්ඨාශ මට්ටමින් වියදම | ලද ප්‍රතිපාදන | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ඉතිරිය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 100000 | - | - | - | - | - | - | | 15000 | - | 115000 | 115000 | - |
| අත්තනගල්ල | - | 5000 | 10 000 | - | 5000 | - | 5000 | - | - | - | 25000 | 45000 | 20 000 |
| වත්තල | - | 5000 | 10 000 | - | 5000 | 5000 | 5000 | - | 10 000 | 5000 | 45000 | 45000 | - |
| බියගම | - | 5000 | 10 000 | - | 5000 | 5000 | 5000 | - | 10 000 | 5000 | 45000 | 47000 | 2000 |
| දි/පිටිය | - | 5000 | 10 000 | - | 5000 | 5000 | 5000 | - | 10 000 | 5000 | 45000 | 47000 | 2000 |
| කටාන | - | 5000 | 10 000 | - | 5000 | 5000 | 5000 | - | 10 000 | 5000 | 45000 | 45000 | - |
| කැළණිය | - | 5000 | 10 000 | 2000 | 5000 | 4980 | 5000 | - | 5000 | 5000 | 41 980 | 47000 | 5020 |
| ජා ඇල | - | 5000 | 10 000 | - | 5000 | 5000 | 5000 | - | 10 000 | 5000 | 45000 | 47000 | 2000 |
| මහර | - | 5000 | 9600 | - | 4950 | 5000 | 5000 | - | 10 000 | 4700 | 44250 | 45000 | 750 |
| මි.ගොඩ | - | 5000 | 9800 | - | 5000 | 5000 | 5000 | - | 10 000 | 5000 | 44800 | 45000 | 200 |
| මීරිගම | - | 5000 | 10000 | - | 5000 | 5000 | 5000 | - | 10 000 | 5000 | 45000 | 45000 | - |
| ගම්පහ | - | 5000 | 10000 | - | 5000 | 5000 | 5000 | - | 10 000 | 5000 | 45000 | 45000 | - |
| දොම්පේ | - | 4990 | 9950 | - | 4970 | 4948 | 4925 | 30 000 | 10 000 | 4980 | 74763 | 75000 | 237 |
| මීගමුව | | - | - | - | - | - | - | 29125.5 | - | - | 29125.5 | 30000 | 874.5 |
| **වියදම** | 100000 | 59 990 | 119 350 | 2000 | 59 920 | 54 928 | 59 925 | 59 125.5 | 120 000 | 54 680 | ***689919*** | | |
| **ලද ප්‍රතිපාදන** | 100000 | 60 000 | 120 000 | 8000 | 60 000 | 60 000 | 60 000 | 60 000 | 135 000 | 60 000 | | ***723000*** | |
| **ඉතිරිය** | - | 10 | 650 | 6000 | 80 | 5072 | 75 | 874.5 | 15 000 | 5 320 | | | ***33082*** |

## කිරි වීදුරුව වැඩසටහන-2013

## වියදම් වාර්තාව

| ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය | වෙන්කළ මුළු ප්‍රතිපාදන මුදල(රු) | 2013.12.31 දිනට වියදම | ඉතිරිය |
|---|---|---|---|
| ගම්පහ | 133 300.00 | 58 195.00 | 75105.00 |
| දිවුලපිටිය | 222 309.00 | 216 937.00 | 5372.00 |
| කටාන | 263 401.00 | 203464 | 59937.00 |
| මීගමුව | 234 550.00 | 255 205.60 | 9344.40 |
| මිනුවන්ගොඩ | 532 900.00 | 525 223.00 | 7677.00 |
| මීරිගම | 100000 | 65 880.00 | 34120.00 |
| අත්තනගල්ල | 24 400.00 | - | 24400.00 |
| ජා ඇල | 418 160.00 | 408 943.00 | 9217.00 |
| වත්තල | 233 380.00 | 157 240.00 | 76140.00 |
| මහර | 148 600.00 | 13 140.00 | 135460.00 |
| දොම්පේ | 495 950.00 | 482 335.00 | 13615.00 |
| කැලණිය | 126 950.00 | 47 620.00 | 79330.00 |
| බියගම | 300 320.00 | 254 743.00 | 45577.00 |
| **එකතුව** | **3 234 220.00** | **2 658 925.60** | **575924.40.00** |

# 02. පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර අංශය

## 01. මෙම අංශයේ ප්‍රධාන කාර්යයන්

1. මහා පරිමාණ, මධ්‍යම හා සුළු පරිමාණ කළුගල් කැණීම් කර්මාන්ත සඳහා පුපුරණ ද්‍රව්‍ය අවසරපත්‍ර නිකුත් කිරිම හා පුපුරණ ද්‍රව්‍ය වාරික නිකුත් කිරීම.
2. ඉදිකිරිම් කටයුතු වලදී අවහිර වන කළුගල් ඉවත් කිරිම සඳහා පුපුරණ ද්‍රව්‍ය අවසරපත්‍ර නිකුත් කිරිම.
3. ආයුර්වේද ඖෂධ නිෂ්පාදනයන් සඳහා අවශ්‍ය වන පුපුරණ ද්‍රව්‍ය අවසරපත්‍ර නිකුත් කිරිම.
4. ගිණිකෙළි කර්මාන්තය, තීන්ත/ආලේපන හා මදුරු දගර කර්මාන්තය සඳහා අවශ්‍ය පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර හා අවසරපත්‍ර නිකුත් කිරිම.
5. පරීක්ෂණ පිපුරුම් හා ක්ෂේත්‍ර කටයුතු සඳහා සහභාගි වීම.
6. ගිණිකෙළි කර්මාන්තයන් සඳහා වැඩමුළු පැවැත්වීම.
7. කාර්මික පුපුරණ ද්‍රව්‍ය භාවිතා කරන්නන් සඳහා වූ පාඨමාලාවේ දේශන පැවැත්වීම.
8. වෝටර් ජෙල් කර්මාන්තයට සම්බන්ධ අධීක්ෂණ කටයුතු.
9. සේවා නූල් හා ගල් වෙඩි බෙහෙත් කර්මාන්තයට සම්බන්ධ අධීක්ෂණ කටයුතු.
10. කර්මාන්තකරුවන්ගේ අවශ්‍යතාව මත පුපුරණ ද්‍රව්‍ය පනතට ගැනෙන පුපුරණ ද්‍රව්‍යන් ආනයනය කිරීමට හා අපනයනයට අදාල බලපත්‍ර නිකුත් කිරීම.
11. බලයලත් පුපුරණ ද්‍රව්‍ය අලෙවි නියෝජිතයන් සඳහා බලපත්‍ර නිකුත් කිරීම හා ඔවුන්ගේ තොග ගබඩා සම්බන්ධ අධීක්ෂණ කටයුතු.
12. පුපුරණ ද්‍රව්‍ය ගබඩා ප්‍රතිස්ථානගත කිරීමේ දීප ව්‍යාප්ත වැඩපිළිවලට සමගාමීව ගම්පහ දිස්ත්‍රික්කයේ ස්ථාන හතරක නව ගබඩා සංකීර්ණ හතරක් ප්‍රතිස්ථානගත කිරීම.

## 02. 2013 වර්ෂය තුළ පුපුරණ ද්‍රව්‍ය අංශය වෙත ලද අවසර පත්‍ර/ බලපත්‍ර ඉල්ලුම්පත් සංඛ්‍යාව

| ලද ඉල්ලුම්පත් සංඛ්‍යාව | සංඛ්‍යාව |
|---|---|
| පුපුරණ ද්‍රව්‍ය අවසරපත්‍ර ඉල්ලුම්පත් සංඛ්‍යාව | 341 |
| පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර ඉල්ලුම්පත් සංඛ්‍යාව | 214 |

## 03. 2013 වර්ෂය තුළ නිකුත් කළ අවසර පත්‍ර , බලපත්‍ර(වර්ග අනුව) හා අවසර පත්‍ර/ බලපත්‍ර ගාස්තු ලෙස ලද ආදායම

| නිකුත් කළ අවසර පත්‍ර වර්ගය | සංඛ්‍යාව | ආදායම රු. |
|---|---|---|
| කළුගල්, ගිනි පෙට්ටි, ඖෂධ නිපදවීම, මදුරු දගර කර්මාන්ත හා පොදු කටයුතු සඳහා | 341 | 80,850/= |

| නිකුත් කළ බලපත්‍ර වර්ගය | සංඛ්‍යාව | ආදායම රු. |
|---|---|---|
| නිෂ්පාදන, සපයන්නා, ආනයන හා අපනයන බලපත්‍ර | 214 | 254,750/= |

**04. 2012 වර්ෂය සමග සංසන්දනය කිරීමේදී 2013 වර්ෂය තුළ පුපුරණ ද්‍රව්‍ය අංශය වෙත ලද අවසර පත්‍ර හා බලපත්‍ර ඉල්ලුම්පත් සංඛ්‍යාව**

| ලද ඉල්ලුම්පත් සංඛ්‍යාව | 2012 වසර | 2013 වසර |
|---|---|---|
| පුපුරණ ද්‍රව්‍ය අවසර පත්‍ර ඉල්ලුම් පත් සංඛ්‍යාව | 454 | 341 |
| පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර ඉල්ලුම් පත් සංඛ්‍යාව | 210 | 214 |

**ලද ඉල්ලුම්පත් සංඛ්‍යාව - 2012 වසර හා 2013 වසර**

සංඛ්‍යාව




05. 2012 වර්ෂය සමඟ සංසන්දනය කිරීමේදී 2013 වර්ෂය තුළ නිකුත් කළ අවසරපත්‍ර හා බලපත්‍ර (වර්ග අනුව) සංඛ්‍යාව

| නිකුත් කළ පුපුරණ ද්‍රව්‍ය අවසර පත්‍ර හා බලපත්‍ර සංඛ්‍යාව | 2012 වසර | 2013 වසර |
|---|---|---|
| නිකුත් කළ පුපුරණ ද්‍රව්‍ය අවසරපත්‍ර සංඛ්‍යාව | 453 | 341 |
| නිතුත් කළ පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර සංඛ්‍යාව | 205 | 214 |

## නිකුත් කළ අවසර පත්‍ර හා බලපත්‍ර සංඛ්‍යාව - 2012 වසර හා 2013 වසර




06. 2012 වර්ෂය සමඟ සංසන්දනය කිරීමේදී 2013 වර්ෂය තුළ නිකුත් කළ අවසර පත්‍ර හා බලපත්‍ර සංඛ්‍යාවට අදාලව ලද ආදායම

| **අවසර පත්‍ර හා බලපත්‍ර නිකුත් කිරීමෙන් ලද ආදායම** | **2012 වසර** | **2013 වසර** |
|---|---|---|
| අවසරපත්‍ර නිකුත් කිරීමෙන් ලද ආදායම (රුපියල්) | 109,650/= | 80,850/= |
| බලපත්‍ර නිකුත් කිරීමෙන් ලද ආදායම (රුපියල්) | 173,850/= | 254,750/= |

## අවසර පත්‍ර හා බලපත්‍ර නිකුත් කිරීමෙන් ලද ආදායම - 2012 හා 2013



07. පුපුරණ ද්‍රව්‍ය ගබඩා ප්‍රතිස්ථානගත කිරීමේ දීප ව්‍යාප්ත වැඩපිළිවෙලට සමගාමීව ගම්පහ දිස්ත්‍රික්කයේ ස්ථාන හතරක නව ගබඩා සංකීර්ණ හතරක් ප්‍රතිස්ථානගත කිරීම

| ප්‍රතිස්ථානගත කිරීමට පෙර ගබඩා පැවති ස්ථානය | ප්‍රතිස්ථානගත කරනු ලැබූ ස්ථානය | බලයලත් පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර හිමියන් සංඛ්‍යාව | බලයලත් පුපුරණ ද්‍රව්‍ය නිෂ්පාදකයන් සංඛ්‍යාව |
|---|---|---|---|
| කටාන පොලිස්ථානය | කටාන, ඉඹුල්ගස් වාඩිය | 2 | 1 |
| කොටදෙනියාව පොලිස්ථානය<br>දිවුලපිටිය පොලිස්ථානය | වල්පිට, දොඹවින්න වත්ත | 2 | - |
| ගම්පහ පොලිස්ථානය<br>නිට්ටඹුව පොලිස්ථානය | නිට්ටඹුව, ඕවඩ් වත්ත | 4 | 2 |
| සපුගස්කන්ද පොලිස්ථානය<br>දොම්පෙ පොලිස්ථානය | කිරිදිවැල, මාලිගා වත්ත | 2 | - |

# 03. දිස්ත්‍රික් ක්‍රමසම්පාදන ලේකම් කාර්යාලය

## 3.1 දිවි නැගුම ජාතික වැඩසටහන 2013

මහින්ද චින්තන ඉදිරි දැක්ම අනුව ගෘහ ආර්ථික ඒකක ශක්තිමත් කිරීමේ අරමුණින් ගම්පහ දිස්ත්‍රික්කයේ කෘෂි කර්මාන්තය, පශු සම්පත්, ධීවර සහ ගෘහ කර්මාන්තය යන අංශ සංවර්ධනය කිරීම සඳහා පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබීය.

### 1. <u>ගෙවතු සංවර්ධන වැඩසටහන</u>

දිවිනැගුම වැඩසටහන යටතේ 2013 වර්ෂයේ ගම්පහ දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරි වසම් 1176 ක ගෘහ ආර්ථික ඒකක සංවර්ධනය කිරීම සඳහා ග්‍රාම නිලධාරින්, කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර, සමෘද්ධි සංවර්ධන නිලධාරින් හා උපාධිධාරි අභ්‍යාසලාභීන් යන පහසුකාරකයන්ගේ සෘජු අධීක්ෂණය යටතේ කටයුතු කරන ලදි.

❖ <u>පොල් පැළ ලබා දීම</u>

ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 13 ම ආවරණය වන පරිදි පොල් පැළ 117,925 ක් බෙදා දෙන ලද අතර මේ සඳහා රු. 8,844,375/- ක වියදමක් දරා ඇත.

❖ <u>පළතුරු පැළ ලබා දීම</u>

සමස්ත ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය වන පරිදි අඹ, රඹුටන්, අන්නාසි, පේර ආදී පළතුරු පැළ 87,055 ක්, සිංහල නව වසර සඳහා බෙදාදෙන ලද අතර මේ සඳහා රු. 8,565,460/- ක මුදලක් වැය කර ඇත. පාසල් සංවර්ධන වැඩසටහනට සමගාමීව පාසල් සිසුන් සඳහා රු. 1,516,525/- ක වියදමින් පළතුරු පැළ 30,268 ක් බෙදා දෙන ලදි. ප්රාදේශීය ලේකම් කොට්ඨාස පහක් සඳහා රු. 3,383,800/- ක වියදමින් කජු පැළ 17,621ක් ලබා දීමද 2013 වසරේ සිදු කරන ලදි. මීට අමතරව දිවි නැගුම 5 වන අදියර යටතේ පළතුරු පැළ 65,772 ක් ද ආදර්ශ ගෙවතු සඳහා පළතුරු පැළ 33,866 ක් ද බෙදා දෙන ලදි.

❖ <u>සුළු අපනයන බෝග පැළ ලබා දීම</u>

2013 වර්ෂයේ ගෘහ ආර්ථික ඒකක සඳහා ගම්මිරිස් හා කුරුඳු පැළ ලබා දෙන ලදි. මේ යටතේ රු. 233,424/- ක වියදමින් ගම්මිරිස් පැළ 14,589/- බෙදා දෙන ලද අතර කුරුඳු පැළ 1241 ලබා දෙන ලදි.

❖ <u>අපනයන බෝග පැළ ලබා දීම</u>

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දෙකක් සඳහා රබර් පැළ 290 ක් බෙදා දී ඇති අතර දරන ලද වියදම රු. 54,650/- කි.

## 3.2 ගම්පහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව

ගම්පහ දිස්ත්‍රික්කයේ සියලුම සංවර්ධන වැඩසටහන් පිළිබඳව සාකච්ඡා කෙරෙන, එහිදී මතුවන ගැටළු සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණ ගනු ලබන දිස්ත්‍රික්කයේ ප්‍රධානතම කමිටුව, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව වේ.

දිස්ත්‍රික් සැලසුම් කමිටුව, ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු 13, නිවාස කමිටුව, පරිසර කමිටුව, කෘෂිකර්ම කමිටුව, ධීවර කමිටුව, සමෘද්ධි කමිටුව, මිල කමිටුව, අමා කමිටුව, ශාසනාරක්ෂක බල මණ්ඩලය, දිස්ත්‍රික් වන කමිටුව යන අනු කමිටු 11 න් මෙම කමිටුව සකස් වී ඇත.

අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරන ලද ආර්ථික සංවර්ධන අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා හා බස්නාහිර පලාත් ප්‍රධාන අමාත්‍ය, ගරු ප්‍රසන්න රණතුංග මැතිතුමා ගම්පහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සම සභාපතීත්වය උසුලයි.

ගම්පහ දිස්ත්‍රික් පර්ලිමේන්තු මන්ත්‍රීවරු, පලාත් සභා මන්ත්‍රීවරු, පලාත් පාලන ආයතන ප්‍රධානීන්, දිස්ත්‍රික්යේ සියලු රාජ්‍ය ආයතන හා දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගෙන් මෙම කමිටුව සමන්විත වේ. ගම්පහ දිස්ත්‍රික් ලේකම්, කමිටුවේ ලේකම් වන අතර දිස්ත්‍රික් ක්‍රමසම්පාදන ලේකම් කාර්යාලය, කමිටු ලේකම් කාර්යාලය ලෙස කටයුතු සිදු කරනු ලබයි.

2013 වර්ෂය සඳහා එක් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමක් 2013.03.15 දින පවත්වන ලදී.

2013 වසරේදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ක්‍රියාත්මක ව්‍යාපෘති වල ප්‍රගතිය සහ සංවර්ධන විභවතා පිළිබඳව දීර්ඝ වශයෙන් මෙහිදී සාකච්ඡා කරන ලදී. මෙයට අමතරව කෘෂිකර්මය, වාරිමාර්ග, කර්මාන්ත, ප්‍රවාහන, නගර සංවර්ධන, අධ්‍යාපන, සමාජ සුභසාධනය සහ ආරක්ෂාව යන අංශ පිළිබඳව සාකච්ඡා කර, ඉදිරි සංවර්ධන යෝජනා සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණ ගන්නා ලදී.

## 3.3 ගම්පහ නගර සංවර්ධන වැඩසටහන

ගම්පහ නගර සංවර්ධන වැඩසටහන සඳහා මෙම වර්ෂයේදී ආර්ථික සංවර්ධන අමාත්‍යංශය විසින් රුපියල් මිලියන 18.99 ක් වෙන් කර ඇත. මෙම මුදල් ප්‍රතිපාදන යටතේ ගම්පහ නගරය විධිමත් නගරයක් බවට පත්කිරීම සඳහා 2014 වර්ෂයේදී පහත සඳහන් ව්‍යාපෘති අනුමත කරන ලදී.

- කොළඹ පරණ බස් නැවතුම්පල පිහිටි ස්ථානය ගල් අතුරා සංවර්ධනය කිරීම.
- රෝහල අසල පොදු වැසිකිළි පද්ධතිය සකස් කිරීම.
- මෝලවත්ත අමතර බස් රථගාලේ ගේබියන් වෝල් ඉදි කිරීම
- මෝලවත්ත ජල කාණු පද්ධතිය උඩින් පාලමක් දැමීම

මෙම ව්‍යාපෘති අතරින් කොළඹ පරණ බස් නැවතුම්පළ පිහිටි ස්ථානය ගල් අතුරා සංවර්ධනය කිරීම 2013 වසරේදී නිම කරනු ලැබූ අතර ඉතිරි ව්‍යාපෘති තුන 2014 වසරට අඛණ්ඩ විය.

## 3.4 පලාත් මාර්ග කාපට් කිරීමේ වැටසටහන

ගම්පහ දිස්ත්‍රික්කයේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම කි.මී.25 ක් ආවරණය වන පරිදි 2011 වර්ෂයේදී ආරම්භ කරන ලද පලාත් මාර්ග කාපට් කිරීමේ වැඩසටහන යටතේ කි.මී. 321.56 ක දුර ප්‍රමාණයකින් යුතු ව්‍යාපෘති 161 ව්‍යාපෘති ගැන්වීය.

2011 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා කාලය තුළදී මෙම වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති වෙනුවෙන් රු.මි. 3,394.34 ක් වැය කරන ලද අතර 2013 වර්ෂයට පමණක් රු.මි. 774.54 ක් වැය කර ඇත. 2013 වර්ෂය අවසාන වන විට ව්‍යාපෘති 157 ක් නිම කර ඇත. ව්‍යාපෘති 4 ක් ක්‍රියාත්මක වෙමින් පවතී.

මෙම ව්‍යාපෘති පලාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය මගින් ක්‍රියාත්මක කරනු ලබන අතර අධික්ෂණ ආයතනය ලෙස මාර්ග සංවර්ධන අධිකාරිය කටයුතු කරනු ලබයි.

## 3.5 දිවිනැගුම වැඩසටහන යටතේ ගම්පහ දිස්ත්‍රික්කයේ රැකියා විරහිත කාන්තාවන් සඳහා ඉන්දියානු සාරි එම්බ්‍රොයිඩර් පුහුණු පාඨමාලාව

ගම්පහ දිස්ත්‍රික්කයේ රැකියා විරහිත කාන්තාවන් සඳහා ඉන්දියානු සාරි, කුර්තා බ්ලවුස් හා අබායා එම්බ්‍රොයිඩර් කිරීමේ පාඨමාලාව 2013-03-12 දින ආරම්භ කළ අතර රැකියා විරහිත කාන්තාවන් 48 දෙනෙකු අඛණ්ඩව පුහුණුව සඳහා සහභාගී විය.

ආර්ථික සංවර්ධන අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ උපදෙස් පරිදි මෙම පුහුණු පාඨමාලාව පැවැත්වීම සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් රු. 3,860,750/= ක ප්‍රතිපාදන ලැබුණ අතර මොරගොඩ විමලධර්මසූරිය කණිෂ්ඨ විද්‍යාලයේ ගොඩනැගිලි 2 ක මෙම පුහුණු පාඨමාලාව සාර්ථකව පවත්වන ලදී.

මෙම පුහුණු පාඨමාලාව පැවැත්වීම සඳහා ඉෂාරා ෆැෂන් ගාමන්ට් වෙතින් ඉදිරිපත් කර තිබූ ව්‍යාපෘති වාර්තාව අනුව ඉන්දියානු සාරි මෝස්තර 300 ක් කුර්තා බ්ලවුස් 750 ක් හා අබායා ඇඳුම් 150 ක් මේ වනවිට නිමකර අවසන් කර ඇත.

මෙම පාඨමාලාව මගින් දේශීය සම්ප්‍රදායන්ට ගැලපෙන ආකාරයෙන් කාන්තා සාරි ඇතුළු අත්කම් නිෂ්පාදනය කිරීමට දැනුම ලබා දීම නිසා මෙය ශ්‍රී ලංකාවේ රැකියා විරහිත කාන්තාවන් සඳහා ඉහලම ආදායමක් ලබා දෙන නව ප්‍රවේශයක් ලෙස හඳුන්වා දී තිබේ.

දැනට මෙම පාඨමාලාව සමත්වූවන්ගෙන් 38 දෙනෙකු සිය නිවාසයන්හි අත්කම් රෙදිපිළි හා සාරි මෝස්තර නිර්මාණ ස්වයං රැකියාවක් වශයෙන් කරගෙන යන අතර දෙවන පාඨමාලාව සඳහා පාඨමාලාලාභීන් 50 දෙනෙකු තෝරාගෙන ඇත.

## 3.6 ගමනැගුම සංවර්ධන වැඩසටහන

**<u>එක් ගමකට එක් වැඩක් අවිච්ඡේද ව්‍යාපෘති - 2013</u>**

ජාතික සවිය ගම නැගුම සංවර්ධන වැඩසටහන යටතේ 2012 වර්ෂයේ ගම්පහ දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කළ ව්‍යාපෘති 96 ක් 2013 වර්ෂයට අවිච්ඡේද කරන ලදි.

මෙම ව්‍යාපෘති 96 සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් රුපියල් මිලියන 77.650 ක මුදලක් වෙන්කරන ලදි. 2013-12-31 වන විට එම ව්‍යාපෘති 96 න් ව්‍යාපෘති 89 ක වැඩ කටයුතු අවසන් කර රුපියල් මිලියන 66.42 ක මුදලක් ගෙවා ඇත.

**එක් ගමකට එක් වැඩක් අවිච්ඡේද ව්‍යාපෘති අංශ අනුව වර්ගීකරණය**

| අනු අංකය | අංශය | ව්‍යාපෘති සංඛ්‍යාව | අවිච්ඡේද මුදල රු.මි. | ගෙවූ මුළු මුදල රු.මි. |
|---|---|---|---|---|
| 1 | මාර්ග, පාලම්, බෝක්කු | 60 | 51.416 | 44.983 |
| 2 | ජල සම්පාදන | 4 | 0.814 | 0.4863 |
| 3 | සුළු වාරිමාර්ග | 1 | 1.547 | 0.82 |
| 4 | මාතෘ නිවාස | 0 | 0 | 0 |
| 5 | පෙර පාසල් | 1 | 0.374 | 0.351 |
| 6 | විදුලිය | 0 | 0 | 0 |
| 7 | ගොඩනැගිලි | 24 | 19.023 | 16.42 |
| 8 | ක්‍රීඩා පහසුකම් | 5 | 4.159 | 3.0758 |
| 9 | සෞඛ්‍ය/සනීපාරක්ෂක පහසුකම් | 0 | 0 | 0 |
| 10 | වෙනත් | 1 | 0.285 | 0.285 |
| | **එකතුව** | **96** | **77.618** | **66.4211** |



මීට අමතරව එක් ගමකට එක් වැඩක් අවිච්ඡේද ඉතිරි මුදල් වලින් ගම්පහ දිස්ත්‍රික්කයේ හඳුනාගත් අත්‍යාවශ්‍ය සංවර්ධන ව්‍යාපෘති 15 ක් ක්‍රියාත්මක කර ඒ සඳහා රුපියල් මිලියන 7.82 ක මුදලක් වියදම් කරන ලදි.

## 3.7 දත්ත තොරතුරු හා මෙහෙයුම් මැදිරිය

ගම්පහ දිස්ත්‍රික්කයට අදාල දත්ත තොරතුරු දිස්ත්‍රික් ක්‍රමසම්පාදන ලේකම් කාර්යාලය මගින් එක් රැස් කරනු ලබන අතර, වාර්ෂිකව මෙම තොරතුරු යාවත්කාලීන කරනු ලැබේ.

ජනගහනය ,අධ්‍යාපනය, සෞඛ්‍යය, කෘෂිකර්මය, ආර්ථික කටයුතු, සංවර්ධන වැඩසටහන්, මාර්ග, සංස්කෘතික,මැතිවරණ, සුභ සාධන කටයුතු, ප්‍රදේශයේ භූවිෂමතා ලක්ෂණ, ස්වභාවික සම්පත්, කර්මාන්ත ආදී විවිධ අංශයන් යටතේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් දත්ත තොරතුරු රැස් කරනු ලැබේ.

යාවත්කාලීන කළ දත්ත තොරතුරු ඇතුලත් දිස්ත්‍රික් සම්පත් පැතිකඩ දත්ත තොරතුරු සංග්‍රහය සකස් කර ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.

දිස්ත්‍රික්කයේ සියලුම පාසල් හා පිරිවෙන් පිළිබඳ තොරතුරු පද්ධතියක් හා දිස්ත්‍රික්කයේ රෝහල් පිළිබඳ දත්ත පද්ධතියක් සංවර්ධන කටයුතු හඳුනා ගැනීම සඳහා සකස් කරන ලදී.



## 3.8 ප්‍රාථමික පාසල් 5000 ක් ද්විතීක පාසල් 1000 ක් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2013

රජයේ සංවර්ධන ප්‍රතිපත්ති රාමුව වන මහින්ද චින්තන ඉදිරි දැක්ම අනුව ශ්‍රී ලංකාව ගෝලීය වශයෙන් වැදගත් ආර්ථික කේන්ද්‍රස්ථානයක් බවට පත් කර ගැනීම හා දැනුම කේන්ද්‍රීය සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ද්විතීය පාසල් දහසක් හා ප්‍රාථමික පාසල් 5000 ක් සංවර්ධනය කිරීමේ ජාතික වැඩසටහන යටතේ ගම්පහ දිස්ත්‍රික්කයේ තෝරාගත් ප්‍රාථමික පාසල් 84 ක ක්‍රියාත්මක විය. මෙම වැඩ සටහන යටතේ එක් පාසලක් සඳහා රජයේ දායකත්වය ලෙස රුපියල් ලක්ෂ 5 ක් වෙන්විය. එහිදී අපේක්ෂිත සංවර්ධන ක්‍රියාකාරකම් ලෙස පහත අංශ කෙරේ අවධානය යොමු කරන ලදී.

- විදුලිබල පහසුකම් සැපයීම
- ජල පහසුකම් සැපයීම
- කැසිකිළි හා සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනය
- පාසල් ආරක්ෂිත වැට හා ගේට්ටු සකස් කිරීම
- පවතින ගොඩනැඟිලි අලුත්වැඩියා කිරීම හා තීන්ත ආලේපනය
- පාසල් භූමිය ආදර්ශමත් ගෙවතු වගාවක් බවට පත් කිරීම
- පාසලේ නාමපුවරුව සකස් කිරීම
- පළමු වසර සිසුන්ගේ ක්‍රියාකාරකම් සඳහා කාමරයක් විධිමත් පරිදි සකස් කිරීම
- ළමා සෙල්ලම් මිදුල සකස් කිරීම
- දැනට භාවිතයේ ඇති ගුරු නිවාසයක් ඇත්නම් එහි අත්‍යාවශ්‍ය අළුත්වැඩියාවන් පමණක් සිදු කිරීම





| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව | ඇස්තමේන්තු මුදල රු. | ප්‍රජා දායකත්වය රු. | රජයේ දායකත්වය රු. | සම්පූර්ණ ව්‍යාපෘති සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | සංඛ්‍යාව | මුදල රු. |
| 1 | දිවුලපිටිය | 6 | 4,671,743.55 | 1,671,743.55 | 3,000,000.00 | 6 | 3,000,000.00 |
| 2 | කටාන | 10 | 7,045,721.00 | 2,045,721.00 | 5,000,000.00 | 10 | 5,000,000.00 |
| 3 | මීනුවන්ගොඩ | 10 | 7,971,702.69 | 2,971,702.69 | 5,000,000.00 | 10 | 5,000,000.00 |
| 4 | මීරිගම | 4 | 2,568,690.00 | 568,690.00 | 2,000,000.00 | 4 | 2,000,000.00 |
| 5 | අත්තනගල්ල | 12 | 8,292,400.45 | 2,292,400.45 | 6,000,000.00 | 12 | 6,000,000.00 |
| 6 | ගම්පහ | 12 | 9,095,907.00 | 3,095,907.00 | 6,000,000.00 | 12 | 5,911,735.00 |
| 7 | ජා-ඇල | 8 | 8,200,500.00 | 4,200,500.00 | 4,000,000.00 | 8 | 4,000,000.00 |
| 8 | මහර | 5 | 3,465,332.55 | 965,332.55 | 2,500,000.00 | 5 | 2,468,991.30 |
| 9 | දොම්පෙ | 8 | 6,473,764.25 | 2,473,764.25 | 4,000,000.00 | 8 | 3,859,348.88 |
| 10 | බියගම | 7 | 4,950,418.85 | 1,450,418.85 | 3,500,000.00 | 7 | 3,500,000.00 |
| 11 | කැලණිය | 2 | 1,738,541.00 | 738,541.00 | 1,000,000.00 | 2 | 1,000,000.00 |
| | එකතුව | 84 | 64,474,721.34 | 22,474,721.34 | 42,000,000.00 | 84 | 41,740,075.18 |



## විශේෂ ව්‍යාපෘති

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ ගම්පහ යශෝදරා දේවි බාලිකා විද්‍යාලයේ U හැඩති ගොඩනැඟිල්ල ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 37.0 ක් හා පැසිපන්දු ක්‍රීඩාපිටිය ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 2.5 ක් වෙන් කරන ලදී.

### U හැඩති ගොඩනැඟිල්ල





### පැසිපන්දු ක්‍රීඩාපිටිය





## 3.9 ගම්පහ දිස්ත්‍රික් වාර්ෂික ඒකාබද්ධ ක්‍රියාත්මක වැඩසටහන - 2013

ගම්පහ දිස්ත්‍රික් පරිපාලන බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වන සියලුම සංවර්ධන ව්‍යාපෘතීන් පිළිබඳ තොරතුරු එක්රැස් කොට, එකම වැඩසටහනක් යටතේ සංගෘහිත කිරීම මෙම සැලැස්ම මගින් ඉටු කරනු ලබයි.

දිස්ත්‍රික් වාර්ෂික ඒකාබද්ධ ක්‍රියාත්මක වැඩසටහන සකස් කිරීමේ දී දිස්ත්‍රික්කයට අරමුදල් ලැබෙන මූලා ප්‍රභවයන් 6 ක් යටතට ඇතුළත් කර සැලැස්ම සකස් කර ඇත. ඊට අදාළ ව්‍යාපෘති සම්බන්ධීකරණය කර මෙහෙයුම් කටයුතු අවශ්‍ය ආකාරයෙන් සිදු කිරීම සඳහා එක් එක් අරමුදල් ප්‍රභවයන් යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති අංශ 7 ක් යටතට ඇතුළත් කර පහත සඳහන් පරිදි දක්වා ඇත.

| මුදල් ලැබෙන ප්‍රභවය | ආංශික වර්ගීකරණය |
|---|---|
| 1. විමධ්‍යගත අරමුදල් | 1. කෘෂිකර්මය |
| 2. මධ්‍යම රජයේ රේඛීය අරමුදල් | 2. කර්මාන්ත හා වෙළෙඳාම |
| 3. පළාත් සභා අරමුදල් | 3. මානව ජනාවාස |
| 4. පළාත් පාලන ආයතන අරමුදල් | 4. ආර්ථික යටිතල පහසුකම් |
| 5. විශේෂ ව්‍යාපෘති (විදේශාධාර ඇතුළුව) | 5. ප්‍රවාහන පහසුකම් |
| 6. ව්‍යවස්ථාපිත මණ්ඩල අරමුදල් | 6. සමාජ යටිතල පහසුකම් |
| | 7. පරිපාලන පොදු කාර්යය |

දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන සියලුම සංවර්ධන ව්‍යාපෘතීන් හා වැඩසටහන් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව මගින් සම්බන්ධීකරණය හා මෙහෙයුම් කිරීම සඳහා මෙම සැලැස්ම උපයෝගී කරගනු ලැබේ. එසේම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සිදු කරනු ලබන සංවර්ධන ව්‍යාපෘතීන් සම්බන්ධීකරණය හා මෙහෙයුම් කිරීම ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු මගින් සිදු කරනු ලබයි.

## 2013 දිස්ත්‍රික් වාර්ෂික ඒකාබද්ධ ක්‍රියාත්මක වැඩසටහන හතර වන කාර්තුව අවසානයට වාර්තා වී ඇති තොරතුරු අනුව ප්‍රතිපාදන හා වියදම බෙදී යාම

**1.** ආංශික වර්ගීකරණයට අනුව බෙදීයාම

| අනු අංක | ආංශික වර්ගීකරණය | ව්‍යාපෘති සංඛ්‍යාව | ප්‍රතිපාදන මුදල රුපියල් මිලියන | වියදම රු.මි. |
|---|---|---|---|---|
| 1 | කෘෂිකර්මය | 169 | 434 | 309 |
| 2 | කර්මාන්ත සංචාරක කටයුතු හා වෙළදාම | 694 | 1248 | 387 |
| 3 | මානව ජනාවාස | 1111 | 605 | 434 |
| 4 | ආර්ථික යටිතල පහසුකම් | 263 | 60 | 20 |
| 5 | ප්‍රවාහනය | 2433 | 35745 | 30714 |
| 6 | සමාජ යටිතල පහසුකම් | 2904 | 1938 | 1402 |
| 7 | පරිපාලන පොදු කාර්යය | 334 | 566 | 258 |
| | එකතුව | 7908 | 40596 | 33524 |



**2.** අරමුදල් මූලාශ්‍ර අනුව බෙදීයාම

| අනු අංකය | අරමුදල් ප්‍රභවය | ව්‍යාපෘති සංඛ්‍යාව | ප්‍රතිපාදන (රු.මි.) | වියදම (රු.මි.) |
|---|---|---|---|---|
| 1 | විමධ්‍යගත අයවැය | 752 | 98 | 96 |
| 2 | රේඛීය අමාත්‍යාංශය (ආර්ථික සං. අමා. හැර) | 909 | 18231 | 14280 |
| 3 | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 221 | 2792 | 1510 |
| 4 | සමෘද්ධි අධිකාරිය | 37 | 1 | 1 |
| 5 | පළාත් සභා | 4248 | 1655 | 1441 |
| 6 | පළාත් පාලන ආයතන | 1502 | 601 | 392 |
| 7 | විදේශාධාර හා විශේෂ | 5 | 16345 | 15339 |
| 8 | ව්‍යවස්ථාපිත මණ්ඩල | 234 | 873 | 465 |
| එකතුව | | **7908** | **40596** | **33524** |

**3.** ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව බෙදීම

| අනු අංක | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ව්‍යාපෘති සංඛ්‍යාව | ප්‍රතිපාදන මුදල (රු.මි.) | වියදම (රු.මි.) |
|---|---|---|---|---|
| 1 | දිවුලපිටිය | 203 | 161 | 36 |
| 2 | කටාන | 157 | 272 | 145 |
| 3 | මීගමුව | 68 | 543 | 116 |
| 4 | මිනුවන්ගොඩ | 410 | 1479 | 194 |
| 5 | මීරිගම | 172 | 351 | 62 |
| 6 | අත්තනගල්ල | 312 | 2061 | 1530 |
| 7 | ගම්පහ | 358 | 830 | 391 |
| 8 | ජා ඇල | 137 | 293 | 134 |
| 9 | වත්තල | 210 | 570 | 354 |
| 10 | මහර | 281 | 281 | 172 |
| 11 | දොම්පේ | 176 | 523 | 229 |
| 12 | බියගම | 257 | 821 | 235 |
| 13 | කැලණිය | 72 | 907 | 410 |
| 14 | පොදු (පළාත් සභා ව්‍යාපෘති ඇතුළත්ව) | 5095 | 31505 | 29515 |
| එකතුව | | **7908** | **40596** | **33524** |

## 3.10 පශු සම්පත් හා ගෘහ කර්මාන්ත සංවර්ධන අංශය

- **කිරි නිෂ්පාදනය වැඩිදියුණු කිරීමේ වැඩසටහන**

  පශු සම්පත් සංවර්ධන වැඩසටහන යටතේ මෙම වර්ෂය තුළ ගම්පහ දිස්ත්‍රික්කයේ කිරි ගොවීන් 29 දෙනෙකු සඳහා කිරි ගවයින් 29 දෙනෙකුද, එක් ගව ගාලක් ද, කිරි ගව පාලනයේ නිරත ගොවීන් 8 දෙනෙකු සඳහා තණකොල කපන මැෂින් 8 ක් ද, එක් හරිතාගාරයක් ද, ලබාදෙන ලදි. මේ සඳහා වැයකළ මුදල රුපියල් 10,96,600 කි.

- **ගෘහ කර්මාන්ත වැඩසටහන**

  විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය මෙහෙයවීම යටතේ විවිධ ක්ෂේත්‍රයන් යටතේ පුහුණුව ලැබූ ගෘහ කර්මාන්තකරුවන් 145 දෙනෙකු සඳහා සාර්ථක ක්ෂේත්‍ර පුහුණුවක් ලබාදීමෙන් අනතුරුව නව ගෘහ කර්මාන්ත වැඩි දියුණු කර ගැනීම සඳහා අවශ්‍ය උපකරණ හා අමුද්‍රව්‍ය මේ යටතේ ලබාදෙන ලදි. එහිදී ප්‍රතිලාභීන් 145 දෙනෙකු සඳහා වැය කළ මුදල රුපියල් 1,400,099 කි.

- **ව්‍යවසායකත්ව ගම්මාන වැඩසටහන**

  ප්‍රදේශ පාදක සම්පත් භාවිතයට ගනිමින් පිහිටුවන ලද ව්‍යවසායකත්ව ගම්මාන වැඩසටහන යටතේ මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බෝධිපිහිටුවල කලුගල් නිෂ්පාදන ගම්මානයේ ප්‍රතිලාභීන් 52 ක් සඳහා රුපියල් 602,112.00 මුදලක් වැයකර 2012 වර්ෂය සඳහා උපකරණ ලබාදෙන ලදි. මෙම ව්‍යාපෘතියේ තවදුරටත් ගෙවිය යුතු රුපියල් 117,082 ක මුදල, 2013 වර්ෂයේදී ගෙවන ලදි.

- **විශේෂ ව්‍යාපෘති**

  මේ යටතේ ගම්පහ දිස්ත්‍රික්කයේ අත්තනගල්ල, මීරිගම හා දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය කරමින් විශේෂ ව්‍යාපෘති 5 ක් ක්‍රියාත්මක කරන ලදී. එහිදී වැයකළ මුදල රුපියල් 7,397,781 කි.

## 3.11 විමධ්‍යගත අයවැය ක්‍රියාත්මක වැඩසටහන - ගම්පහ දිස්ත්‍රික්කය

පාර්ලිමේන්තු මැති ඇමතිවරු විසින් ගම්පහ දිස්ත්‍රික්කය සඳහා ඉදිරිපත් කරන ලද ව්‍යාපෘතින්ට අදාලව 2013 වර්ෂයේ විමධ්‍යගත අයවැය සැලැස්ම, 2013.06.15 දින, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් අනුමත කර එවන ලදි. ගම්පහ දිස්ත්‍රික්කය සඳහා තේරි පත්වූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 18 දෙනා සඳහා රු. මිලියන 5 බැගින් රුපියල් මිලියන 90 ක් ද, ජාතික ලැයිස්තු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 7 දෙනෙකු සඳහා රු. මිලියන 10.45 ක් ද වශයෙන්, 2013 වර්ෂය සඳහා රුපියල් මිලියන 100.45 ක ප්‍රතිපාදන වෙන්වන ලදි. එයින් රුපියල් මිලියන 97.51 ක වටිනාකමින් යුතු ව්‍යාපෘති 752ක් ගම්පහ දිස්ත්‍රික්කය පුරා ක්‍රියාත්මක වූ අතර, රුපියල් මිලියන 95.87 ක් වැය කර ව්‍යාපෘති 751 ක වැඩ අවසන් කරන ලදි. කැලණිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ එක් ව්‍යාපෘතියක් පමණක් අවලංගු විය.

| අනු අංක | ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව | අනුමත මුදල රු. | මූල්‍ය ප්‍රගතිය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | මුදල් ගෙවූ ව්‍යාපෘති සංඛ්‍යාව | ගෙවූ මුදල රු. | පුනරාවර්ථන වියදම රු. | මුළු වියදම රු. |
| **1** | දිවුලපිටිය | 48 | 3,735,700.00 | 48 | 3,662,275.00 | 104,678.00 | 3,766,953.00 |
| **2** | කටාන | 38 | 3,627,950.00 | 38 | 3,609,966.00 | 114,676.00 | 3,724,642.00 |
| **3** | මීගමුව | 37 | 6,144,750.00 | 37 | 5,928,418.00 | 92,345.00 | 6,020,763.00 |
| **4** | මිනුවන්ගොඩ | 55 | 7,311,250.00 | 55 | 7,239,930.00 | 105,526.00 | 7,345,756.00 |
| **5** | මීරිගම | 92 | 12,195,000.00 | 92 | 12,008,713.00 | 180,131.00 | 12,188,844.00 |
| **6** | අත්තනගල්ල | 76 | 9,129,850.00 | 76 | 8,875,525.00 | 133,132.00 | 9,008,657.00 |
| **7** | ගම්පහ | 81 | 11,547,600.00 | 81 | 11,535,260.00 | 306,954.00 | 11,842,214.00 |
| **8** | ජා ඇල | 46 | 9,403,500.00 | 46 | 9,309,972.00 | 179,650.00 | 9,489,622.00 |
| **9** | වත්තල | 56 | 6,347,200.00 | 56 | 6,162,555.30 | 152,825.00 | 6,315,380.30 |
| **10** | මහර | 47 | 5,278,800.00 | 47 | 5,227,162.00 | 102,869.00 | 5,330,031.00 |
| **11** | දොම්පෙ | 45 | 4,633,533.00 | 45 | 4,608,598.00 | 68,402.00 | 4,677,000.00 |
| **12** | බියගම | 62 | 6,052,467.00 | 62 | 5,921,042.00 | 66,781.00 | 5,987,823.00 |
| **13** | කැලණිය | 49 | 3,952,000.00 | 48 | 3,788,519.00 | 9,6591.00 | 3,885,110.00 |
| **14** | දිස්ත්‍රික් ලේකම් | 20 | 8,150,250.00 | 20 | 7,991,925.00 | 130,955.00 | 8,122,880.00 |
| | එකතුව | **752** | **97,509,850.00** | **751** | **9,5869,860.30** | **1,835,815.00** | **97,705,775.30** |

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පරිපාලන වියදම රු. 1,421,733.34 කි. ඒඅනුව 2013 වර්ෂයේ විමධ්‍යගත අයවැය වැඩසටහනේ මුළු වියදම රු. 99,056,426.34 කි.

**විමධ්‍යගත අයවැය ක්‍රියාත්මක වැඩසටහන**



## 3.12 ළමා හා මාතෘ සායන සංවර්ධනය කිරිම.

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ සෘජු ප්‍රතිපාදන මගින්, 2010 වර්ෂයේ සිට අදියර තුනක් යටතේ ක්‍රියාත්මක වූ ළමා හා මාතෘ සායන සංවර්ධනය කිරිමේ වැඩසටහනට අනුව, ළමා හා මාතෘ සායන ඉදිකිරිම් හා ප්‍රතිසංස්කරණය කිරිම් 58 ක් සිදු කර ඇත.

2013.12.31 දින වන විට, ඉන් ව්‍යාපෘති 55 ක වැඩ අවසන් කර ව්‍යාපෘති 3 ක් ක්‍රියාත්මක තත්ත්වයේ පවති. ඉදිරියේදි පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කිරිමට නියමිතව ඇත.

1. මාලදෙණිය සායනය
2. යටියන සායනය
3. වැල්ලවිලමුල්ල සායනය
4. කීනගම සායනය

මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම සඳහා රු.780,115.683 ක මුදලක් වෙන් කර ඇති අතර, 2013.12.31 දින වන විට, රු. 425.844.880 ක මුදලක් වැයකර ඇත.

### සතිපොළ සංවර්ධන වැඩසටහන

2012 වර්ෂයේ සිට, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ වෙන් වූ ප්‍රතිපාදන මඟින් සතිපොළ සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක වන අතර, සතිපොළ 24 ක් සංවර්ධනය කිරිම සඳහා රු. මිලියන 1812.66 ක මුදලක් වෙන්වී ඇත. එයින් සතිපොළ 9 ක වැඩ අවසන් වී ඇත. සතිපොළ 11 ක වැඩ ක්‍රියාත්මක තත්වයේ පවතින අතර, 4 ක වැඩ මේ වන විට ආරම්භ කර නැත. 2013.12.31 දින වන විට සතිපොළ සංවර්ධනය සඳහා රු. මිලි 694.06 ක මුදලක් වැයවී ඇත.

### ශරීර සුවතා මංතිරු

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ සෘජු ප්‍රතිපාදන යටතේ 2011 වර්ෂයේ සිට ක්‍රියාත්මක වූ ශරිර සුවතා මංතීරු සකස් කිරිමේ වැඩසටහන යටතේ , පහත සඳහන් මංතීරු 06 හි වැඩ අවසන් කර ඇත. ඒ සඳහා රු. මිලියන 434,77 ක මුදලක් වෙන්වි ඇති අතර , 2013.12.31දින වන විට රු.මිලියන 208,44 ක මුදලක් වැය කර ඇත.

1. වත්තල කළු ඇළ මංතීරුව
2. උඩුගම්පල මංතීරුව
3. කිරිබත්ගොඩ මුදුන් ඇළ මංතීරුව
4. සියඹලාපෙ මංතීරුව
5. දලුපිටිය මුදුන් ඇල මංතීරුව
6. ඔරුතොට කළු පාලම මංතීරුව

# 4. දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලය

## 4.1 සමෘද්ධි වැඩසටහන 2013

| සංවර්ධන ව්‍යාපෘති | | |
|---|---|---|
| වැඩසටහන | ව්‍යාපෘති ගණන | මුදල (රුපියල් මිලියන) |
| ජීවනෝපාය සංවර්ධනය (චක්‍රීය අරමුදල) | 2,577 | 102.65 |
| අර්ධ ගෙවීමේ ක්‍රමයට මහන මැෂින් ලබාදීම | 315 | 5.37 |
| බැංකු ගොඩනැගිලි ඉදිකිරීම් | 17 | 9.16 |
| නිවාස වැඩසටහන | 52 | 2.45 |
| එකතුව | 2,961 | 119.63 |
| | | |
| සමාජ ආරක්ෂණ/ සිප්දොර ශිෂ්‍යත්ව | | |
| ප්‍රතිලාභ ගෙවීම | සංඛ්‍යාව | ගෙවූ මුදල (රුපියල් මිලියන) |
| මරණ | 2,217 | 22.77 |
| උපත් | 465 | 2.32 |
| රෝහල් | 1,997 | 5.99 |
| විවාහ | 1,606 | 8.05 |
| එකතුව | 6,285 | 39.13 |
| සිප්දොර ශිෂ්‍යත්ව | 450 | 9.37 |
| | | |
| සමෘද්ධි සහනාධාර/ පෝෂණ වැඩසටහන | | |
| වැඩසටහන | ප්‍රතිලාභ ලැබූ පවුල් සංඛ්‍යාව | වාර්ෂික වැය කළ මුදල (රුපියල් මිලියන) |
| සමෘද්ධි සහනාධාර | 119,351 | 1,048.99 |
| පෝෂණ වැඩසටහන | 2,564 | 9.59 |

## 4.2 දිවිනැගුම වැඩසටහනට සමගාමීව ක්‍රියාත්මක වු ජීවනෝපාය සංවර්ධන වැඩසටහන

දිවිනැගුම වැඩසටහනට සමගාමීව ක්‍රියාත්මක වු ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ චක්‍රිය අරමුදල මඟින් කෘෂි ව්‍යාපෘති 245 ක් සඳහා රුපියල් මිලියන 8.75 ක් ද, සත්ත්ව පාලන ව්‍යාපෘති 251 ක් සඳහා රුපියල් මිලියන 10.87ක් ද, අලෙවි හා සේවා ව්‍යාපෘති 797 ක් සඳහා රුපියල් මිලියන 31.62 ක් හා කර්මාන්ත ව්‍යාපෘති 1284 ක් සඳහා රුපියල් මිලියන 51.42 ක් වැය කරන ලදි. (ආකෘති පත්‍ර 01 )

<u>**අර්ධ ගෙවීමේ ක්‍රමය යටතේ දිස්ත්‍රික්කයේ ස්වයංරැකියා ලාභීන් සඳහා මහන මැෂින් ලබාදීම**</u>

ගම්පහ දිස්ත්‍රික්කයේ ඇඟළුම් කර්මාන්තයේ නිරත දිරිය කාන්තාවන් සඳහා අර්ධ ගෙවීමේ ක්‍රමය යටතේ ජුකි මැෂින් 250 ක්, ඕවර්ලොක් මැෂින් 56 ක්, සාමාන්‍ය මැෂින් 04 ක්, සිග්සැග් මැෂින් 02 ක් සහ පැඩ්ලොක් මැෂින් 03 ක් ලෙස මැෂින් 350 ක් ලබාදෙන ලදි. මේ සඳහා වැය කරන ලද මුදල රුපියල් මිලියන 5.4 කි. (ආකෘති පත්‍ර අංක : 02 )

## 4.3 සමාජ සංවර්ධන වැඩසටහන

- <u>**දිරිය පියස නිවාස වැඩසටහන**</u>

2013 වර්ෂයේදී දිරිය පියස නිවාස වැඩසටහන යටතේ නිවාස 52 ක් ඉදි කරන ලදි. ඒ සඳහා සමෘද්ධි අධිකාරිය යටතේ රුපියල් මිලියන 0.85 ක් සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ රුපියල් මිලියන 1.60 ක් වැය කරන ලද අතර, මෙම වැඩසටහනට වැය කළ මුළු මුදල රුපියල් මිලියන 2.45 කි. (ආකෘති අංක 03 හා 04 )

- <u>**සමෘද්ධි බැංකු වැඩසටහන**</u>

| සමෘද්ධි බැංකු වැඩසටහන (2013.12.31 දක්වා සමුච්ඡිත) | | |
|---|---|---|
| වැඩසටහන | සංඛ්‍යාව | මුදල (රුපියල් මිලියන) |
| තැන්පතු ( සමුච්ඡිත ) | 1,129,887 | 5,355.65 |
| ණය මුදාහැරීම | 548,115 | 11,928.64 |
| ආයෝජන | | 5,078.06 |
| සමෘද්ධි බැංකු සංගම් හා මහා සංගම් ලාභය | | 347.78 |

- <u>බැංකු වැඩසටහන</u>

දිස්ත්‍රික්කයේ සමෘද්ධි බැංකු සංගම් 86 මගින් ප්‍රතිලාභීන්ගේ තැන්පතු ඒකරාශීකරණය හා ණය ලබාදීම සිදු කරන ලද අතර , 2013.12.31 දින වන විට සමෘද්ධි බැංකු සංගම් සතු මුළු තැන්පතු මුදල රුපියල් මිලියන 5,355.6 වන අතර, නිකුත් කර ඇති මුළු ණය මුදල රුපියල් මිලියන 11,928.64 කි. 2013 වර්ෂය තුළ සමෘද්ධි බැංකු සංගම් මඟින් රුපියල් මිලියන 2,318.41 ක් ණය වශයෙන් මුදා හල අතර, නිකුත් කළ ණය සංඛ්‍යාව 58,353 කි. 2013.12.31 දිනට සමෘද්ධි බැංකු සංගම් මඟින් රාජ්‍ය බැංකු වල ආයෝජනය කළ මුදල රුපියල් මිලියන 5,078.06 කි. තවද, 2013 වර්ෂය තුළ සමෘද්ධි බැංකු සංගම් සහ මහා සංගම් උපයා ගත් ලාභය රුපියල් මිලියන 347.78 කි.

- **<u>සමෘද්ධි බැංකු සංගම් ඉදිකිරීම් හා අළුත්වැඩියා</u>**

සමෘද්ධි බැංකු සංගම් 17 ක ඉදිකිරීම් හා අළුත් වැඩියා කටයුතු සඳහා රුපියල් මිලියන 9.16 ක් වැය කරන ලදි. (ආකෘති පත්‍ර අංක 05)

## 4.4 සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

මෙම වසරේදී සමෘද්ධි සහනාධාර වැඩසටහන සඳහා රුපියල් මිලියන 1,048.99 ක් ද, සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ සඳහා රුපියල් මිලියන 48.5 ක් වැය කරන ලදි. මීට අමතරව පෝෂණ වැඩසටහන සඳහා රු. මිලියන 9.59 ක් වැය කරන ලදී. ( ආකෘති අංක 06 හා 07 සහ 08 )

**කාර්ය මණ්ඩලය - සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

| | | |
|---|---|---|
| සමෘද්ධි සහකාර කොමසාරිස්/දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂ | - | 01 |
| ප්‍රවර්ධන නිලධාරි | - | 01 |
| සංවර්ධන නිලධාරි | - | 03 |
| කළමනාකරණ සහකාර | - | 12 |
| රියදුරු/කාර්යාල කාර්ය සහායක | - | 02 |
| | | 19 |

**ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය**

| | | |
|---|---|---|
| සමෘද්ධි සම්බන්ධිකරණ නිලධාරි | - | 01 |
| සමෘද්ධි කළමනාකරු | - | 138 |
| සමෘද්ධි කළමනාකරු (විගණන) | - | 06 |
| අධීක්ෂණ කළමනාකරු | - | 05 |
| විගණන නිලධාරි | - | 04 |
| අධික්ෂණ නිලධාරි | - | 02 |
| සමෘද්ධි ලිපිකරු | - | 06 |
| සමෘද්ධි සංවර්ධන නිලධාරි | - | 1,689 |
| රියදුරු | - | 00 |
| කාර්යාල කාර්ය සහායක | - | 01 |
| | | 1,852 |

## 2013 වර්ෂයේ චක්‍රීය අරමුදල මගින් ක්‍රියාත්මක කරන ලද ජීවනෝපාය ව්‍යාපෘති

| ගම්පහ දිස්ත්‍රික්කය | | | | | | | | ආකෘති අංක 01 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අනු අංක | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | කෘෂි | | සත්ත්ව පාලන | | අලෙවි හා සේවා | | කර්මාන්ත | | එකතුව | |
| | | සංඛ්‍යාව | මුදල රු. | සංඛ්‍යාව | මුදල රු. | සංඛ්‍යාව | මුදල රු. | සංඛ්‍යාව | මුදල රු. | සංඛ්‍යාව | මුදල රු. |
| 1 | අත්තනගල්ල | 58 | 2,363,822 | 41 | 1,875,000 | 159 | 7,058,447 | 166 | 7,610,203 | 424 | 18,907,472 |
| 2 | බියගම | 1 | 30,000 | 0 | 0 | 22 | 529,500 | 90 | 3,027,280 | 113 | 3,586,780 |
| 3 | දිවුලපිටිය | 45 | 1,357,049 | 95 | 3,710,000 | 80 | 2,933,000 | 128 | 4,545,654 | 348 | 12,545,703 |
| 4 | දොම්පේ | 34 | 1,277,190 | 20 | 935,000 | 67 | 2,657,499 | 163 | 6,334,276 | 284 | 11,203,965 |
| 5 | ගම්පහ | 16 | 647,500 | 3 | 150,000 | 68 | 2,513,000 | 210 | 8,439,500 | 297 | 11,750,000 |
| 6 | ජා ඇල | 7 | 310,000 | 16 | 730,000 | 61 | 2,708,000 | 44 | 1,893,160 | 128 | 5,641,160 |
| 7 | කටාන | 9 | 385,000 | 18 | 820,000 | 31 | 1,186,500 | 62 | 2,375,060 | 120 | 4,766,560 |
| 8 | කැළණිය | 0 | 0 | 1 | 50,000 | 13 | 543,348 | 49 | 1,959,066 | 63 | 2,552,414 |
| 9 | මහර | 22 | 557,500 | 8 | 270,000 | 77 | 3,019,199 | 46 | 1,668,500 | 153 | 5,515,199 |
| 10 | මීරිගම | 25 | 1,064,500 | 10 | 450,000 | 79 | 3,150,450 | 175 | 6,996,250 | 289 | 11,661,200 |
| 11 | මිනුවන්ගොඩ | 24 | 554,918 | 12 | 520,000 | 58 | 2,132,770 | 92 | 4,118,795 | 186 | 7,326,483 |
| 12 | මීගමුව | 2 | 100,000 | 18 | 1,050,000 | 44 | 1,992,280 | 22 | 1,008,000 | 86 | 4,150,280 |
| 13 | වත්තල | 2 | 100,000 | 9 | 310,000 | 38 | 1,195,499 | 37 | 1,440,000 | 86 | 3,045,499 |
| | එකතුව | 245 | 8,747,479 | 251 | 10,870,000 | 797 | 31,619,492 | 1,284 | 51,415,744 | 2,577 | 102,652,715 |

අර්ධ ගෙවිමේ ක්‍රමය යටතේ දිස්ත්‍රික්කයේ ස්වයං රැකියාලාභීන් සඳහා මහන මැෂින් ලබාදීම (2013.12.31 දිනට ප්‍රගතිය)

ගම්පහ දිස්ත්‍රික්කය ආකෘති අංක : 02

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ලබාදී ඇති මුළු මැෂින් ගණන | මැෂින් වර්ගය | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | ජුකී | ඕවර්ලොක් | | සාමාන්‍ය | සිග්සැග් | පැඩ්ලොක් |
| | | | | නූල් 4 | නූල් 5 | | | |
| 1 | අත්තනගල්ල | 20 | 18 | 1 | 0 | 0 | 1 | 0 |
| 2 | බියගම | 21 | 18 | 3 | 0 | 0 | 0 | 0 |
| 3 | දිවුලපිටිය | 27 | 19 | 4 | 0 | 3 | 0 | 1 |
| 4 | දොම්පේ | 19 | 16 | 2 | 1 | 0 | 0 | 0 |
| 5 | ගම්පහ | 111 | 92 | 14 | 3 | 0 | 1 | 1 |
| 6 | ජා-ඇල | 17 | 11 | 4 | 2 | 0 | 0 | 0 |
| 7 | කටාන | 9 | 4 | 4 | 0 | 0 | 0 | 1 |
| 8 | මහර | 26 | 19 | 5 | 1 | 1 | 0 | 0 |
| 9 | මීරිගම | 14 | 10 | 4 | 0 | 0 | 0 | 0 |
| 10 | මිනුවන්ගොඩ | 43 | 35 | 8 | 0 | 0 | 0 | 0 |
| 11 | වත්තල | 8 | 8 | 0 | 0 | 0 | 0 | 0 |
| එකතුව | | 315 | 250 | 49 | 7 | 4 | 2 | 3 |

මෙම වැඩසටහන සඳහා වැය කරන ලද මුදල රු. 5,369,825

## දිරිය පියස නිවාස වැඩසටහන - 2013

ආකෘති අංක 03

| වැඩසටහන | සංඛ්‍යාව | මුදල රු. |
|---|---|---|
| දිරිය පියස නිවාස(සමෘද්ධි අධිකාරිය ප්‍රතිපාදන ) | 36 | 850,000.00 |
| දිරිය පියස (අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක) | 16 | 1,600,000.00 |
| මුළු එකතුව | 52 | 2,450,000.00 |

ආකෘති අංක 04

| අනු අංක | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | දිරිය පියස නිවාස (සමෘද්ධි අධිකාරිය මඟින් ලබාදුන් ප්‍රතිපාදන ) | | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් ලබා දුන් නිවාස | |
|---|---|---|---|---|---|
| | | ඉදි කළ නිවාස සංඛ්‍යාව | වැය කළ මුදල රු. | ඉදි කළ නිවාස සංඛ්‍යාව | වැය කළ මුදල රු. |
| **1** | අත්තනගල්ල | 3 | 150,000.00 | 1 | 100,000.00 |
| **2** | බියගම | 0 | 0.00 | 1 | 100,000.00 |
| **3** | දිවුලපිටිය | 1 | 75,000.00 | 1 | 100,000.00 |
| **4** | දොම්පේ | 2 | 125,000.00 | 4 | 400,000.00 |
| **5** | ගම්පහ | 0 | 0.00 | 1 | 100,000.00 |
| **6** | ජා-ඇල | 0 | 0.00 | 1 | 100,000.00 |
| **7** | කටාන | 0 | 0.00 | 1 | 100,000.00 |
| **8** | කැලණිය | 0 | 0.00 | 1 | 100,000.00 |
| **9** | මහර | 29 | 400,000.00 | 1 | 100,000.00 |
| **10** | මීරිගම | 1 | 100,000.00 | 1 | 100,000.00 |
| **11** | මිනුවන්ගොඩ | 0 | 0.00 | 1 | 100,000.00 |
| **12** | මීගමුව | 0 | 0.00 | 1 | 100,000.00 |
| **13** | වත්තල | 0 | 0.00 | 1 | 100,000.00 |
| | එකතුව | **36** | **850,000.00** | **16** | **1,600,000.00** |

**සමෘද්ධි බැංකු සංගම් හා මහා සංගම් ඉදිකිරීම් - 2013**

ආකෘති අංක 05

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | සමෘද්ධි අධිකාරිය මඟින් ලබාදෙන ලද ප්‍රතිපාදන මුදලින් | | බැංකු / මහා සංගමයේ අරමුදලින් | |
|---|---|---|---|---|
| | ව්‍යාපෘති සංඛ්‍යාව | වැය කරන ලද මුදල රු. | ව්‍යාපෘති සංඛ්‍යාව | වැය කරන ලද මුදල රු. |
| අත්තනගල්ල | 0 | 0 | 2 | 995,776.00 |
| මිනුවන්ගොඩ | 1 | 490,195 | 3 | 1,586,116.00 |
| දිවුලපිටිය | 1 | 700,000 | 1 | 828,379.00 |
| දොම්පේ | 1 | 1,000,000 | 2 | 1,849,973.00 |
| ගම්පහ | 1 | 304,451 | 1 | 370,730.97.00 |
| කැලණිය | 0 | 0 | 1 | 325,623.00 |
| මීගමුව | 0 | 0 | 2 | 707,711.00 |
| මීරිගම | 0 | 0 | 1 | 7,500.00 |
| එකතුව | **4** | **2,494,646** | **13** | **6,671,808.97** |

## 2013 වර්ෂය සඳහා සමෘද්ධි සහනාධාර බෙදාදීම

**ගම්පහ දිස්ත්‍රික්කය** **ආකෘති අංක 06**

| අනු අංක | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | සහනාධාර වර්ගීකරණය | | | | | මාසික මුදල රු. | දිස්ත්‍රික්කයේ මුළු පවුල් ගණන | සහනාධාර ලබන පවුල් ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | **1500/=** | **1200/=** | **750/=** | **210/=** | එකතුව | | | |
| **1** | අත්තනගල්ල | 65 | 0 | 9,504 | 857 | 10,426 | 7,405,470 | 38,923 | 27% |
| **2** | බියගම | 0 | 0 | 5,888 | 162 | 6,050 | 4,450,020 | 40,514 | 17% |
| **3** | දිවුලපිටිය | 40 | 0 | 12,391 | 1,907 | 14,338 | 9,753,720 | 33,454 | 47% |
| **4** | දොම්පේ | 18 | 4,309 | 2,958 | 476 | 7,761 | 7,516,260 | 33,770 | 24% |
| **5** | ගම්පහ | 61 | 0 | 6,393 | 242 | 6,696 | 4,937,070 | 44,008 | 18% |
| **6** | ජා ඇල | 59 | 0 | 9,565 | 94 | 9,718 | 7,281,990 | 46,382 | 22% |
| **7** | කටාන | 17 | 0 | 9,731 | 402 | 10,150 | 7,408,170 | 61,819 | 18% |
| **8** | කැලණිය | 3 | 0 | 7,020 | 105 | 7,128 | 5,291,550 | 32,963 | 23% |
| **9** | මහර | 19 | 0 | 9,273 | 341 | 9,633 | 7,054,860 | 44,424 | 24% |
| **10** | මීරිගම | 10 | 0 | 9,779 | 1,835 | 11,624 | 7,734,600 | 39,022 | 32% |
| **11** | මිනුවන්ගොඩ | 25 | 0 | 8,503 | 722 | 9,250 | 6,566,370 | 37,888 | 28% |
| **12** | මීගමුව | 2 | 0 | 8,932 | 188 | 9,122 | 6,741,480 | 34,590 | 28% |
| **13** | වත්තල | 0 | 0 | 6,868 | 587 | 7,455 | 5,274,270 | 39,284 | 20% |
| | එකතුව | **319** | **4,309** | **106,805** | **7,918** | **119,351** | **87,415,830** | **527,041** | **24%** |

| සහනාධාරය වාරය සඳහා ගෙවන ලද මුළු මුදල | රු. **1048989960.00** |
|---|---|

## 2013 වර්ෂය සඳහා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ගෙවීම

**ගම්පහ දිස්ත්‍රික්කය** ආකෘති අංක 07

| අනු අංක | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | මරණ | | උපත් | | රෝහල් | | විවාහ | | එකතුව | | සිප්දොර ශිෂ්‍යත්ව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ගෙවන ලද ප්‍රතිලාභ සංඛ්‍යාව | ගෙවන ලද මුදල රු. | ගෙවන ලද ප්‍රතිලාභ සංඛ්‍යාව | ගෙවන ලද මුදල රු. | ගෙවන ලද ප්‍රතිලාභ සංඛ්‍යාව | ගෙවන ලද මුදල රු. | ගෙවන ලද ප්‍රතිලාභ සංඛ්‍යාව | ගෙවන ලද මුදල රු. | ගෙවන ලද ප්‍රතිලාභ සංඛ්‍යාව | ගෙවන ලද මුදල රු. | ලබා දෙන ලද ශිෂ්‍යත්ව සංඛ්‍යාව | ගෙවන ලද මුදල රු. |
| 1 | අත්තනගල්ල | 212 | 2,120,000 | 50 | 250,000 | 173 | 469,200 | 193 | 881,000 | 628 | 3,720,200 | 28 | 531,000 |
| 2 | බියගම | 126 | 1,260,000 | 16 | 80,000 | 129 | 387,200 | 86 | 398,000 | 357 | 2,125,200 | 34 | 838,000 |
| 3 | දිවුලපිටිය | 285 | 2,850,000 | 66 | 330,000 | 343 | 993,200 | 306 | 2,004,000 | 1,000 | 6,177,200 | 44 | 1,015,000 |
| 4 | දොම්පේ | 109 | 1,690,000 | 14 | 70,000 | 107 | 326,200 | 52 | 244,000 | 282 | 2,330,200 | 40 | 520,000 |
| 5 | ගම්පහ | 123 | 1,230,000 | 26 | 130,000 | 114 | 337,800 | 81 | 379,000 | 344 | 2,076,800 | 35 | 810,000 |
| 6 | ජා ඇල | 152 | 1,520,000 | 24 | 120,000 | 141 | 449,800 | 133 | 590,000 | 450 | 2,679,800 | 35 | 696,500 |
| 7 | කටාන | 147 | 1,470,000 | 10 | 50,000 | 69 | 223,400 | 72 | 314,000 | 298 | 2,057,400 | 30 | 638,000 |
| 8 | කැලණිය | 101 | 1,010,000 | 30 | 150,000 | 64 | 233,400 | 54 | 244,000 | 249 | 1,637,400 | 28 | 578,000 |
| 9 | මහර | 250 | 2,500,000 | 47 | 235,000 | 194 | 552,200 | 148 | 678,000 | 639 | 3,965,200 | 44 | 943,000 |
| 10 | මීරිගම | 245 | 2,450,000 | 40 | 200,000 | 293 | 885,300 | 163 | 751,000 | 741 | 4,286,300 | 36 | 858,000 |
| 11 | මිනුවන්ගොඩ | 170 | 1,700,000 | 43 | 215,000 | 156 | 446,800 | 174 | 807,000 | 543 | 3,168,800 | 28 | 668,000 |
| 12 | මීගමුව | 181 | 1,810,000 | 71 | 355,000 | 104 | 355,800 | 66 | 408,000 | 422 | 2,928,800 | 33 | 393,000 |
| 13 | වත්තල | 116 | 1,160,000 | 28 | 140,000 | 110 | 328,000 | 78 | 348,000 | 332 | 1,976,000 | 35 | 879,000 |
| | එකතුව | 2,217 | 22,770,000 | 465 | 2,325,000 | 1,997 | 5,988,300 | 1,606 | 8,046,000 | 6,285 | 39,129,300 | 450 | 9,367,500 |

ආකෘති අංක 08

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | සංඛ්‍යාව | මුදල රු. |
|---|---|---|
| අත්තනගල්ල | 174 | 989,500 |
| බියගම | 59 | 64,000 |
| දිවුලපිටිය | 239 | 1,778,000 |
| දොම්පේ | 175 | 764,500 |
| ගම්පහ | 165 | 561,000 |
| ජා-ඇල | 67 | 295,000 |
| කටාන | 66 | 240,000 |
| කැලණිය | 32 | 171,000 |
| මහර | 351 | 556,000 |
| මීරිගම | 423 | 2,740,500 |
| මිනුවන්ගොඩ | 453 | 427,000 |
| මීගමුව | 316 | 516,500 |
| වත්තල | 44 | 485,000 |
| එකතුව | **2564** | **9,588,000** |

# 05. සංස්කෘතික අංශය

ගම්පහ දිස්ත්‍රික්කයේ වාර්ෂිකව පවත්වනු ලබන ඓතිහාසික, සංස්කෘතික හා ආගමික කටයුතු සඳහා සම්බන්ධීකරණ කටයුතු හා සංවිධානය කිරීම සංස්කෘතික අංශයේ කාර්යභාරය වේ. මේ යටතේ පහත සඳහන් සංස්කෘතික කටයුතු සඳහා දායකත්වය ලබා දී ඇත.

**පෙරහැර සංවිධානය**

- කැලණිය රජමහා විහාරස්ථානයේ වාර්ෂික දුරුතු මහා පෙරහැර 2014.01.14 දින උත්කර්ෂවත් අන්දමින් පැවැත් වූ අතර, මෙම පෙරහැර පැවැත්වීම සඳහා අවශ්‍ය සියලු පහසුකම් සැපයීමට රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන අතර සියලු සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදී.

- ඉඳිගොල්ල, ශාන්ත ජූඩ් දේවස්ථානයේ වාර්ෂික මංගල්‍යය 2013.10.26 හා 27 දිනවල පැවැත්වූ අතර රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන අතර සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

**අන්තර් කලායතන තරගාවලිය**

2013.10.12 වන දින ගම්පහ රත්නාවලී බාලිකා විද්‍යාලයේදි මෙම තරග සංවිධානය කරන ලද අතර දිස්ත්‍රික්කයේ කලායතන 32 ක සිසුන් සඳහා, 2013.11.27.දින දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී පැවැති සුහද හමුවක දී සහතික පත් හා ත්‍යාග පිරිනමන ලදි.

**රාජ්‍ය ළමා චිත්‍ර උළෙල - 2013 (දිස්ත්‍රික් තරඟාවලිය)**

රාජ්‍ය ළමා චිත්‍ර උළෙලේ දිස්ත්‍රික් මට්ටමේ ජයග්‍රාහකයන් තෝරා ගැනීම සඳහා පවත්වනු ලැබූ ගම්පහ දිස්ත්‍රික් ළමා චිත්‍ර තරඟාවලිය සිසුන් 345 සහභාගිත්වයෙන් 2013.08.29 දින යක්කල මහවිට සිරිවජිර ඥාණොදය පිරිවෙනේදි සංස්කෘතික දෙපාර්තමේන්තුවේ චිත්‍ර හා මූර්ති අනුමණ්ඩලයේ ද සහභාගිත්වයෙන් පැවැත්විණි.

**ජාතික සාහිත්‍ය තරඟාවලිය හා ජාතික සාහිත්‍ය කලා මහෝත්සවය**

ප්‍රාදේශීය මට්ටමින් ජයග්‍රහණය කළ සාහිත්‍ය නිර්මාණ දිස්ත්‍රික් තරඟ සඳහා ඉදිරිපත් කිරීම හා එයින් ජයග්‍රහණය කළ නිර්මාණ ජාතික මට්ටමට ඉදිරිපත් කිරීම.

දිස්ත්‍රික් තරඟාවලිය සිංහල,දෙමළ හා ඉංග්‍රීසි යන අංශ තුනෙන්ම පැවැත්වූ අතර තරඟ ඉසව් 35 ක් සඳහා ස්ථාන 89 ක් තෝරා ගන්නා ලදී.

2013 වර්ෂයට අදාළ ගම්පහ දිස්ත්‍රික් සාහිත්‍ය කලා මහෝත්සවය 2013 සැප්තැම්බර් මස 06 දින ගම්පහ, කොස්සින්න රජමහා විහාරයේ දී කවිකාචාර්ය සද්ධා උත්පලකන්ද මහතා හා තවත් ශිල්පීන් හත්දෙනෙකුගේ සහභාගිත්වයෙන් පැවැත්විණි. පහත රට ශාන්තිකර්මයේ මූලික අවස්ථා වේදිකාවේ නිරූපණය කරමින් විශේෂ වැඩසටහනක්, පාසල් සිසුන් හා දිස්ත්‍රික්කයේ විශේෂ අමුත්තන් 400 ක පමණ සහභාගිත්වයෙන් පවත්වන ලදී.

**දේශීය ආහාර සංස්කෘතික ප්‍රවර්ධන වැඩසටහන**

2013.05.10. දින දේශීය ආහාර සංස්කෘතිය පිළිබඳ ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී ආර්.ඒ.ආශා කුමාරි මහත්මිය විසින් පවත්වන ලද දේශනය සමගින් පුද්ගලයින් 100 ක් සඳහා දේශීය ක්‍රමයට සැකසූ දිවා ආහාරයක් ලබාදීමේ වැඩසටහනක් සිදු කරන ලදී.

**ගම්පහ දිස්ත්‍රික් ලේඛක සංගමය**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පිහිටුවා ඇති ගම්පහ දිස්ත්‍රික් ලේඛක සංගමය හා එක්ව 2013 වර්ෂයේ විශේෂ වැඩසටහන් රාශියක් සංවිධානය කරන ලදී.

- දිස්ත්‍රික් ලේඛක සංගමය සඳහා නව නිලධාරී මණ්ඩලයක් පත්කිරීම
- ප්‍රවීන රචක හෙන්රි වීරසූරිය මහතාගේ "පරමලක සුගන්දය" කෙටිකථා සංග්‍රහය පිළිබඳ විචාරයක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී සංවිධානය කිරීම
- "පැහැසර" සඟරාවේ දෙවන කලාපය මුද්‍රණය කිරීම හා එය දොරට වැඩීමේ උළෙලක් පැවැත්වීම.
- ගම්පහ දිස්ත්‍රික් ලේඛක සංගමයේ සාහිත්‍ය උළෙල පවත්වා එහි දී මුද්‍රිත අංශයේ හොඳම නව කථාව, කෙටි කථාව, පද්‍ය සංග්‍රහය හා පරිවර්තන කෘතිය තේරීමත්, අත් පිටපත් අංශයේ හොඳම නව කථාව, කෙටිකථාව, පද්‍ය සංග්‍රහය හා ළමා කෘතිය තේරීමත් සිදුකොට ඒ සඳහා ත්‍යාග, සහතික පත් හා කුසලාන පලක ලබාදීම.
- කතෘ ප්‍රකාශන සංසදය පිහිටුවීම.

**නව කලායතන ලියාපදිංචි කිරීම**

2013 වර්ෂය සඳහා ගම්පහ දිස්ත්‍රික්කය තුළ නව කලායතන 12 ක් ලියාපදිංචි කරන ලදී.

| **කලායතනයේ නම** | **ලියාපදිංචි අංකය** | **ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය** |
|---|---|---|
| දේශානි කලායතනය | ගම් 199 | දොම්පෙ |
| ප්‍රභාෂ්වරී ශාස්ත්‍රීය සංගීත කලායතනය | ගම් 200 | ගම්පහ |
| නවරංගනා කලායතනය | ගම් 201 | ගම්පහ |
| රංග කලායතනය | ගම් 203 | වත්තල |
| ශෂිප්‍රභා රංග කලායතනය | ගම් 204 | බියගම |
| ගීනාදි කලායතනය | ගම් 205 | බියගම |
| දිලිනි රංග කලායතනය | ගම් 206 | දිවුලපිටිය |
| සත්සර අසපුව කලායතනය | ගම් 207 | ජා-ඇල |
| දෙව්රංගි කලායතනය | ගම් 208 | අත්තනගල්ල |
| උපුල් ප්‍රසන්ත සංගීත කලායතනය | ගම් 209 | මීරිගම |
| වරුෂා කලායතනය | ගම් 210 | මිනුවන් ගොඩ |
| සොහාවිත රංගන කලායතනය | ගම් 211 | මීරිගම |

# 06. බෞද්ධ කටයුතු අංශය

**සම්බන්ධීකරණය**

- බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යංශය
- බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව

## 6.1 දහම් පාසල් ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා සිදුකරන ලද කාර්යයන්

### ❖ දහම් පාසල් පෙළ පොත් හා අනෙකුත් පොත් බෙදා දීම

දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක දහම් පාසල් 731 ක ශිෂ්‍ය ශිෂ්‍යාවන් 225,455 ක් හා දහම් පාසල් ගුරුවරුන්ට අවශ්‍ය දහම් පාසල් පෙළ පොත් සහ අනෙකුත් අවශ්‍ය පොත්පත් බෙදා දීමට, 2013 වර්ෂය සඳහා දළ වශයෙන් රු. 7,969,674.11 ක (රුපියල් හැත්තෑනව ලක්ෂ හැටනව දහස් හයසිය හැත්තෑහතරයි ශත එකොළහක පමණ) මුදලක් වැය කර ඇත.

### ❖ දහම් පාසල් ගුරුවරුන් වෙනුවෙන් පුස්තකාල දීමනා ලබා දීම

අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති සියලුම දහම් පාසල් ගුරුවරුන් වෙනුවෙන් එක් ගුරුවරයෙකුට වර්ෂයකට රු. 2000.00 බැගින් පුස්තකාල දීමනාවක් ලබාදීම අනුව 2013 වර්ෂයේ දී දහම් පාසල් ගුරුභවතුන් 8724 ක් වෙනුවෙන් රු.17,448,000.00 ක මුදලක් ලබා දෙන ලදී.

### ❖ දහම් පාසල් ශ්‍රේණි විභාග පැවැත්වීම.

දහම් පාසල් 6 සිට 10 දක්වා ශ්‍රේණි සඳහා වර්ෂාවසාන විභාග පැවැත්වීම, බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව මගින් දීපව්‍යාප්තව සිදු කරනු ලබන අතර, විභාගයෙන් සමත් වන සියලුම ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙත සහතික පත්‍රයක් නිකුත් කිරීම ද සිදු කරනු ලබයි.

| වර්ෂය | මධ්‍යස්ථාන ගණන | සහභාගි වූ ශිෂ්‍ය සංඛ්‍යාව | වියදම් වූ මුදල (දළ වශයෙන්) |
|---|---|---|---|
| 2013 | 463 | 89,481 | රු. 2,237,025.00 |

### ❖ දහම් පාසල් ගුරු සහතික පත්‍ර විභාගය

දහම් පාසල් ගුරුවරුන් උදෙසා පවත්වනු ලබන දහම් පාසල් ගුරු සහතික පත්‍ර විභාගය 2013.05.11 දින ගම්පහ යසෝදරා බාලිකා මහ විද්‍යාලයේ දී පවත්වනු ලැබූ අතර, මේ සඳහා අපේක්ෂක, අපේක්ෂිකාවන් 426 දෙනෙකු සහභාගි විය.

## ❖ දහම් පාසල් සිසු නිපුණතා ඇගයීම් වැඩසටහන

පසුගිය වර්ෂ වල දී මෙන්ම මෙවරද ප්‍රාදේශීය මණ්ඩල ඇගයීම් සිදු කිරීමෙන් පසු දිස්ත්‍රික් සිසු නිපුණතා ඇගයීම් කටයුතු ගම්පහ බණ්ඩාරනායක මහ විදුහලේ දී 2013.11.03 දින පැවැත්වීමෙන් අනතුරුව තෝරාගනු ලැබූ සිසුන් සමස්ත ලංකා ඇගයීම් නිපුණතා සඳහා ඉදිරිපත් කරන ලදී. මෙවර සමස්ත ලංකා සිසු නිපුණතා ඇගයීම් වැඩසටහන දෙසැම්බර් මස 27,28 සහ 29 යන දිනවල පැවතියේ කෑගල්ල දිස්ත්‍රික්කයේ කෑගල්ල බාලිකා විද්‍යාලයයේදී ය. මෙම වැඩසටහන දිවයින පුරා දිස්ත්‍රික්ක 21 ක දහම් පාසල් සිසු දරු දැරියන් සහභාගී වූ දැවැන්ත වැඩසටහන් මාලාවකි.

| ප්‍රථම ස්ථානය | දෙවන ස්ථානය | තෙවන ස්ථානය | සිවුවන ස්ථානය | පස්වන ස්ථානය |
|---|---|---|---|---|
| 2 | 3 | 3 | 3 | 3 |

1 සිට 5 දක්වා ජයග්‍රහණ 14 ක් ලබාගනිමින් දිස්ත්‍රික්ක 21 ක් අතුරින් ගම්පහ දිස්ත්‍රික්කය පස්වන ස්ථානය ලබා ගන්නා ලදී.

## ❖ දහම් සරසවිය වැඩසටහන

මෙය දහම් පාසල් ගුරුභවතුන්ගේ දැනුම වඩාත් වර්ධනය කර ගැනීමටත් එය තුළින් ඔවුන්ට උසස් අධ්‍යාපනය සඳහා දොරටු විවෘත කර දීමත් අරමුණු කොටගෙන පවත්වන වැඩසටහනකි. ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයය හා පාලි හා බෞද්ධ විශ්ව විද්‍යාලයය සමග ඒකාබද්ධව මෙම වැඩසටහන පවත්වනු ලබයි. 2013 වර්ෂයේ සම්මුඛ පරීක්ෂණ පවත්වා තෝරාගනු ලැබූ දහම් පාසල් ගුරුවරුන් 113 දෙනෙකු මෙම පාඨමාලාව සඳහා තෝරාගනු ලැබූ අතර, ගම්පහ ජාත්‍යන්තර සාම මහා විහාරස්ථානයේ දී මෙම පාඨමාලාව පවත්වනු ලැබී ය. පාඨමාලාව අවසානයේ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලය මගින් විභාගය පැවැත්වීමට නියමිත ය.

| මධ්‍යස්ථානය | ශිෂ්‍ය සංඛ්‍යාව | අනුබද්ධ විශ්ව විද්‍යාලයය |
|---|---|---|
| ගම්පහ ජාත්‍යන්තර සාම මහ විහාරය | 113 | ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලයය |

## ❖ පාලි භාෂා ප්‍රවර්ධන පාඨමාලාව

දහම් පාසල් ගුරු භවතුන් ගේ පාලි භාෂා ඥානය වැඩිදියුණු කිරීම උදෙසා මෙම 2013වර්ෂයේ දී ද පාලි භාෂා ප්‍රවර්ධන පාඨමාලාව දිස්ත්‍රික්කයේ තෝරාගත් මධ්‍යස්ථානයක දී පවත්වා අදාළ පරීක්ෂණ ද පවත්වා නිම කරන ලද අතර, මෙම පාඨමාලාව සඳහා රු. 76,420.00 ක පමණ මුදලක් බෞද්ධ කටයුතු දෙපාර්මේන්තුව මගින් වැය කර තිබුණි.

❖ ගුරු කුසලතා සංවර්ධන වැඩසටහන

දහම් පාසල් ගුරුවරුන්ගේ කුසලතා සංවර්ධනය වෙනුවෙන් බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව මගින් දීපව්‍යාප්තව පවත්වනු ලබන පුහුණු වැඩසටහන්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කිහිපයක 2013 නොවැම්බර් මසදී පවත්වනු ලැබූ අතර, ඒ සඳහා රු. 400,125.00 (රුපියල් හාරලක්ෂ එකසිය විසිපහක)ක මුදලක් වැය කර ඇත.

## 6.2 විහාරස්ථාන සංවර්ධනය සහ පවත්වාගෙනයාම සඳහා සිදුකරන ලද කාර්යයන්

❖ විහාරස්ථාන සඳහා ආධාර ලබාදීම

විහාරස්ථාන සඳහා සංවර්ධන ආධාර විවිධ විෂයයන් යටතේ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය හා බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව මගින් ලබාදීම සිදු කරනු ලබයි.

ඒ අනුව ගම්පහ දිස්ත්‍රික්කයේ විහාරස්ථාන සංවර්ධනය සඳහා බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය මගින් රු. 200,000.00 (රුපියල් ලක්ෂ දෙකක) මුදලක් ලබා දී ඇත.

ඊට අමතරව බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව මගින් විහාරස්ථාන සංවර්ධන ආධාර හා දුෂ්කර විහාරස්ථාන සංවර්ධන ආධාර වශයෙන් රු. 1,850,000.00 (රුපියල් දහඅට ලක්ෂ පනස්දහසක) ක මුදලක් ද දහම් පාසල් උපකරණ හා ගොඩනැගිලි සංවර්ධනය සඳහා රු. 626,420.00(රුපියල් හය ලක්ෂ විසිහයදහස් හාරසිය විස්ස)ක මුදලක් ද ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩල උපකරණ මිල දී ගැනීම සඳහා රු. 100,000.00 (රුපියල් ලක්ෂය)ක් වශයෙන් ද මුදල් ලබා දී ඇත.

❖ ආදාහනෝත්සව සඳහා ආධාර ලබාදීම

2013 වර්ෂයේ දී ගම්පහ දිස්ත්‍රික්කයේ වැඩවිසූ මහානායක ස්වාමීන්වහන්සේලා දෙනමක් වූ පූජ්‍ය ගැටවෙපොල ශ්‍රී විමලරතනාභිධාන නායක ස්වාමීන්වහන්සේ සහ පූජ්‍ය අරමංගොඩ පඤ්ඤාතිලකාභිධාන නායක ස්වාමීන්වහන්සේලාගේ ආදාහන පූජෝත්ව ඇතුළු ගම්පහ දිස්ත්‍රික්කයේ සියළුම ආදාහන පූජෝත්සව වෙනුවෙන් බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව විසින් රු. 430,000.00 (රුපියල් හාරලක්ෂ තිස් දහස) ක මුදලක් වැය කර ඇත.

## 6.3 සිදු කරන ලද වෙනත් කාර්යයන්

- **මත් ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්**

බුද්ධ ශාසන හා ආගමික අමාත්‍යාංශය, ජාතික මත්ද්‍රව්‍ය නිවාරණ මෙහෙයුම් ඒකකයේ මෙහෙයවීමෙන් හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සංවිධායකත්වයෙන් මත්ද්‍රව්‍ය නිවාරණය සම්බන්ධව දහම් පාසල් ගුරුවරුන් පුහුණු කිරීමේ එක්දින වැඩසටහන් 12 ක් සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල ආවරණය වන පරිදි පවත්වා, එයින් තෝරාගත් ක්‍රියාකාරී දහම් පාසල් ගුරුවරුන් 150 ක් සඳහා දෙදින නේවාසික ගුරු පුහුණු වැඩමුළු දෙකක්, වේයන්ගොඩ සංස්කෘතික පුහුණු මධ්‍යස්ථානයේදී නොවැම්බර් මාසය තුළ පවත්වා අවසන් කරන ලදී.

- **සඳහිරු සෑය**

ශ්‍රී ලංකා ආරක්ෂක හමුදා රණවිරුවන්ගේ උදාර සේවය ඇගයීම සඳහා අනුරාධපුරයේ ඉදිවෙමින් පවතින "සඳහිරු සෑයේ" තෙවන පේසා වළල්ලේ නිදන්කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වල සහභාගිත්වයෙන් නිදන් වස්තු එක්රැස් කර 2013.11.23 දින අනුරාධපුරය වෙත රැගෙන ගොස් නිදන් කිරීමේ කටයුතු වලට සහභාගි වීම සිදුවිය.

- **ශ්‍යාමෝපාලි මහ නිකාය සැමරීම**

260 වස් සපුරණ ශ්‍යාමෝපාලි මහ නිකාය සැමරීම සඳහා සමස්ත ලංකා දහම් පාසල් සිසු රචනා නිපුණතා ඇගයීම් වැඩසටහනේ ප්‍රාදේශීය ඇගයීම් පවත්වා ඉන් අනතුරුව දිස්ත්‍රික් ඇගයීම් පවත්වා තෝරාගත් සිසු දරුදැරියන් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම සිදුවිය.

- **ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා සැමරීම**

ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමාගේ 149 වන ජන්ම දිනය සැමරීම සඳහා දිවයිනේ සියලුම දහම් පාසල් සම්බන්ධ කරගෙන බෝසත් දම්පල් හරසර නමින් රචනා හා කථික තරගයක් පවත්වා ප්‍රාදේශීය මට්ටමින් පවත්වා දිස්ත්‍රික් මට්ටමින් ඇගයීමට ලක්කර අවසන් ඇගයීම් සඳහා ප්‍රතිඵල යොමු කිරීමට කටයුතු කරන ලදී.

- **අතිගරු ජනාධිපතිතුමාට සෙත් පැතීමේ පිංකම්**

අතිගරු ජනාධිපතිතුමාගේ ජන්ම දිනය, පදවි ප්‍රාප්තිය, දෙවන අභිෂේකයේ තෙවර්ෂ පූරණයත්, පොදු රාජ්‍ය මණ්ඩලයීය රාජ්‍ය නායක සමුළුවේ සභාපතිත්වය හිමිවීමත් නිමිති කරගෙන අතිගරු ජනාධිපතිතුමාට සෙත්පතා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් විශේෂ බෝධිපූජා පිංකම් හා සර්ව රාත්‍රික පරිත්‍රාණ ධර්ම දේශනා හා පසුදින හීල්දානමය පිංකම් පවත්වන ලදී. එහිදී ගම්පහ ඉඳිගොල්ල විද්‍යාවංශ පිරිවෙනෙහි දිස්ත්‍රික්කයේ ප්‍රධාන බෝධිපූජා පිංකම, සර්ව රාත්‍රික පරිත්‍රාණ

ධර්ම දේශනය හා හීල් දානමය පිංකම පැවැත්වුන අතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මෙහෙයවීමෙන් හා අධීක්ෂණය යටතේ ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් සිදු කරන ලදී.

- **හිසතෙල් ගෑමේ රාජ්‍ය මහෝත්සවය**

හිසතෙල් ගෑමේ රාජ්‍ය මහෝත්සවය මෙවර ගම්පහ දිස්ත්‍රික්කය තුළ කොස්සින්න රාජමහා විහාරස්ථානයේ දී පැවැත්වූ හෙයින් එහි සංවිධාන කටයුතු වලට අවශ්‍ය සහාය ලබාදීම බෞද්ධ කටයුතු අංශය විසින් කරන ලදී.

- විශේෂ ආගමික උත්සව, පෙරහැර හා සංස්කෘතික වැඩසටහන්, සංස්කෘතික අංශය හා එක්ව පැවැත්වීමට ද කටයුතු කරන ලදී.

## 6.4 බෞද්ධ තොරතුරු රැස්කිරීම.

දිස්ත්‍රික්කය තුළ ක්‍රියාකාරී විහාරස්ථාන හා දසසිල් මාතා ආරාම සංඛ්‍යාව හා ඒවායේ වැඩවසන භික්ෂූන් හා දසසිල් මාතාවන් සංඛ්‍යාව, දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක දහම් පාසල් සංඛ්‍යාව, ඒවායේ සේවය කරනු ලබන ගුරුවරුන් හා ශිෂ්‍ය සංඛ්‍යාව, දිස්ත්‍රික්කය තුළ ක්‍රියාකාරී බෞද්ධ සමිති, විහාරස්ථාන කාර්ය සාධක සමිති, දායක සභා, කුලහන සමිති ආදී සමිති සමාගම් පිළිබඳ සංඛ්‍යා තොරතුරු රැස්කර දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට කටයුතු කර ඇත.

## 6.5 තායිලන්ත ලෝක සාම ආචාර ධර්ම තරගය

තායිලන්තයේ ධම්මකාය පදනම මගින් ලෝකයේ ථෙරවාද බෞද්ධ රටවල් මුල්කරගෙන ලෝක සාම ආචාර ධර්ම තරග විභාගය පවත්වනු ලබයි. මෙහි විශේෂත්වය වන්නේ සිසු දරු දැරියන් සමග ඔවුන්ගේ දෙමව්පියන්ට ද පවුලක් වශයෙන් මෙම තරග විභාගය සඳහා ඉදිරිපත්වීමට හා පිළිතුරු ලිවීමට හැකිවීමයි. මේ සඳහා 2013.10.20 දින ගම්පහ දිස්ත්‍රික්කයේ ද සිසු දරු දැරියන් ද ඉදිරිපත් විය.

## 6.6 දහම් පාසල් ගුරුවරුන් සඳහා වෛද්‍යාධාර ලබාදීම

දහම් පාසල් ගුරුවරුන්ගේ හා දහම් පාසල් ශිෂ්‍ය ප්‍රජාවගේ සුභසාධනය උදෙසා විහාරස්ථාන සංවර්ධනය කිරීම ඇතුළු අරමුණු මුල් කරගෙන 2008 වසරේ පිහිටුවන ලද සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩල අරමුදල මගින් ඉහත වෛද්‍යාධාර ලබාදීම සිදුකෙරේ. ඒ අනුව 2013 වසරේ ගම්පහ දිස්ත්රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කිහිපයක දහම් පාසල් ගුරුවරුන්ගෙන් එක් අයෙකුගේ සැත්කමක් සඳහා වෛද්‍යාධාර වශයෙන් රු. 25,000.00 (රුපියල් විසිපන්දහසක) ක මුදලක් ලබාදීමට හැකිවිය. මෙම අරමුදලට මුදල් රැස්කිරීම වසරක් පාසා සිදු කරනු ලබන දහම් පාසල් කොඩි අලෙවිය මගින් කරනු ලබයි.

# 07. දිස්ත්‍රික් මෝටර් රථ ප්‍රවාහන කාර්යාලය

රථවාහන ධාවනය සම්බන්ධයෙන් නිතිරීති පිළිබඳ දැනුමක් ඇති නීත්‍යානුකූල රියදුරු බලපත් හිමි රියදුරන් පිරිසක් බිහි කිරීම හා ධාවනයට සුදුසු කිරීම සඳහා දෙපාර්තමේන්තු අරමුණු සාක්ෂාත් කිරීම උදෙසා මෙම කාර්යාලය ගම්පහ දිස්ත්‍රික්කය තුළ කටයුතු කරනු ලැබේ.

**කාර්ය සාධනය 2011-2013**

| අනු අංක | විස්තරය | ප්‍රමාණය 2011 | ප්‍රමාණය 2012 | ප්‍රමාණය 2013 |
|---|---|---|---|---|
| 1 | වර්ෂය තුළ ලැබූ අයදුම්පත් ගණන | 34732 | 36348 | 46037 |
| 2 | ලිඛිත පරීක්ෂණයට භාජනය කළ අයදුම්කරුවන් ගණන | 36632 | 41593 | 36517 |
| 3 | නව ලියාපදිංචිය සඳහා පරීක්ෂා කළ හදිසි අනතුරු වාහන සංඛ්‍යාව | 700 | 200 | 205 |
| 4 | පරීක්ෂා කළ හදිසි අනතුරු සංඛ්‍යාව | 2132 | 2600 | 3400 |
| 5 | අනන්‍යතාවය සහ තහනම් නියෝග පරීක්ෂා කළ වාහන | 538 | 1197 | 2100 |
| 6 | මහජනතාව වෙත නිකුත් කළ අංක තහඩු ගණන (සියලුම වාහන වර්ග සඳහා) | 16823 | 15950 | 12498 |
| 7 | මෙම කාර්යාලයෙන් නිකුත් කළ යතුරුපැදි සහතික සහ අංක තහඩු ගණන | 177 | 121 | 64 |
| 8 | වර්ෂය තුළ පරීක්ෂා කල රියදුරු පාසල් ගණන | 35 | 60 | 45 |
| 9 | වර්ෂය තුළ රියදුරු බලපත් පිටපත් ලබාගැනීම සඳහා තාවකාලික බලපත් නිකුත් කිරීම් | 8219 | 9424 | 12433 |
| වර්ෂය තුළ ලංකා බැංකු කච්චේරි ශාඛාව මගින් රැස් කළ ආදායම | | මිලියන 130.5 | මිලියන 172.4 | මිලියන 115.0 |

**මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ගම්පහ දිස්ත්‍රික් කාර්යාලයේ වාර්ෂික ආදායම රුපියල් මිලියන**




රියදුරු බලපත් නිකුත් කිරීම, වාහන පරීක්ෂාව සහ යතුරු පැදි ලියාපදිංචි වෙනුවෙන් ලැබී ඇති ආදායම් ඉහත දක්වා ඇත.

**වාර්ෂිකව පරීක්ෂණය සඳහා භාජනය වන වාහන සංඛ්‍යාව**




නව ලියාපදිංචි, හදිසි අනතුරු සිදුවූ වාහන අනන්‍යතාව, බර සහතික නිකුත් කිරීම, තහනම් නියෝග නිකුත් කිරීම සඳහා පරීක්ෂා කර ඇති වාහන සංඛ්‍යාව වාර්ෂිකව ඉහළ ගොස් ඇත.

# 08. සංඛ්‍යාලේඛන අංශය

සංවර්ධන ක්‍රියාවලියේදී යොදාගන්නා පදනම් දත්ත එක්රැස්කර දෙමින් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වල දත්ත අවශ්‍යතාවයන් හා දිස්ත්‍රික්කයේ ඉහළ කළමනාකාරීත්වයට අවශ්‍ය පදනම් තොරතුරු ගැනීම සංඛ්‍යාල්ඛන අංශයේ කාර්යය භාරයට අයත්වෙයි. සංගණන, සමීක්ෂණ හා පරිපාලන වාර්තා ඇසුරින් දත්ත එක් රැස්කිරීම සිදුකරනු ලබයි. ඒ අනුව 2013 වර්ෂය සඳහා සංඛ්‍යාලේඛන අංශයේ සිදු කරන ලද කාර්ය සාධනය පහත සටහනින් දැක්වේ.

**2013 වර්ෂය සඳහා වූ කාර්ය සාධනය**

| විෂය | ව්‍යාපෘතිය | වාර්ෂික භෞතික ඉලක්කය | වෙන් කළ මුදල (රු.පි.) | කරන ලද වියදම (රු.පි.) | සාධනීය මට්ටම |
|---|---|---|---|---|---|
| 1 | ආර්ථික සංගණනය - 2013/14 කෘෂිකාර්මික කටයුතු පිළිබඳ ගණන් ගැනීම නියමු සංගණනය | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක සංගණන කාණ්ඩ 09 ක තොරතුරු රැස්කිරීම. උපලේඛනයේ ඇති අඩුපාඩු හා ක්ෂේත්‍රයේ තොරතුරු ලබා ගැනීමේදී ඇතිවන ගැටළු පිළිබඳ මෙහිදී සොයා බැලීම. | 12,588,195/= | 12,264,786.50/= | 100 % |
| 2 | ආර්ථික සංගණනය - 2013/14 කර්මාන්ත, වෙළඳ හා සේවා ලැයිස්තුගත කිරීම. | දිස්ත්‍රික්කයේ සියලුම කර්මාන්ත, වෙළඳ හා සේවා ලැයිස්තු සකස් කිරීම. | | | 100% |
| 3 | ආර්ථික සංගණනය - 2013/14 වතු ලැයිස්තු ගත කිරීම. | දිස්ත්‍රික්කය සඳහා වතු (අක්කර 20 හෝ ඊට වැඩි වගාවක් සහිත) ලැයිස්තුවක් සකස් කිරීම. | - | - | 100% |
| 4 | ගැටුම් හේතුවෙන් මිය ගිය/ තුවාල ලැබූ පුද්ගලයින් හා දේපළ හානි පිළිබඳ සංගණනය - 2013 | 1982 සිට මේ දක්වා ගැටුම් හේතුවෙන් මිය ගිය/ තුවාල ලැබූ පුද්ගලයින් හා දේපළ හානි පිළිබඳ තොරතුරු ලබා ගැනීම. | 1,546,084/= | 1,457,966.96/= | 100% |

| | | | | | |
|---|---|---|---|---|---|
| 5 | ශ්‍රම බල සමීක්ෂණය - 2013 | දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් තෝරා ගත් නියදි ඒකක 259 අයත් නිවාස ඒකක 2590 ක තොරතුරු පදනම් කරගෙන දිස්ත්‍රික්කයේ රැකියා නියුක්තිය, වියුක්තිය හා ආර්ථික වශයෙන් ක්‍රියාශීලී නොවන පුද්ගලයින් පිළිබඳ අධ්‍යයනය කිරීම. | 260,869.00 | 301,045.00 | 100% |
| 6 | ත්‍රෛමාසික කාර්මික නිෂ්පාදන සමීක්ෂණය | සෑම කාර්තුවකට තෝරා ගත් ආයතන 64 කින් තොරතුරු රැස්කර නිෂ්පාදන කර්මාන්ත ක්ෂේත්‍රයේ කාලානුරූප මට්ටම හා ආනතීන් හදුනා ගැනීම. | | | 90% තොරතුරු දීම ප්‍රතික්ෂේප කිරීම හා ආයතන වසා දැමීම හේතුවෙන් කර්මාන්ත කීපයක තොරතුරු ලබා ගැනීමට නොහැකි විය. |
| 7 | (I) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වී වගා කළ බිම් ප්‍රමාණය හා කපාගත් බිම් ප්‍රමාණය ලබා ගැනීම. | ගොවි නාම ලේඛනය (P1) පදනම් කරගෙන කන්න මට්ටමින් වී වපසරිය හා ඊට අයත් මූලික තොරතුරු වාර්තා කිරීම. | සටහන හා බැදේ. | | 100% |

| | | | | | |
|---|---|---|---|---|---|
| | (II) කන්න මට්ටමින් (යල හා මහ) වී අස්වනු සමීක්ෂණය | තෝරා ගත් ගම් 35 ක වී අස්වනු සමීක්ෂණය පවත්වා වාරි ක්‍රමය අනුව වී නිෂ්පාදනය හා අනෙකුත් මූලික තොරතුරු රැස්කිරීම. | 73,000 /= | 59,500/= | 95% සමහර කුඹුරු කැබලිවල අස්වැන්න කලින් කපා ගැනීම හේතුවෙන් අස්වනු සමීක්ෂණය සිදු කිරීමට නොහැකි වීම. |
| 8 | වගා වර්ෂය අනුව ගොඩ ගොවිතැන් තොරතුරු | 2012/13 මහ හා 2013 යල කන්න සඳහා කාලීන භෝග,ස්ථිර/ අර්ධ ස්ථිර භෝග ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් වගා කළ බිම් ප්‍රමාණය හා අස්වැන්න ලබා ගැනීම. | සටහන හා බැදේ. | | 100% |
| 9 | මස් පිණිස මරන ලද සතුන් පිළිබඳ තොරතුරු | දිස්ත්‍රික්කයේ සියලුම පලාත් පාලන ආයතන හා උප කාර්යාල වල ලියාපදිංචි ඝාතකාගාර වලින් මස් පිණිස මරන ලද සතුන් පිළිබඳ මූලික තොරතුරු. | සටහන හා බැදේ. | | 100% |
| 10 | දිස්ත්‍රික්කයේ පශුධන සම්පත් පිළිබඳ සංඛ්‍යාත | දිස්ත්‍රික්කයේ සියලුම ගව කුකුළු ආදී සතුන් පිළිබඳ තොරතුරු හා කිරි හා බිත්තර නිෂ්පාදන සංඛ්‍යාති රැස්කිරීම. | සටහන හා බැදේ. | | 100% |

| | | | | | |
|---|---|---|---|---|---|
| 11 | පොල් නිෂ්පාදන වියදම් ඇස්තමේන්තු කිරිමේ සමික්ෂණය | නියැදි ක්‍රමයක් මගින් තෝරාගත් පොල් වතු වල සමික්ෂණ සිදු කර, එමගින් පොල් ගෙඩි 1000 ක් සඳහා නිෂ්පාදන වියදම ගණනය කිරිම. | සටහන හා බැදේ | | 75% පොල් වතු කැබලි කර වෙනත් ආර්ථික ක්‍රියාවලි සඳහා යොදා ගැනීම නිසා සියළු පොල් වතු වල සමීක්ෂණය සිදු කිරීමට නොහැකි විය. |
| 12 | දිස්ත්‍රික්කයේ නිවාස හා ගොඩනැගිලි ඉදිකිරීම් පිළිබඳ තොරතුරු පළාත් පාලන ආයතන මට්ටමින් | දළ ජාතික නිෂ්පාදන ඇස්තමේන්තු සකස් කිරීම සඳහා ගැනෙන ඉදිකිරීම් පිළිබඳ තොරතුරු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව පලාත් පාලන ආයතන වල පරිපාලන දත්ත වාර්තා ඇසුරින් ලබා ගැනීම. | සටහන හා බැදේ. | | 100% |
| 13 | (I) කෘෂි භෝග නිෂ්පාදකයාගේ (ගොවි බිම් මට්ටමේ) මිල මාසිකව රැස් කිරීම.<br>(ii) නාගරික සිල්ලර භාණ්ඩ පාරිභෝගික මිල පිළිබඳ මාසික තොරතුරු | ජීවන වියදම් දර්ශකය ගොඩ නැගීම හා පාරිභෝගික හැසිරීම් රටා අධ්‍යයනය කිරීම සඳහා දිස්ත්‍රික්කයේ නිෂ්පාදකයාගේ මිල හා විවෘත වෙළඳ පොල සිල්ලර මිල ගණන් සතිපතා /මාසිකව හා කාර්තුමය වශයෙන් රැස් කිරිම. | සටහන හා බැදේ | - | 100% |

| | | | | | |
|---|---|---|---|---|---|
| 14 | ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් තෝරාගත් මෙම වර්ෂයේදි නියැදි ඒකක 115 අයත් නිවාස ඒකක 1150ක් හා පසුගිය වර්ෂයේ නිවාස ඒකක තොරතුරු ද පදනම් කරගෙන පවුල් ඒකකයක ආදායම් හා වියදම් පිළිබඳ අධ්‍යයනය කිරීම හා දරිද්‍රතා මට්ටම හඳුනා ගැනීම. | 53,700/= | 53,700/= | 100% |
| 15 | ජන හා නිවාස සංගණනය හා පශ්චාත් සංගණනය නැවත පරීක්ෂා කිරීම. | ජන හා නිවාස සංගණනයේ නිරවද්‍යතා ප්‍රතිශතය ගණනය කිරීම සඳහා සංගණන කාණ්ඩ 14 ක පශ්චාත් සංගණනයෙන් ලබා ගත් තොරතුරු, ජන හා නිවාස සංගණනයෙන් ලබා ගත් තොරතුරු සමඟ නැවත සංසන්දනය කර බලා තහවුරු කිරීම. | 76,500/= | 70044.28 | 100% |

සටහන :- 8,9,10,11,12,13,14 සඳහා වියදම් මාසික ගමන් වියදම් යටතේ ආවරණයවේ.

ඉහත කාර්යයන් මඟින් ලබාගත් දත්ත කිහිපයක්

**කෘෂිකාර්මික තොරතුරු**

**2012/13 මහ**

වගා කළ බිම් ප්‍රමාණය 11,176 (හෙක්ටයාර්)

කපාගත් බිම් ප්‍රමාණය 9,480 (හෙක්ටයාර්)

සාමාන්‍ය අස්වැන්න 3,750 (හෙක්ටයාරයට කිලෝ ග්‍රෑම්)

**2013 යල**

වගා කළ බිම් ප්‍රමාණය 4,813 (හෙක්ටයාර්)

කපාගත් බිම් ප්‍රමාණය 4,006 (හෙක්ටයාර්)

සාමාන්‍ය අස්වැන්න 2,934 (හෙක්ටයාරයට කිලෝ ග්‍රෑම්)

දිස්ත්‍රික්කයේ වතු සංඛ්‍යාව (අක්කර 20 හෝ ඊට වැඩි වගාවක් සහිත) - 301

දිස්ත්‍රික්කයේ කර්මාන්ත හා සේවා ආයතන සංඛ්‍යාව - 1,28,406

රැකියා නියුක්ත සංඛ්‍යාව - 922,393 (2012)

රැකියා වියුක්ත සංඛ්‍යාව - 34,957 (2012)

**නිල දරිද්‍රතා මට්ටම - 2013 දෙසැම්බර්**

ගම්පහ දිස්ත්‍රික්කය - රු. 3,936/=

ජාතික මට්ටම - රු. 3,781/=

# 09. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

2013 වර්ෂය තුළ ගම්පහ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් සිදු කළ වැටලීම් සම්බන්ධ තොරතුරු

| මාසය | වැටලීම් ප්‍රමාණය |
|---|---|
| **1.ජනවාරි** | 203 |
| **2.පෙබරවාරි** | 216 |
| **3.මාර්තු** | 229 |
| **4.අප්‍රියෙල්** | 213 |
| **5.මැයි** | 239 |
| **6.ජූනි** | 268 |
| **7.ජූලි** | 246 |
| **8.අගෝස්තු** | 254 |
| **9.සැප්තැම්බර්** | 248 |
| **10.ඔක්තෝබර්** | 199 |
| **11.නොවැම්බර්** | 86 |
| **12.දෙසැම්බර්** | 111 |



2013 වර්ෂය තුළ ගම්පහ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් සිදු කළ නඩු පැවරීම් සම්බන්ධ තොරතුරු

| මාසය | නඩු පැවරීම් ප්‍රමාණය |
|---|---|
| **1.** ජනවාරි | 88 |
| **2.** පෙබරවාරි | 194 |
| **3.** මාර්තු | 322 |
| **4.** අප්‍රියෙල් | 177 |
| **5.** මැයි | 205 |
| **6.** ජූනි | 254 |
| **7.** ජූලි | 195 |
| **8.** අගෝස්තු | 212 |
| **9.** සැප්තැම්බර් | 211 |
| **10.** ඔක්තෝබර් | 226 |
| **11.** නොවැම්බර් | 147 |
| **12.** දෙසැම්බර් | 43 |



2013 වර්ෂය තුළ ගම්පහ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් සිදු කළ නඩු පැවරීම් වලට අදාල දඩ මුදල් සම්බන්ධ තොරතුරු.

| මාසය | දඩ මුදල් (රු.) |
|---|---|
| ජනවාරි | 665500 |
| පෙබරවාරි | 1272000 |
| මාර්තු | 1213300 |
| අප්‍රියෙල් | 712500 |
| මැයි | 889750 |
| ජූනි | 839000 |
| ජූලි | 649500 |
| අගෝස්තු | 913000 |
| සැප්තැම්බර් | 710750 |
| ඔක්තෝබර් | 1249750 |
| නොවැම්බර් | 703500 |
| දෙසැම්බර් | 338000 |




## 2013 වර්ෂය තුළදී සිදු කරන ලද විශේෂ වැටලීම් හා විමර්ෂණ පිළිබඳ තොරතුරු

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ ගම්පහ කාර්යාලයේ විමර්ශන නිලධාරීන් විසින් 2013 වර්ෂය තුළ සිදුකරන ලද විශේෂ වැටලීම් හා විමර්ශන කටයුතු පිළිබඳව අදාළ තොරතුරු පහත දක්වා ඇත.

1. ඇමතිතුමාගේ හා අසේල බණ්ඩාර මහතාගේ දැනුම් දීමට අනුව 2013 ජූනි මස SLS ප්‍රමිතිය නොමැති අටපිරිකර වැටලීම් 68ක් සිදු කර නඩු පවරා ඇත.
2. අසේල බණ්ඩාර මහතාගේ දැනුම් දීමට අනුව 2013/7/9 වන දින වතුර බෝතල් වැඩි මිලට විකිණීම සම්බන්ධව වැටලීම් 18 ක් සිදු කරන ලදි.
3. අසේල බණ්ඩාර මහතාගේ දැනුම් දීමට අනුව 2013/6/19 වන ඉරිදා දින මීගමුව,වත්තල හා මාබෝල ප්‍රදේශ වල විශේෂ වැටලීම් 3ක් සිදු කර නඩු පවරා ඇත. (ශාන්ත ජෝසප් රෝහල මීගමුව, ආවේ මරියා රෝහල මීගමුව, පීපල්ස් රෝහල මාබෝල, මීගමුව)

4. පරිභෝජනයට නුසුදුසු හාල් මැස්සන් විකිණීමට ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් 2013/07/06 දින රද්දොළුව සිදුවේ පිහිටි රම්සාන් කෝන් මාර්ට් ආයතනෙයේ වැටලීමක් සිදු කරන ලදි.නඩු අංක 88152 යටතේ නඩු පැවරී මෙන් පසු රු.15000 ක දඩයක් නියම විය.
5. 2013/7/11 වන දින නිෂ්පාදන දිනය සඳහන් නොකර නූඩ්ලස් නිෂ්පාදනය කිරීම සම්බන්ධයෙන් වැටලීමක් සිදු කර නූඩ්ල්ස් ඇසුරුම් 06ක් සොයා ගන්නා ලදි.
6. 2013/7/11 වන දින සවන ඉන්ඩස්ට්‍රීස් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනයේ වැටලීමක් සිදු කළ අතර ලුණු ඇසුරුම් කිරීමේදී ව්‍යාජ නිෂ්පාදන දිනයක් භාවිතා කිරීමේ වරද අනාවරණය කර ගන්නා ලදී. මෙහිදී 400 g යේ ලුණු ඇසුරුම් 6ක් සහ 50 Kg ක මව් ඇසුරුමක් සොයා ගන්නා ලදි.
7. 2013/9/10 වන දින නිෂ්පාදන දිනය නොමැතිව සිනි පැකට් අලවි කිරීම සම්බන්ධයෙන් වැටලීමක් සිදු කරන ලදි.නඩු අංක 91225 යටතේ රිචඩ් පීරිස් ඩිස්ට්‍රිබියුටස් පුද්ගලික සමාගමට විරුද්ධව නඩු පැවරූ අතර ඒහිදී රු. 25000 ක මුදලක් නියම විය.
8. ව්‍යාජ නිෂ්පාදන දිනයක් සටහන් කර වතුර බෝතල් නිෂ්පාදනය කිරීම සම්බන්ධයෙන් දාගොන්නේ පිහිටි Aqua Pearl Water System (pvt) Ltd ආයතනයේ වැටලීමක් සිදු කරන ලදි. මම වැටලීම 2013/9/18 වන දින සිදු කළ අතර ඒහිදී 1L - 420 හා 500ml – 524 ක් හා ව්‍යාජ නිෂ්පාදිත දින යෙදූ ලේබල් 30,000 ක් වැටලීමකදී සොයා ගන්නා ලදී. නඩු අංක 91245 නඩු පැවරූ අතර රු .25000 මුදලක් දඩ මුදල් ලෙස නියම විය.
9. 2013/09/03 දින මීරිගම ප්‍රදේශයේ නිෂ්පාදන ආයතනයකින් මිල හා කාණ්ඩ අංකය සඳහන් නැති ෂැම්පු බෝතල් 258 ක් සොයා ගත් අතර ඒවා අත්තනගල්ල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර නඩු පවරා දඩ නියම වී ඇත.
10. 2013/09/02 දින වත්තල ප්‍රදේශයේ ගබඩාවකින් කල් ඉකුත් වූ කහ කුඩු 1Kg පැකට් 240 ක් සොයා ගත් අතර ඊට අදාළ නඩු පැවරීම් කටයුතු මේ වන විට සිදුකර ඇත.
11. 2013/09/23 දින පස්යාල ප්‍රදේශයේ වෙළඳසල් 05 කින් කල් ඉකුත් වූ සහල් 605 Kg ක් විකිණීම සම්බන්ධ වැටලීම් සිදු කර ඇත.(කල් ඉකුත් වූ සහල් 10Kg,25Kg,50Kg ආදී වශයෙන් වැටලීම් සිදුකර ඇත)
12. 2013/09/24 දින ප්‍රධාන කාර්යාලයේ ප්‍රියන්ත විජේසිංහ මහතාගේ දුරකථන ඇමතුමක් අනුව වැලිසර හෝමියෝපති රෝහලේ කල් ඉකුත් වූ එළු කිරි පිටි 400 g පැකට් 7946 ක් සොයා ගන්නා ලදී. එම අසුරණ වල නිෂ්පාදිත දිනයක් හෝ කල් ඉකුත් වීමේ දිනයක් අඩංගුව තිබුණේ නැත.
13. 2013/09/27 දින ප්‍රධාන කාර්යාලයේ දැනුම් දීමක් අනුව කිරිපිටි වල DCD ඇති නව කාණ්ඩ අංක 02 ක් සම්බන්ධයෙන් විමර්ශන 07 ක් සිදුකරන ලදී.එහිදී එම වෙළඳ සල් වලින් ප්‍රකාශයක්ද ලබා ගන්නා ලදී.DCD අඩංගු බවට සඳහන් කාණ්ඩ අංක 02 ට අදාළ කිරි පිටි තිබුණේ නැත.
14. පරීක්ෂා කළ වෙළඳසල් වල නම් මෙසේය.

- කාගිල්ස් ෆුඩ් සිටි කිරිබත්ගොඩ
- ලාෆ් සුපර් මාර්කට් කිරිබත්ගොඩ
- සතොස කිරිබත්ගොඩ
- ප්‍රිස්කා ස්ටෝර්ස් කිරිබත්ගොඩ
- ලොනීටා ස්වීට් සෙන්ටර් කිරිබත්ගොඩ
- සතොස වත්තල
- කීල්ස් සුපර් වත්තල

15. පොහොර ඇසුරුම් වල මිල වෙනස් කිරීම සම්බන්ධයෙන් 2013/10/11 වන දින ග්‍රෑන්ඩ් කොප් කයාර් සොලියුෂන් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනයේ වැටලීමක් සිදු කළ අතර, ඒහිදී මිල වෙනස් කල පොහොර ඇසුරුම් 14810ක් සොයා ගන්නා ලදි.නඩු අංක 91572 යටතේ නඩු පැවරී මෙන් පසු රු. 80,000 දඩයක් නියම විය.
16. නූඩ්ල්ස් ඇසුරුම් කිරීමේදී ව්‍යාජ නිෂ්පාදන දිනයක් යෙදීම සම්බන්ධයෙන් /10/20130 1වන දින රේබා ඉන්ඩස්ට්‍රීස් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනයේ වැටලීමක් සිදු කරන ලදි.ඒහිදී 5Kg නූඩ්ල්ස් පැකට් 39ක්,පපඩම් පැකට් 86ක් හා ලේබල් 25000ක් සොයා ගන්නා ලදි.
17. 2013/10/04 දින වත්තල මහේස්ත්‍රාත් උසාවිය විසින් කාර්ගිල්ස් ෆුඩ් සිටි ආයතනයට රුපියල් ලක්ෂ 2 දඩ මුදලක් නියම කරන ලදි.
18. අසේල මහතාගේ දැනුම් දීමට අනුව 2013/10/01 වන දින කල් ඉකුත් වූ ක්‍රීම් විකිණීම සඳහා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් සාර්ථක වැටලීම් 11 සිදු කර නඩු පවරා ඇත.
19. 2013/10/13 වන දින සදැල්ල පුවත් පතෙහි පල වූ වෙළඳ දැන්වීමට අනුව Biovita ඖෂධය සම්බන්ධයෙන් සාර්ථක වැටලීමක් සිදු කර නඩු පැවරීමට නියමිතව ඇත.
20. පැලියගොඩ පිහිටි Smart Dragon Lanka (pvt) Ltd ආයතනය මඟින් භාවිතයට නුසුදුසු සිමෙන්ති නැවත ඇසුරුම් කර විකිණීමට ඉදිරිපත් කර කර තිබියදි ගම්පහ පාරිභෝගික කටයුතු ආයතනය මඟින් 2013/11/4 වන දින වැටලීම් සිදු කොට නඩු අංක 46477/13 යටතේ, 2013/11/06 දින කඩවත උසාවියේ නඩු පවරා ඇත. එහිදී දඩ මුදල වශයෙන් රු. 30000 මුදලක් නියම විය. මෙහිදී 50 Kg සිමෙන්ති බෑග් 2650 ක් ද, 80 සිමෙන්ති බෑග් 87 Kg ක් ද සහිත සිමෙන්ති තොගය රාජ සන්තක විය.
21. කල් ඉකුත් වූ කිරිපිටි ගබඩා කිරීම සම්බන්ධයෙන් බ්‍රවුන්ස්වික් මිල්ස් පුද්ගලික සමාගමේ වැටලීමක් සිදු කර ප්‍රිඩියා ප්‍රෝ 1- 400 + 3g පැකට් 132ද ,ප්‍රිඩියා ප්‍රෝ + 3-1පැකට් 200g 78-ක් සොයා ගන්නා ලදි. මෙම වැටලීට 10/10/2013වන දින සිදු කරන ලදි.
22. 2013 සැප්තැම්බර් මස දින 2ක් තුළදී සුපර් මාකට් 08 ක සාර්ථක වැටලීම් සිදු කරන ලදි.
23. 2013/12/5 වන දින සීදූව ප්‍රදේශයේ පිහිටි නෙස්ලේ ලංකා පුද්ගලික සමාගමට අයත් ගබඩාවක තිබී නෙස්ප්‍රේ 400g පැකට් 2560078ක් සොයා ගන්නා ලදී. මම වැටලීම අයි.පී.මුදලගේ විසින් සිදු කල අතර ආර්.වීරවර්ධන , කේ.ඩී. ඉමාලී යන විමර්ෂණ නිළධාරීන් ඒයට සහාය විය.
24. වැලිසර රාගම පිහිටි ලංකා මිල්ක් ෆුඩ් සාමගම මඟින් අනවශ්‍යය කිරි පිටි තොග රදවා තබා ගැනීමක් සම්බන්ධයෙන් වැටලීමක් සිදු කරන ලදි. මෙම වැටලීම 2013/12/4 වන දින සිදු කළ අතර ඒහිදී සම්පූර්ණ. යොදය සහිත 25Kg කිරි පිටි පැකට් 4801 සොයා ගන්නා ලදි. වත්තල උසාවයේ නඩු පැවරීමට නියමිත අතර වැටලීම ජී.කේ. රංගනාත් විසින් සිදු කරන ලදි. ඒච්.කුමාර හා ඒල්.ඒම්.ඒස්. නාවිමන යන විමර්ෂණ නිළධාරීන් එයට සහය විය.
25. 18/12/2013වන දින පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ විමර්ෂණ නිළධාරීන් විසින් ආච්චි ෆුඩ් ප්‍රොඩක්ට් පුද්ගලික සමාගමේ නිෂ්පාදන සම්බන්යෙන් වැටලීමක් සිදු කරන ලදි .ඒහිදී පාරිභෝගිකයා නොමග යැවීමට තුඩු දෙන අයුරින් ආහාරයට නුසුදුසු කල් ඉකුත් වූ මිරිස් කුඩු නැවත ඇසුරුම් කොට අලවිය සඳහා ඉදිරිපත් කිරීමේ වරද අනාවරණය කර ගැනීමට හැකි විය දින වත්තල උසාවියේ නඩු පැවරු අතර ,ඒහිදී රු 75000 .ක දඩ මුදලක් නියම විය .මෙම වැටලීම ජී .කේ .රංගනාත් විසින් සිදු කළ අතර ඒච්.කුමාර හා වයි.ඒම්.නිශාන්ත යන අය වැටලීමට සහය විය.
26. මිල ප්‍රදර්ශනය නොකර බී ලූණු අලවි කිරීම හා නොමග යැවීමේ පැවැත්මක නිරත වෙමින් පරි භෝජනයට නුසුදුසු කුකුල් මස් හා ඌරු මස් විකිණීමට ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් 2013/12/12 වන දින ජා-ඇල ප්‍රදේශයේදී වැටලීමක් සිදු කළ අතර 2013/12/13 වන දින මීගමුව උසාවියේ නඩු පවරන ලදි. ඒහිදී දඩ මුදල් වශයෙන් රු.20000.00 ක මුදලක් නියම වූ අතර මෙම වැටලීම ඒච්.කුමාර විසින් සිදු කරන ලදි. ආර්.වීරවර්ධන හා වයි.ඒම්.නිශාන්ත යන නිළධාරීන් වැටලීමට සහය විය.

27. නිෂ්පාදන දිනය සඳහන් නොකළ වින්ටජිනෝ ක්‍රීම් අසුරන 84ක් සම්බන්ධව නිෂ්පාදකයාට නඩු පවරා ඇත.
28. කල් ඉකුත් වූ පීඩියා ප්‍රෝ කිරි පිටි පැකට් 212 ක් ගබඩා කිරීම සම්බන්ධව විමර්ෂණයක් සිදු කරන ලදි. මේ සම්බන්ධව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මගින් සිදු කළ වැටලීම සෑම මාධ්‍යය මඟින්ම ප්‍රචාරණය කරන ලදි.
29. මිල වෙනස් කළ තීන්ත ටින් 102 ක් වැටලීම් 02 කදී ලබා ගෙන ඇත. කඩවත හා වැලිවේරිය හාඩ් වෙයාර් 2ක දී මෙම වැටලීම සිදු කර ඇත.
30. වත්තල ප්‍රදේශයේ පොලිතින් නිෂ්පාදන ආයතන සම්බන්යෙන් විධාන 29 කඩ කිරීම, සනකම ආදී කරුණු 7 ම සඳහන් කර ලේබල් නොයදීම සම්බන්ධයෙන් සාර්ථක වැටලීමක් කර ඇත.
31. කල් ඉකුත් වීමේ දිනය වෙනස් කරන ලද සහල් 10Kg අසුරන 10 ක් සහ කල් ඉකුත් වූ 25Kg අසුරනයක් අලෙවි කිරීම සම්බන්ධයෙන් වැටලීමක් සිදු කර ඇත.
32. කල් ඉකුත් වූ සහල් විකිණීම සම්බන්ධව සාර්ථක වැටලීම් 6 ක් සිදු කර ඇත. ඉන් එක් වැටලීමකදී කල් ඉකුත් වූ සහල් අසුරන 51 ක් විකිණීම හා විකිණීමට ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් වැටලීම් සිදු කර ඇත.අනෙක් වැටලීම් වලදී සහල් මිටි 11ක් හා 1 බැගින් සොයා ගෙන ඇත. නඩු පැවරීම්ද සිදු කර ඇත.
33. කල් ඉකුත් වූ භාණ්ඩ විකිණීම සඳහා ඉදිරිපත් කිරීම සම්බන්ධව මීගමුව,කල්එලිය,කිරිබත්ගොඩ ප්‍රදේශ වල පිහිටි සැලෝන් 31 වැටලීම් සිදු කර ඇත.

**දුරකථනය මඟින් හා ලිඛිතව අධිකරිය වෙත යොමු කළ පාරිභෝගික පැමිණිලි විමර්ශනය**

- පාරිභෝගිකයන් විසින් දුරකථනය මඟින් අධිකාරී ඒකකය වෙත ලබා දෙන පාරිභෝගික පැමිණිලි සඳහා අදාල ස්ථාන වලට ගොස් වැටලීම් හා විමර්ෂණ කටයුතු දෛනිකව සිදු කරනු ලබයි.
- අධිකාරිය වෙත ලිඛිතව ලැබුණ පැමිණිලි සඳහා එම පැමිණිලි වලට අදාල පාර්ශවයන් අධිකාරිය වෙත මාසිකව පවත්වන පාරිභෝගික පැමිණිලි සාකච්ඡා කිරිමේ දිනයේදි ගෙන්වා සාකාච්ජා සිදු කර පාරිභෝගික පැමිණිලි විසදීම සිදු කරයි.

**දැනුවත් කිරීමේ වැඩසටහන්**

ගම්පහ පාරිභෝගික සේවා අධිකාරිය විසින් පාරිභෝගිකයන්, වෙළඳුන්,පාසල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහනක් සැප්තැම්බර් මස සිට පවත්වාගෙන යනු ලබයි.

**පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව**

- පාරිභෝගිකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් 10
- වෙළඳුන් දැනුවත් කිරීමේ වැඩසටහන් 01

# 10. මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව

ගම්පහ දිස්ත්‍රික් මිනුම් ඒකක ප්‍රමිති සේවා දෙපාර්තමේන්තුවේ 2013 වර්ෂයට අදාල ප්‍රගතිය පහත පරිදි දැක්විය හැක.

| වර්ෂය | ඒකක | මුද්දර ගාස්තු ආදායම රු. | තැත්කළ නඩු පැවරීම් | සාර්ථක වැටලීම් | තීරණය කළ දඩ මුදල |
|---|---|---|---|---|---|
| **2012** | 54,419 | 97,57,193,.88 | 418 | 126 | 3,89,500.00 |
| **2013** | 50,751 | 1,00,88,433.42 | 367 | 185 | 4,17,500.00 |

මූලාශ්‍රය - මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව

### මුද්දර ගාස්තු  ආදායම

| 2013 | ඒකක | මුද්දර ගාස්තුව |
|---|---|---|
| කේ.එම්.ටී. අබේසිරි | 2506 | 2314718.70 |
| කේ.එල්.පී.පී. බටේවෙල | 13934 | 3881359.14 |
| ඩී.ටී.ඩී. පෙරේරා | 12643 | 1895297.88 |
| අයි.එන්.බී. සිරිවර්ධන | 6630 | 593371.14 |
| පී.කේ.එන්.එස්. විජේදාස | 15038 | 1403686.56 |
| එකතුව | 50751 | 10088433.42 |

මූලාශ්‍රය - මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව

### වැටලීම් සංඛ්‍යාව - 2013

| වැටලීම | නඩු පැවරීම් | සාර්ථක වැටලීම් | තීරණය කල දඩ මුදල |
|---|---|---|---|
| කේ.එම්.ටී. අබේසිරි | 31 | 11 | 13000.00 |
| කේ.එල්.පී.පී. බටේවෙල | 177 | 73 | 164500.00 |
| ඩී.ටී.ඩී. පෙරේරා | 159 | 82 | 204000.00 |
| අයි.එන්.බී. සිරිවර්ධන | - | 19 | 36000.00 |
| පී.කේ.එන්.එස්. විජේදාස | | | |
| | 367 | 185 | 417500.00 |

මූලාශ්‍රය - මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව

# 11. දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය

## 2013 වර්ෂය තුළ ඉටු කරන ලද කාර්යයන් හා සපයන ලද සේවාවන්

ගම්පහ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයට ව්‍යවස්ථාපිතව පැවරී ඇති රාජකාරි අතර 1980 අංක 44 දරණ ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනත යටතේ වාර්ෂිකව ඡන්ද හිමියන් ගණන් ගැනීමේ කටයුතු හා මැතිවරණ පැවැත්වීම ප්‍රධාන හා විශේෂිත කාර්යයන් වේ.

2013 වර්ෂය තුළ මෙම කටයුතුවලදී ඉටුකරන ලද කාර්යයන් හා සේවාවන් පහත දක්වා ඇත.

<u>1980 අංක 44 දරණ ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනත යටතේ ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීම</u>

2013 වර්ෂයේ ඡන්ද හිමි නාමලේඛනය 2013.12.31 දිනට සහතික කිරීමට පෙර සති 02 ක කෙටුම්පත් කාලයක් ප්‍රකාශයට පත්කළ අතර එම කාල සීමාව තුළ දී සකස්කළ නාමලේඛන පිටපත් අදාළ ග්‍රාම නිලධාරීන් වෙත යවා ඒවායේ නිරවද්‍යතාවය පරීක්ෂාකර බලා නම් ඇතුලත්ව නැති නම් ක්ෂණිකව ගම්පහ මැතිවරණ කාර්යාලය දැනුවත් කිරීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව ඡන්ද හිමි නාමලේඛනය 2013.12.31 දින සහතික කරන ලදි එම නාමලේඛනය අනුව ගම්පහ දිස්ත්‍රික්කයේ මුළු ඡන්ද හිමියන් සංඛ්‍යාව 1590,076 ක් විය.

**ඡන්ද ප්‍රදේශ අනුව ඡන්ද සංඛ්‍යාව පිළිබඳ විස්තර**

| ඡන්ද ප්‍රදේශය | ඡන්ද සංඛ්‍යාව |
|---|---|
| වත්තල | 114428 |
| මීගමුව | 103115 |
| කටාන | 139658 |
| දිවුලපිටිය | 106431 |
| මීරිගම | 121853 |
| මිනුවන්ගොඩ | 129885 |
| අත්තනගල්ල | 130058 |
| ගම්පහ | 144152 |
| ජා ඇල | 138704 |
| මහර | 144717 |
| දොම්පෙ | 112475 |
| බියගම | 117747 |
| කැලණිය | 86853 |
| මුළු සංඛ්‍යාව | **1590076** |

දිස්ත්‍රික්කය තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 13 ට අදාළ ඡන්ද කොට්ඨාස 968 ක් සඳහා ග්‍රාම නිලධාරි වසම් 1177 ක් අයත්වන අතර ඒ සඳහා ග්‍රාම නිලධාරින්1177 ක් දෙනෙකු ප්‍රතිශෝධන කටයුතු සඳහා යොදවා ගන්නා ලදී, මීගමුව ඡන්ද ප්‍රදේශයේ ඡන්ද කොට්ඨාස 64 ක් සඳහා ග්‍රාම නිලධාරින් 39 දෙනෙකු රාජකාරියේ නිරත වන අතර වැඩ බලන වසම් සඳහා විශේෂ ගණන් ගන්නා නිලධාරින් 07 දෙනෙකු පත් කරන ලදී. 2013 වර්ෂයේ ගණන් ගැනීමේ කටයුතු සම්බන්ධව ග්‍රාම නිලධාරින් දැනුවත් කිරීම සඳහා 2013.04.19 සිට පුහුණු පන්ති සංවිධානය කර ඒ පිළිබඳ උපදෙස් ලබාදෙන ලදී.

මෙවර ගණන් ගැනීමේ ආකෘති පත්‍ර ගෘහ මුලිකයින් වෙත භාරදීම 2013.05.15 සිට ආරම්භවූ අතර එය ජුනි 02 දින අවසන් විය. ගෘහ මුලිකයින් වෙත භාර දුන් ගණන් ගැනිමේ ආකෘති පත්‍ර සම්පුර්ණ කිරීමෙන් පසු අදාළ ග්‍රාම නිලධාරීන් විසින් ආපසු භාර ගැනීම 2013.05.31 සිට ආරම්භ කර 201308.31 දින දක්වා සිදුකළ අතර ඒ වන විට ග්‍රාම නිලධාරි වසම් 1165 ක ගණන් ගැනිමේ ආකෘති භාරදී තිබුණි. වත්තල, මීගමුව, මිනුවන්ගොඩ හා ජා-ඇල ඡන්ද ප්‍රදේශවලට අයත් ග්‍රාම නිලධාරි වසම් 12 ක ගණන් ගැනිමේ ආකෘති සම්පුර්ණ කර භාරදීම ප්‍රමාද වූ අතර ඒවාද දින කිහිපයක් තුළ දී ලබා ගැනීමට ක්‍රියා කරන ලදී. මෙවර ග්‍රාම නිලධාරින් විසින් ගණන් ගැනිමේ ආකෘති භාරදීමේ ප්‍රගතිය 95% ක් වූ අතර පෙර වර්ෂවලට වඩා ප්‍රගතියේ වැඩිවීමක් පෙන්නුම් කෙරුණි. ගණන් ගැනීමේ කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා එක්සත් ජාතික පක්ෂයෙන් නියෝජිතයින් 1297 ක් ද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් නියෝජිතයින් 1197 ක් ද පත්කරන ලද අතර එයින් ගණන් ගැනීමේ කටයුතු සඳහා සහභාගී වුයේ නියෝජිතයින් 256 ක් පමණි. මෙම නියෝජිතයින් ගණන් ගන්නා නිලධාරින්ගේ ප්‍රතිශෝධන කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා සහාය ලබා දී ඇත.

2013 ඡන්ද හිමි නාම ලේඛන ප්‍රතිශෝධනයේදී 2012 වර්ෂයේ ලියාපදිංචිව සිටි එහෙත් 2013 වර්ෂයේ ඉවත් වු හා 2013 වර්ෂයේ ද ඇතුලත් වූ ඡන්ද දායකයින්ගේ නම් ලැයිස්තුව ( "අ" සහ "ආ") 2013.10.02 දින සිට 2013.10.30 දින දක්වා ප්‍රදර්ශනය කිරීමට කටයුතු කරන ලදී. මෙවර ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධනයේදී ගෘහයට අදාල ඡන්ද හිමියන්ගේ විස්තර ලදුපතේ අලවා ගණන් ගන්නා නිලධාරින් විසින් ගෘහ මුලිකයින් වෙත ලබාදීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ අතර, ගණන් ගැනීමේ ආකෘති ගෘහ මුලික ගෙන් භාරගත් බවට ගණන් ගන්නා නිලධාරින් විසින් භාර ගැනීමේදි අත්සන යොදා ආපසු ලදුපත කඩා ගෘහ මුලිකයින් වෙත භාරදීමට කටයුතු කරන ලෙස ගණන් ගන්නා නිලධාරින්ට උපදෙස් ලබා දෙන ලදී.

2013 වර්ෂය සඳහා නියමිත දිනට තම නම් ඇතුලත් කිරීමට නොහැකි වූ ඡන්ද හිමියන් සඳහා හිමිකම් / විරෝධතා පරීක්ෂණ 2013.11.07 දින ආරම්භ කර 2013.11.23 දින අවසන් කරන ලදී. ඒ අනුව හිමිකම් ඉල්ලුම්පත්‍ර 7657 ක් හා විරෝධතා ඉල්ලුම් පත්‍ර 113 ක් ලැබී තිබු අතර පරීක්ෂණ සඳහා කැඳවීමෙන් පසු හිමිකම් ඉල්ලුම්පත් 4839 ක් හා විරෝධතා ඉල්ලුම්පත් 43 ක් පිළිගන්නා ලදී. තවද මියයාම නිසා ඡන්ද හිමියන් 11231 ක් ඉවත් කරන ලද අතර, පදිංචිය නොමැතිවීම නිසා ඡන්ද හිමියන් 70302 ක් ද, පුර්ව වර්ෂයේදි වැරදි ලෙස ලියාපදිංචි වීම හේතුව

මත ඡන්ද හිමියන් 2744 දෙනෙකු ද අධිකරණ නියෝග මත පුද්ගලයින් 12 ක් ද ඉවත් කරන ලදී. තවද වයස අවුරුදු 18 සම්පූර්ණ වීම හේතුව මත ඡන්ද හිමියන් 28741 ක් ද අලුතින් පුරවැසි භාවය ලබා ගැනීම හේතුව මත ඡන්ද හිමියන් 14 ක්, පදිංචිය වෙනස් වීම් මත ඡන්ද හිමියන් 86790 ක් හා වෙනත් හේතු මත ඡන්ද හිමියන් 6335 ක් ද වශයෙන් ඡන්ද හිමියන් 121880 ක් 2013 නාමලේඛනයට ඇතුලත් කරන ලදී.

2013 ඡන්ද හිමි නාමලේඛනය සකස් කිරීමේදී ජාතික හැඳුනුම්පත් නිවැරදි කිරීමේ විශේෂ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කරන ලදී. ඡන්ද හිමියන් විසින් සපයනු නොලැබූ, සපයනු ලැබූ නමුත් නිවැරදි නොවන ඡන්ද ප්‍රදේශ භාර නිලධාරින් විසින් පරිගණක ගත නොකළ යන කරුණු හේතු කොටගෙන ඇතුලත් නොවූ සියලුම ජාතික හැඳුනුම්පත් තොරතුරු ලිපි මඟින් හෝ ග්‍රාම නිලධාරීන් මඟින් ලබා ගැනීමට කටයුතු කරන ලදී.

2013.06.01 දිනට ඡන්ද හිමියන්ගේ දිනය ලෙස මැතිවරණ කොමසාරිස්වරයා විසින් ප්‍රකාශයට පත්කළ අතර එදින ගම්පහ දිස්ත්‍රික්කය තුළ ජනාකීර්ණ ස්ථාන වල බැනර්, කටවුට් හා පෝස්ටර් ප්‍රදර්ශනය කර දෙපාර්තමේන්තුවේ නිලධාරින් විසින් ජනාකීර්ණ නගර කිහිපයක් ආවරණය වන පරිදි ඡන්ද හිමියන්ගේ දිනයේ අත් පත්‍රිකා බෙදීමේ වැඩපිළිවෙලක් සිදු කරන ලදී. ඒ අනුව මෙම ප්‍රචාරක කටයුතු වලින් මහජනතාවගේ දැනුවත් කිරීම ඉතා සාර්ථක විය.

ඉහත කටයුතු සිදුකිරිමෙන් අනතුරුව 2013.12.31 දින 2013 ඡන්ද හිමි නාමලේඛනය සහතික කිරීමෙන් අනතුරුව නාම ලේඛන සකස් කර ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල පළාත් පාලන ආයතන තැපැල් කාර්යාල හා ග්‍රාම නිලධාරී කාර්යාලවල ප්‍රදර්ශනය කිරීමට කටයුතු කරන ලදී.

**<u>2013 වර්ෂයේ වාර්ෂික ආදායම</u>**

01.මහජන අවශ්‍යතා මත ඡන්ද හිමි නාම ලේඛන උපුටන 6675 ක්

| | |
|---|---|
| මෙම වර්ෂය තුළ නිකුත් කරන ලද අතර එයින් ලැබූ ආදායම - | රු. 534000.00 |
| 02.අබලි ද්‍රව්‍ය විකිණිමෙන් ලද ආදායම - | රු. 1050.00 |
| 03.ඉවත ලද කඩදාසි විකිණිමෙන් ලද ආදායම - | රු. 110880.00 |
| එකතුව - | රු. 645930.00 |

# 12. කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය

**දැක්ම**

තිරසාර දියුණුව සඳහා ව්‍යවසායකත්ව සහ කුඩා ව්‍යාපාර සංවර්ධනය

**මෙහෙවර**

රැකියා විරහිත තරුණ පෙළ තුළ ව්‍යවසායකත්ව හැකියාවක් වර්ධනය කිරීම තුළින් කුඩා ව්‍යාපාර සංවර්ධන ක්ෂේත්‍රයට ඔවුන් යොමු කිරීමත්, කුඩා ව්‍යාපාරිකයින්ගේ ව්‍යාපාරවල කාර්යක්ෂමතාවය සහ ඵලදායිතාවය වර්ධනය කිරීම සහ කුඩා ව්‍යාපාර සංවර්ධන ක්ෂේත්‍රයට අදාළ සේවාවන් සැපයීම තුළින් ජාතික සංවර්ධනයට උපරිම දායකත්වයක් ලබා දීම.

**2013 වර්ෂයේ ගම්පහ දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වැඩසටහන් ප්‍රගතිය**

| අනු අංකය | ඒකක හා කාර්යන් | ඉලක්ක ගත සංඛ්‍යාව | පවත්වන ලද සංඛ්‍යාව | සහභාගි වූ සංඛ්‍යාව | වියදම (රු) |
|---|---|---|---|---|---|
| 1. | විශේෂ දැනුවත් කිරීමේ වැඩසටහන් | 04 | 07 | 837 | 152476.00 |
| 2. | සාමාන්‍ය දැනුවත් කිරීමේ වැඩසටහන් | 18 | 10 | 476 | - |
| 3. | "ව්‍යාපාරයට මඟ " පුහුණු වැඩසටහන් | 05 | 05 | 148 | 93838.00 |
| 4. | ව්‍යවසායකත්ව සංවර්ධන නේවාසික පාඨමාලාව | 01 | 01 | 30 | 813325.38 |
| 5. | දෙදින තෝරා ගැනීමේ වැඩසටහන් | 03 | 04 | 100 | 54397.85 |
| 6. | ව්‍යවසායකත්ව සංවර්ධන නේවාසික පුහුණු පාඨමාලාව තෝරා ගැනීමේ වැඩසටහන් | _ | 01 | 42 | 6805.00 |
| 7. | කළමනාකරණ පුහුණු වැඩසටහන් | 05 | 05 | 141 | 125395.00 |
| 8. | ගිණුම්කරණ පුහුණු වැඩසටහන් | 01 | 01 | 28 | 23588.00 |
| 9. | ඵලදායිතා පුහුණු වැඩසටහන් | 01 | 01 | 28 | 40050.00 |
| 10. | ව්‍යාපාර සැලසුම් සැපයීමේ වැඩසටහන් | 02 | 01 | 20 | 15304.00 |
| 11. | තාක්ෂණ පුහුණු වැඩසටහන් | 02 | 02 | 70 | 100714.00 |
| 12. | අලෙවි ප්‍රදර්ශන | 01 | 02 | 53 | 317390.00 |
| 13. | ව්‍යවසායක සංගමය | 02 | 04 | 334 | 29635.00 |
| 14. | පසුවිපරම් වැඩසටහන් | 16 | 13 | 563 | 100574.00 |
| 15. | ව්‍යාපෘති පරික්ෂා | 08 | 09 | 184 | 101022.00 |
| | **එකතුව** | | | | **1974514.23** |

| | |
|---|---|
| නව ව්‍යාපාර ආරම්භ කිරීම | 65 |
| පවත්නා ව්‍යාපාර සංවර්ධනය කිරීම | 140 |
| උපදේශන සේවා සැපයීම | 165 |
| ණය ලබා දීම | 27 |

# 13.ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය

## මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය

**දැක්ම**

ඵලදායී හා තිරසාර සමාජ ආරක්ෂණය සඳහා වූ ජාතියේ ප්‍රමුඛතම ආයතනය වීම

**මෙහෙවර**

සහභාගීත්වය හා නිර්මාණශීලී සංවිධාන පරිසරයක් තුළින්, රාජ්‍ය සුරක්ෂිතභාවය සහිත වඩා ඵලදායී විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කිරීමේ ජාතික ආයතනය බවට පත්වෙමින් ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ජීවන තත්වය සුරක්ෂිත කිරීම

**යෝජිත දැක්ම**

සමාජ ආරක්ෂණයෙන් සුරක්ෂිත වූ අභිමානවත් ජාතියක්

**යෝජිත මෙහෙවර**

අභිමානවත් ජාතියක් ගොඩනැගීම උදෙසා සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තීන් සම්පාදනය, ක්‍රියාත්මක කිරීම සහ නියාමනය තුළින් යහපාලන ප්‍රතිපත්තිවලට අනුගත වෙමින් ශ්‍රී ලාංකීය පුරවැසියන්ගේ ආර්ථික, සමාජීය, සංස්කෘතික සුරක්ෂිතභාවය වෙනුවෙන් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සමග උපාය මාර්ගික සම්බන්ධතා ගොඩනගමින් තිරසාර සංවර්ධනයක් කරා

විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

**2013 වර්ෂයේ ප්‍රගතිය**

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | පසුගිය වර්ෂය අවසානය ට | වර්ෂය තුළ එකතුව | සමුච්චිත එකතුව | දායක මුදල් ලැබීම 2013 වර්ෂය | වාරික මුදල් ලැබීම් 2013 වර්ෂය | ඔප්පු නිකුත් කිරීම් මුළු එකතුව | වාරික මුදල් සටහන් පොත් නිකුත් කිරීම |
|---|---|---|---|---|---|---|---|
| ගම්පහ | 7184 | 16 | 7200 | 8340.00 | 847484.00 | 7198 | 7143 |
| මිනුවන්ගොඩ | 3398 | - | 3398 | - | - | 3398 | 3382 |
| ජා ඇල | 1369 | 116 | 1485 | 48912 | 515252.00 | 1481 | 1471 |
| වත්තල | 1069 | - | 1069 | - | 12902.00 | 1069 | 1052 |
| දොම්පේ | 11251 | 188 | 11439 | 103408 | 257944.00 | 11370 | 11361 |
| මහර | 2717 | 35 | 2752 | 40707 | 52630.00 | 2752 | 2748 |
| කැලණිය | 1029 | - | 1029 | - | 16338.00 | 1029 | 1021 |
| දිවුලපිටිය | 2526 | 32 | 2558 | 30146.00 | 382611.00 | 2558 | 2551 |
| කටාන | 3670 | - | 3670 | - | 55100.00 | 3670 | 3662 |
| මීරිගම | 1855 | - | 1855 | - | 22890.00 | 1855 | 1849 |
| අත්තනගල්ල | 4699 | - | 4699 | 1450 | 292774.00 | 4699 | 4681 |
| මීගමුව | 1259 | 1 | 1260 | 1900.00 | - | 1260 | 1252 |
| බියගම | 1740 | - | 1740 | - | - | 1740 | 1731 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යා සෘජු බඳවා ගැනීම් | 1033 | 114 | 1147 | 81777.00 | 900840 | 1117 | 1108 |
| ක්ෂේත්‍ර නිලධාරී බඳවා ගැනීම් | 21 | - | 21 | - | - | 21 | 21 |
| එකතුව | 44799 | 505 | 45304 | 316640.00 | 3356765.00 | 45217 | 45033 |

## මරණ පාරිතෝෂික දීමනා ගෙවීම් සහ අබලතා ගෙවීම් 2013

| ප්‍රා.ලේ. කොට්ඨාශය | පසුගිය වර්ෂවල මරණ පාරිතෝෂික අබලතා ගෙවීම් | 2013 වර්ෂයේ මරණ පාරිතෝෂික දීමනා ගෙවීම් | පසුගිය වර්ෂවල ආබාධිත ගෙවීම් | 2013 වර්ෂයේ ආබාධිත දීමනා ගෙවීම් |
|---|---|---|---|---|
| ගම්පහ | 3261971.37 | 18134.44 | 19440.00 | - |
| මිනුවන්ගොඩ | 357802 | 8000.00 | - | - |
| ජා ඇල | 120123.00 | - | - | - |
| වත්තල | 172299.00 | - | - | - |
| දොම්පේ | 479553.94 | - | - | - |
| මහර | 194047.68 | 40365.00 | 42000.00 | - |
| කැලණිය | 77610.00 | - | 5000.00 | - |
| දිවුලපිටිය | 201233.00 | - | - | - |
| කටාන | 260739.92 | - | 15000.00 | 15000.00 |
| මීරිගම | 165137.00 | - | - | - |
| අත්තනගල්ල | 402383.00 | - | 14872.00 | - |
| මීගමුව | 121197.35 | - | 20000.00 | - |
| බියගම | 95862.23 | - | - | - |
| සෘජු බඳවා ගැනීම් | 53284.00 | - | - | - |
| එකතුව | 5964261.19 | 66499.44 | 116312.00 | 15000.00 |

2013 වර්ෂයේ විශ්‍රාම වැටුප් ගෙවීම් - 287

2013 වර්ෂයේ අක්‍රීය දායකත්වය සක්‍රීය කිරීම් - 277 රු.611079.00

### කාර්ය මණ්ඩලය

දිස්ත්‍රික් සම්බන්ධිකරණ නිළධාරීන් - 01

පරිගණක ක්‍රියාකාරී නිළධාරීන් - 02

කාර්යාල කාර්ය සහායක - 01

පුහුණු නිළධාරීන් - 01

මූලාශ්‍රය: ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය

# 14. කෘෂිකර්මය

## 14 . 1 දිස්ත්‍රික් කෘෂිකර්ම

**දැක්ම**

දිස්ත්‍රික්කයේ පවතින කාලගුණික දේශගුණික තත්ත්වයන්ට වඩාත් යෝග්‍ය කෘෂිකාර්මික කටයුතු හඳුන්වාදීම තුළින්, ගොවි ජනතාවගේ ආදායම ඉහළ නැංවීම සහ ජාතික පලතුරු පරිභෝජන අවශ්‍යතාවයේ සහ අපනයන අවශ්‍යතාවයේ වැඩි ප්‍රමාණයක්, සපයන ප්‍රදේශය වශයෙන් ගම්පහ දිස්ත්‍රික්කය පත්කිරීම.

**මෙහෙවර**

ඵලදායිතාව ඉහල නැංවීම නිෂ්පාදනයට වැඩි වටිනාකමක් ලැබෙන නව ක්‍රමවේද හඳුන්වාදිම, කාර්යක්ෂම කළමනාකරණ රටාවන් හඳුන්වාදිම තුලින් ගොවිජනතාවගේ ආදායම වැඩි කිරිම සහ වැඩි ඉල්ලුමක් සහ අපනයන විභවයන් සහිත පලතුරු භෝග වගාකිරිමෙන් පලතුරු සැපයුම වැඩිකිරිමට සහ අපනයන ආදායම ඉහල නැංවිම සහ පරිසර හිතකාමි වගාක්‍රම ඔස්සේ ස්ථිරසාර ගොවිතැන් රටාවක් පවත්වා ගැනිමට කටයුතු කිරිම.

**1.පලතුරු ගම්මාන පිහිටුවීමේ වැඩසටහන**

පලතුරු වගාවේදී වැඩි ඵලදායිතාවක් ලබා ගැනීමට, වගාව මනාව නඩත්තු කිරීම සහ පාලනය කිරීම කළයුතු වන අතර ගස් කිහිපයක් වැනි කුඩා වගාවකදී එසේ කිරීම අපහසුය. කුඩා පරිමානයේ වගාවන් ඒකරාශී කොට සමුහ වගාවක් හෝ ගම්මානයක් වශයෙන් පවත්වා ගැනීමේන් ඉහත ගැටළු හා වෙළඳපල පිළිබඳ ගැටළු විසඳා ගැනීම පහසුය.

**2.පාරම්පරික කාබනික වී වගාව ව්‍යප්ත කිරීමේ වැඩසටහන**

දේශීය වී වර්ග ප්‍රචලිත කිරීමට කෘෂි රසායනික ද්‍රව්‍ය හා රසායනික පොහොර භාවිතයෙන් තොරව ගොවීන් වගා කටයුතු වලට යොමු කිරීමත් මෙහි අරමුණ වේ. තවද මෙහි ඇති ඖෂධීය ගුණය නිසා වෙළඳපොලට වැඩි මිලකට අලෙවි කිරීමේ හැකියාවද පවතී.

**3.තරුණ කෘෂි ව්‍යවසාය වැඩසටහන**

ඉහල ආදායමක් ලබා ගතහැකි තාක්ෂණික හා අලෙවි ක්‍රමවේද හඳුන්වා දී වඩාත් සාර්ථක තරුණ කෘෂි ව්‍යවසායකයින් බිහිකිරීම තුළින් කෘෂිකර්මාන්තය වෙත තරුණ ආකර්ෂණය යොමු කරවා ගැනීම මෙහි අරමුණු වේ.

**4. වානිජ ගොවීන් ඇති කිරීමේ වැඩසටහන**

ගම්පහ දිස්ත්‍රික්කයේ බොහෝ ගොවීන් යැපුම් මට්ටමේ අයය. ඒ මඟින් ඔවුනට මෙන්ම මෙමඟින් ලැබෙන ඵලප්‍රයෝජන සීමිත නිසාම, ඵලදායි කෘෂිකාර්මික ක්‍රමවේද හඳුන්වාදීම සහ වඩාත් සැලසුම් සහගත වෙළඳසැල් ඉලක්කකරගත් ප්‍රවේශයක් තුළ ගොවිතැන් කිරීමට සැලැස්වීමත්, ඒ සඳහා සුදුසු අයට ආධාර උපකාර කිරීමත් මෙම වැඩසටහන මඟින් කෙරේ.

**5.විශේෂිත එළවළු වගා ව්‍යාපෘතිය**

දිස්ත්‍රික්කය තුළ එළවළු නිෂ්පාදනය වැඩි කිරීම තුළින් වෙළඳපල උච්ඡාවචනය වලක්වා ගැනීම.

**6.කාබනික පොහොර හා නිෂ්පාදනය දිරිගැන්වීමෙ වැඩසටහන**

මෙහි අරමුණ වනුයේ වී වගාව සඳහා නිර්දේශිත රසායනික පොහොර ප්‍රමාණයෙන් 75% සහ කාබනික පොහොර යෙදූ වගාවක් තුළින් ගුණාත්මයෙන් යුතුව වැඩි අස්වැන්නක් ලබා ගැනීමත්, වී වගාවේ යෙදෙන ගොවීන්ගේ ජීවන මට්ටම ඉහල නැංවීමත් වේ.

**පලතුරු ගම්මාන ව්‍යාපෘතිය දූරියන් ගම්මානය මාබෝදල**







**2013 වර්ෂයේ ක්‍රියාත්මක කළ ව්‍යාපෘති වල භෞතික හා මූල්‍ය ප්‍රගතිය**

| වැඩසටහන | ක්‍රියාකාරකම | ක්‍රියාත්මක දිස්ත්‍රික්කය | වෙන් කළ මුදල (රු.මිලි) | මූල්‍ය (4 වෙනි කාර්තුව අවසානයට) | | භෞතික (4 වෙනි කාර්තුව අවසානයට) | | සමස්ථ භෞතික | | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | ඉලක්කය (රු.මිලි.) | ප්‍රගතිය (රු.මිලි.) | ඉලක්කය | ප්‍රගතිය | ඉලක්කය | ප්‍රගතිය | |
| පලතුරු ගම්මාන පිහිටුවීම<br>285-2-2-9-2502(11) | ගොවි පුහුණුව<br>දූරියන් පැල දීම<br>ප්‍රවාහනය | ගම්පහ | | 0.020<br>0.54 | 0.0131<br>0.108<br>0.020 | ගොවීන් 140<br>පැල 1000 | ගොවීන් 26<br>පැල 600 | ගොවීන් 120<br>පැල 3000 (අක්කර 75) | ගොවීන් 26<br>පැල 600 (අක්කර 15) | එක් පලතුරු ගම්මානයක් පමණක් ආරම්භ කරන ලදී. පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය මඟින් දූරියන් පැල ලබා දෙන ලදී. |
| | **එකතුව** | | | **0.56** | **0.1411** | | | | | |
| පාරම්පරික කාබනික වී වගාව ව්‍යාප්ත කිරීමේ වැඩසටහන<br>118-2-118-2-3-20-2502(04) | පාරම්පරික බිත්තර වී බෙදා හැරීම | ගම්පහ | 0.4966 | 0.4966 | 0.287 | අක්කර 237 | අක්කර 133 | අක්කර 237 | අක්කර 133 | |
| | **එකතුව** | | **0.4966** | **0.4966** | **0.287** | **අක්කර 237** | **අක්කර 133** | **අක්කර237** | **අක්කර 133** | |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| තරුණ ව්‍යවසායකත්ව වැඩසටහන<br>118-2-3-20-2502(04) | තරුණ ව්‍යවසායකයන් පුහුණු කිරීම<br><br>තරුණ ව්‍යවසායකයින් වාණිජ ගොවිපලවල් නැරඹීමට රැගෙන යාම<br><br>තරුණ ව්‍යවසායකයන්ට අවශ්‍ය උපකරණ හා ද්‍රව්‍ය බෙදා දීම | ගම්පහ | 1.9 | 0.040<br><br>0.180<br><br>1.9 | 0.020<br><br>0.180<br><br>- | තරුණ ව්‍යවසායකයන් 80<br>තරුණ ව්‍යවසායකයන් 45<br><br>තරුණ ව්‍යවසායකයන් 10 | තරුණ ව්‍යවසායකයන් 45<br>තරුණ ව්‍යවසායකයන් 37<br><br>- | තරුණ ව්‍යවසායකයන් 80<br>තරුණ ව්‍යවසායකයන් 45<br><br>තරුණ ව්‍යවසායකයන් 10 | 45<br><br>37 | කෘෂිකර්ම අමාත්‍යාංශය වියදම දරණ ලදී.<br><br>බෙදා දීමට සැලසුම් කලත් 50% දායකත්වය මත සම්පූර්ණ කිරීමට නොහැකි විය. |
| | **එකතුව** | | **1.9** | **1.94** | **0.2** | | | | | |

| වැඩසටහන | ක්‍රියාකාරකම | ක්‍රියාත්මක දිස්ත්‍රික්කය | වෙන් කළ මුදල (රු.මිලි) | මූල්‍ය (4 වෙනි කාර්තුව අවසානයට) | | භෞතික (4 වෙනි කාර්තුව අවසානයට) | | සමස්ථ භෞතික | | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | ඉලක්කය (රු.මිලි.) | ප්‍රගතිය (රු.මිලි.) | ඉලක්කය | ප්‍රගතිය | ඉලක්කය | ප්‍රගතිය | |
| කඩිනම් එළවළු වගා ව්‍යාපෘතිය<br>118-2-3-20-2502(03) | ගොවිජන සේවා කොට්ඨාස මට්ටමින් තෝරාගත් ගොවීන්ට එළවළු බීජ බෙදා හැරීම | ගම්පහ | 1.373 | 0.962 | 0.641 | හෙක්ටයාර 50 | හෙක්ටයාර 37.5 | හෙක්ටයාර 80<br>(අක්කර 200) | හෙක්ටයාර 68.5<br>(අක්කර 171.25) | යල කන්නයේ හෙක්ටයාර 31ක වගාව සිදු කොට ඇත. |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | එකතුව | | **1.373** | **0.962** | **0.641** | හෙක්ටයාර **50** | හෙක්ටයාර **37.5** | හෙක්ටයාර **80** | හෙක්ටයාර**68.5** | |
| කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය දිරි ගැන්වීමේ වැඩසටහන<br><br>179-02-04-01-2502 | කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය පිළිබඳ නිලධාරීන් දැනුවත් කිරීම<br><br>කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය පිළිබඳ ගොවීන් දැනුවත් කිරීම<br><br>ද්‍රව්‍ය ප්‍රවාහනය | ගම්පහ | 0.011<br><br>0.1506<br><br>0.0533 | 0.011<br><br>0.1506<br><br>0.0533 | 0.015851<br><br>0.1257<br><br>0.0121 | නිලධාරීන් 50ක් පුහුණු කිරීම<br><br>ගොවීන් 2000 ක් පුහුණු කිරීම<br><br>ERM පොහොර - කිලෝ. 50000 කාබනික මුහුන්- කිලෝ.10000 පොලිතින් කිලෝ. 7500 | නිලධාරීන් 75ක් පුහුණු කිරීම<br><br>ගොවීන් 1600 ක් පුහුණු කිරීම<br><br>අදාල ද්‍රව්‍ය දිස්ත්‍රික් කාර්යාලයේ තිබේ | 75<br><br>2000 | 75<br><br>1600 | නව නිලධාරීන් පත් වීම<br><br>අමුද්‍රව්‍ය වෙලාවට නොලැබුණු බැවින් බෙදා දීමට නොහැකි විය |
| | **එකතුව** | | **0.215** | **0.215** | **0.153** | | | | | |

| වැඩසටහන | ක්‍රියාකාරකම | ක්‍රියාත්මක දිස්ත්‍රික්කය | වෙන් කළ මුදල ( රු.මිලි.) | මූල්‍ය (4 වෙනි කාර්තුව අවසානයට) | | භෞතික (4 වෙනි කාර්තුව අවසානයට) | | සමස්ථ භෞතික | | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | ඉලක්කය (රු.මිලි.) | ප්‍රගතිය (රු.මිලි.) | ඉලක්කය | ප්‍රගතිය | ඉලක්කය | ප්‍රගතිය | |
| දූරියන් වගාව<br><br>118-2-3-20-2502(03) | | ගම්පහ | 0.144 | 0.144 | | අක්කර 16 | - | අක්කර 16 | | |
| | මුළු එකතුව | | **4.1286** | **4.1736** | **1.4221** | | | | | |

**තරුණ ව්‍යවසායකත්ව මෙහෙයුම**





## කාබනික පොහොර නිෂ්පාදනය








## කඩිනම් එළවළු වගා ව්‍යාපෘතිය





## 14 . 2 ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

### ❖ පුරන් කුඹුරු අස්වැද්දීමේ වැඩසටහන 2013

ශ්‍රී ලංකාව සහලින් ස්වයංපෝෂිත කිරීම ඉලක්ක කරගත් ජාතික වැඩපිළිවෙල තුළ ක්‍රියාත්මක වන පුරන් කුඹුරු නැවත වගා කිරීමේ වැඩසටහන 2013 වර්ෂය තුළ දී ද ගම්පහ දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කරන ලදි.

මෙහි දී යායන් තෝරා ගැනීමේදී,

1. වසර 10කට වැඩි කාලයක් තිස්සේ පුරන්ව පැවතීම.
2. ගොවීන් වැඩිම සංඛ්‍යාවකට ප්‍රතිලාභ සැලසෙන යායන් සඳහා ප්‍රමුඛතාවය ලබා දීම කෙරෙහි අවධානය යොමු කරන ලදි .

මෙහිදි ගම්පහ දිස්ත්‍රික්කය තුල 2013 වර්ෂයේ දි අක්කර 188 වගා කිරීම සඳහා ව්‍යාපෘති 11 ක් ක්‍රියාත්මක කළ අතර මෙයින් ගොවි පවුල් 582 කට සෙත සැලසේ. එම යායන් පිළිබඳ විස්තර හා ප්‍රගතිය පහත දැක්වේ.

පුරන් කුඹුරු වැඩසටහන 2013

ප්‍රගතිය

ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යලය - ගම්පහ

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ව්‍යාපෘති ගණන | හෙක්ටයාර් ගණණ | ඇස්තෙමේන්තු මුදල US |
|---|---|---|---|
| ගම්පහ | 1 | 8.10 | 0.67 |
| අත්තනගල්ල | 1 | 6.07 | 0.29 |
| දිවුලපිටිය | 6 | 27.53 | 1.81 |
| කටාන | 1 | 16.19 | 0.68 |
| මිරිගම | 2 | 18.22 | 0.64 |
| **එකතුව** | **11** | **76.11** | **4.083** |



හෙනරත්ගොඩ 240 ඉහළ ඉඹුල්ගොඩ උතුර මහයාය මැද ඇළ ප්‍රතිසංස්කරණය



බඩල්ගම - 88 දූනගහ ගම්මැද ඇළ ප්‍රතිසංස්කරණය



කටාන - කිඹුලාපිටිය උතුර මහ වෙල් යාය පත්තායන් ඇළ ප්‍රතිසංස්කරණය

පුරන් කුඹුරු අස්වැද්දීමේ වැඩසටහන - 2013 ගම්පහ දිස්ත්‍රික්කය

2013.12.31 දිනට ප්‍රගතිය

| | | මූල්‍ය ප්‍රගතිය | | | | | භෞතික ප්‍රගතිය | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ව්‍යාපෘතිය | ප්‍රතිපාදන මුදල | ඇස්තමේන්තු මුදල | ගිවිසුම්ගත මුදල | වියදම රු. | මූල්‍ය ප්‍රගතිය සඳහා දායකත්වය | මිනුම් ඒකකය km | වැඩ ආරම්භ කළ දිනය | වැඩ අවසන් කළ දිනය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
| 1 | කොතලාවල මාවත සිට රාජසිංහ මාවත දක්වා මැද ඇල ප්‍රතිසංස්කරණය | 3,550,000.00 | 670,000.00 | 535,217.50 | 513,475.28 | 67,500.00 | 2 | 2013.04.19 | 2013.04.29 | 62 |
| 2 | ඇපල යාය සඳහා ප්‍රධාන ඇල හා උඩු ඇල ප්‍රතිසංස්කරණය හා ටැක්ටර් පැන්නුම | | 288,000.00 | 250,630.90 | 234,988.11 | 25,560.64 | Unit | 2013.04.22 | 2013.12.20 | 28 |
| 3 | කම්මල්වත්ත අගාර යාය ඇල ප්‍රතිසංස්කරණය | | 280,000.00 | 240,000.00 | 237,678.89 | 32,760.00 | 2.1 | 2013.04.22 | 2013.06.12 | 28 |
| 4 | ගම්මැද ඇල ප්‍රතිසංස්කරණය | | 335,000.00 | 299,928.69 | 298,678.87 | 22,815.00 | 2.5 | 2013.04.22 | 2013.05.23 | 17 |
| 5 | හපුවලාන මහ වෙල්යාය ඇල ප්‍රතිසංස්කරණය | | 170,000.00 | 148,920.90 | 148,468.80 | 12,870.00 | 1.5 | 2013.04.22 | 2013.06.06 | 40 |
| 6 | නැ/ බලගල්ල වලෙහ්න යාය ඇල ප්‍රතිසංස්කරණය | | 280,000.00 | 250,000.00 | 248,731.74 | 25,740.00 | 2.2 | 2013.04.22 | 2013.09.06 | 42 |
| 7 | කළුමඩ වැව හා ඇල මාර්ග ප්‍රතිසංස්කරණය | | 460,000.00 | 399,800.20 | 398,256.10 | 45,110.00 | Unit | 2013.04.22 | 2013.06.12 | 40 |
| 8 | මහ වෙල්යාය පත්තායං ඇල ප්‍රතිසංස්කරණය | | 675,000.00 | 598,962.65 | 597,087.92 | 68,400.00 | 3.3 | 2013.04.22 | 2013.06.03 | 60 |
| 9 | කුකුල් නාපේ නැ යායේ ඇල ප්‍රතිසංස්කරණය | | 310,000.00 | 274,685.76 | 272,063.58 | 28,080.00 | 2.4 | 2013.04.22 | 2013.09.17 | 150 |
| 10 | බොරළු ඇල ප්‍රතිසංස්කරණය | | 330,000.00 | 298,936.19 | 297,489.47 | 28,730.00 | 2.5 | 2013.11.02 | 2013.12.20 | 75 |
| 11 | ලුණු කුඹුර යාය පිට ඇල ප්‍රතිසංස්කරණය | | 285,000.00 | 250,628.56 | 249,469.62 | 26,000.00 | 2 | 2013.09.23 | 2013.12.18 | 40 |
| | | **3550000** | **4083000** | **3547711.35** | **3496388.38** | **383565.64** | | | | **582** |

## ❖ දිවිනැගුම ජාතික ව්‍යාපාරය iv අදියර

**තිරසාර ගෙවතු ලක්ෂයක් සංවර්ධනය කිරීම**

මෙම වැඩසටහන යටතේ ගම්පහ දිස්ත්‍රික්කය තුළ ගොවිජන සේවා බල ප්‍රදේශ මට්ටමින් ආදර්ශ ගෙවතු වගා වැඩ සටහනක් දියත් කරන ලදි. මෙහි දි එක් ගෙවත්තකට අවශ්‍ය පළතුරු පැල, බීජ, ඖෂධ පැල , සුළු අපනයන බෝග ආදි පැල වර්ග කිහිපයක් ලබා දුන් අතර එක් ග්‍රාම සේවා වසමකින් ගෙවතු 10ක් තෝරාගන්නා ලදි.

**ආදර්ශ ගෙවතු සඳහා බෙදා දෙන ලද පැල ප්‍රමාණය**

| අංකය | වර්ගය | මීරිගම | දිවුලපිටිය | මීනුවන්ගොඩ | කටාන මිගමුව | ජා ඇල | ගම්පහ | අත්තනගල්ල | දොම්පේ | බියගම | කැලනිය | වත්තල | මහර | ඒකතුව |
